# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2163/20 - 2020 පෙබරවාරි මස 19 වැනි බදාදා - 2020.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 7/2017

**2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත**

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 33 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සාදනු ලබන රීති.

සභාපති,
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය.

2020 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

**උත්තේජක මර්දන රීති අදාළ වීම**

1. මෙම රීති 2020 ශ්‍රී ලංකා උත්තේජක මර්දන රීති යනුවෙන් හඳුන්වනු ලබන අතර එම රීති :-

(අ) යම් ක්‍රීඩා සමාජයක්, කණ්ඩායමක්, සංගමයක් හෝ ලීගයක් ඇතුළුව, ශ්‍රී ලංකාවේ ඇති යම් ක්‍රීඩා සංවිධානයක සාමාජිකයකු හෝ බලපත්‍ර දරන්නකු හෝ යම් ක්‍රීඩා සාමාජිකයකු අනුබද්ධිත සංවිධානයක සෑම ක්‍රීඩකයකු හෝ ක්‍රීඩා සහායක තැනැත්තකුට ;

(ආ) යම් ඉසව්වක්, තරඟයක් හෝ වෙනත් යම් ක්‍රියාකාරකමක් එම ඉසව්ව, තරඟය හෝ ක්‍රියාකාරකම පවත්වනු ලබන ස්ථානය පිළිබඳ නොසලකා හරිමින්, යම් සමාජයක්, කණ්ඩායමක්, සංගමයක් හෝ ලීගයක් ඇතුළුව ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩා සංවිධානයක් විසින් සංවිධානය කරනු ලබන, කැඳවනු ලබන, බලය දෙනු ලබන හෝ පිළිගනු ලබන එම ඉසව්වට, තරඟයට හෝ වෙනත් ක්‍රියාකාරකමට සහභාගී වන සෑම ක්‍රීඩකයකුට හෝ ක්‍රීඩා සහායක තැනැත්තකු සඳහා හෝ ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩා සංවිධානයක සාමාජිකයකු හෝ අනුබද්ධිත සංවිධානයකට ;

1A - G 032001 — 167 (2020/02)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිවීමේ කාර්යයේදී රාජ්‍ය ක්‍රීඩා සංවිධානයක් විසින් ප්‍රදනය කරන ලද යම් පිළිගැනීමක්, බලපත්‍රයක් හෝ වෙනත් කොන්ත්‍රාත් ගිවිසුමක් හෝ අන්‍යාකාරයෙන්, යම් ක්‍රීඩා සමාජයක්, කණ්ඩායමක්, සංගමයක් හෝ ලීගයක් ඇතුළුව ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩා සංවිධානයක, හෝ ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩා සංවිධානයක යම් සාමාජිකයෙකු හෝ අනුබද්ධිත සංවිධානයක බලසීමාවට යටත් වන ඕනෑම ක්‍රීඩකයකු හෝ ක්‍රීඩා සහායක තැනැත්තෙකුට ;

(ඈ) ජාතික ක්‍රීඩා ඉසව්වක සංවිධායකයෙකු හෝ ක්‍රීඩා සංවිධානයකට අනුබද්ධිත වී නොමැති ජාතික ලීගයක් විසින් සංවිධානය කරනු ලබන, පවත්වනු ලබන, කැඳවනු ලබන හෝ බලය දෙනු ලබන ඕනෑම ක්‍රියාකාරකමකට ඕනෑම තත්ත්වයකින් සහභාගීවන සෑම ක්‍රීඩකයෙකුට හෝ ක්‍රීඩා සහායක තැනැත්තෙකුට ;

(ඉ) (අ), (ආ), (ඇ) හෝ (ඈ) ඡේද යටතට නොගැනෙන, එහෙත්, යම් ජාත්‍යන්තර හෝ ජාතික ඉසව්වකට සහභාගීවීමට සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන සෑම ක්‍රීඩකයකුටම ;

එසේ වුවද, එවැනි යම් ඉසව්වක් සඳහා සුදුසුකම් ලැබීමට අවම වශයෙන් මාස හයකට පෙරාතුව එම ක්‍රීඩකයා මෙම උත්තේජක මර්ධන රීති යටතේ පරීක්ෂා කිරීම සඳහා සිටිය යුතු වේ.

(ඊ) ජාතික මට්ටමේ ක්‍රීඩකයෙකු හෝ ශ්‍රී ලංකාව තුළ නේවාසිකව සිටින යම් ක්‍රීඩකයෙකු ද ඇතුළුව තරග කිරීම සඳහා හෝ පුහුණු කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණ සිටින හෝ ලෝක තහනම් උත්තේජක නීති සංග්‍රහය මඟින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ බලය ක්‍රියාවට යෙදවිය හැකි ඕනෑම ක්‍රීඩකයෙකුට ;

අදාළ විය යුතුය.

2. මෙම රීති බලාත්මක කිරීම සඳහා සහ නඩු විභාග කිරීමේ අධිකරණ බලය සඳහා 1 වන රීතියේ (අ) සිට (ඊ) දක්වා ඡේදවල සඳහන් යම් තැනැත්තකු, මෙම උත්තේජක මර්දන රීති මඟින් බැඳී සිටීමට එකඟ වී ඇති අතර (මෙහි මින්මතු "SLADA" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා උත්තේජක මදර්න නියෝජ්‍යායතනයේ අධිකාරී බලය, සාමාජිකත්වය, බලය පැවරීම හෝ යම් ක්‍රීඩාවකට සහභාගිවීම පිළිබඳව කොන්දේසියක් වශයෙන් 34 වන රීතියේ සහ 69 වන රීතියේ සිට 79 වන රීතිය දක්වා රීතිවල සඳහන් වන, මෙම රීති යටතේ ගෙන එනු ලබන නඩු හා අභියාචනා විභාගකර තීරණය කිරීමට යටත් විය යුතු ය.

**උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම**

3. පහත දැක්වෙන දෑ මඟින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් ස්ථාපනය වන්නේය :

(අ) "බී" සාම්පලය විශ්ලේෂණය කිරීම ක්‍රීඩාකයා විසින් අත්හරිනු ලැබ ඇති අවස්ථාවක, ඔහුගේ "ඒ" සාම්පලය තුළ තහනම් කරන ලද ද්‍රව්‍යයක හෝ එහි පරිවෘත්තීය ද්‍රව්‍යයක හෝ සලකුණු දක්නට ලැබීම හෝ "බී" සාම්පලය විශ්ලේෂණය නොකරනු ලැබීම හෝ ක්‍රීඩකයාගේ "බී" සාම්පලය විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව "බී" සාම්පලයේ විශේලේෂණය "ඒ" සාම්පලයෙන් හමු වූ තහනම් ද්‍රව්‍ය හෝ එහි පරිවෘත්තික ද්‍රව්‍ය හෝ සලකුණුවලින් තහවුරු වීම හෝ ක්‍රීඩකයාගේ "B" සාම්පලය බෝතල් දෙකකට වෙන්කල පසුව දෙවන බෝතලයේ අඩංගු ද්‍රව්‍යවල විශේලේෂණය පළමු බෝතලය තුළ තහනම් කරන ලද ද්‍රව්‍ය හෝ එහි පරිවෘත්තික ද්‍රව්‍යයක හෝ සලකුණු තිබෙන බව තහවුරු වීම ;

එසේ වුවද, ක්‍රීඩකයා විසින් "බී" සාම්පලය විශේලේෂණය කිරීම සඳහා ද ඉල්ලීම් නොකළ අවස්ථාවක වුව ද, SLADA විසින් ප්‍රතිඵල කළමනාකරණ වගකීම සමග ස්වකීය අභිමතය පරිදි, එම "B" සාම්පලය විශ්ලේෂණය කිරීමට තීරණය කළ හැකි ය

(ආ) තහනම් උත්තේජක ලේඛනයේ විශේෂයෙන් හඳුනාගනු ලැබ ඇති ප්‍රමාණාත්මක සීමාවන් දැක්වෙන ද්‍රව්‍ය හැර යම් තහනම් ද්‍රව්‍යක හෝ එහි පරිවෘත්තීය ද්‍රව්‍ය හෝ සලකුණු යම් ප්‍රමාණයක් එම ක්‍රීඩකයාගේ සාම්පලයක දක්නට ලැබීම ;

(ඇ) යම් තහනම් ද්‍රව්‍යයක් හෝ තහනම් ක්‍රමයක් යම් ක්‍රීඩකයකු විසින් භාවිතා කිරීම හෝ භාවිතා කිරීමට උත්සාහ දැරීම ;

(ඈ) (අ), (ආ) සහ (ඇ) ඡේදවල කාර්ය සඳහා -

(i) කිසිදු තහනම් ද්‍රව්‍යයක් සිය ශරීරයට ඇතුළු නොවන බවට සහ කිසිදු තහනම් ක්‍රමයක් භාවිතා නොකරන බවට සහතිකවීම එක් එක් ක්‍රීඩකයාගේ වගකීම වන්නේ ය. ඒ අනුව තහනම් ද්‍රව්‍යයක් හෝ තහනම් ක්‍රමයක් භාවිතා කිරීම

මගින් උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කළ බව තහවුරු කිරීම සහ ක්‍රීඩකයාගේ පාර්ශවයෙන් අභිප්‍රායිකව, වැරදීමකින්, නොසැලකිල්ලෙන් හෝ දැන දැනම තහනම් උත්තේජක භාවිතා කිරීම යනාදී කරුණු දැක්වීම අවශ්‍ය නොවේ ;

(ii) තහනම් ද්‍රව්‍යක් හෝ තහනම් ක්‍රමයක් භාවිත කිරීම හෝ භාවිත කිරීමට තැන් කිරීමේ සාර්ථකබව හෝ අසාර්ථකබව වැදගත් නොවන අතර, තහනම් උත්තේජක රීති උල්ලංඝනය කිරීම සඳහා තහනම් ද්‍රව්‍යයක් හෝ තහනම් ක්‍රමයක් භාවිත කර තිබීම හෝ භාවිත කිරීමට තැත්කර තිබීම ප්‍රමාණාත්මක වේ.

(ඉ) මෙම උත්තේජක මර්දන රීති මගින් බලය පවරා ඇති පරිදි කරනු ලබන දැනුම්දීමෙන් පසුව නියැදි රැස් කිරීම මග හැරීම හෝ යුක්ති සහගතභාවයකින් තොරව නියැදි රැස් කිරීමට ඉදිරිපත් වීම ප්‍රතික්ෂේප කිරීම හෝ නොහැකි වීම ;

(ඊ) ලියාපදිංචි පරීක්ෂණ සංචිතයක යම් ක්‍රීඩකයෙකු විසින්, මාස දෙළහක කාලසීමාවක් ඇතුළත පරීක්ෂණ සහ විමර්ශන සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතිවල නිර්වචනය කොට ඇති පරිදි පරීක්ෂණවලට සහභාගී නොවීමේ හෝ පැහැර හැරීමේ ඕනෑම අවස්ථා තුනක යම් සංයෝගයක් ;

(උ) උත්තේජක පාලනය සම්බන්ධයෙන් වන යම් කොටසක් සම්බන්ධයෙන් අයුතු ලෙස මැදිහත්වීම හෝ මැදිහත් වීමට තැත්කිරීම.

මේ ඡේදයේ කාර්ය සඳහා "අයුතු ලෙස මැදිහත්වීම" යන්නට, උත්තේජක පාලන නිලධාරියෙකුගේ කටයුතුවලට සීමාවකින් තොරව, හිතාමතාව මැදහත්වීම හෝ මැදිහත්වීමට තැත්කිරීම, තහනම් උත්තේජක සංවිධානයකට වංචනික තොරතුරු සැපයීම හෝ ශක්‍යමාන සාක්ෂිකරුවෙකු පෙළඹවීම හෝ පෙළඹවීමට තැත්කිරීම යන්න ඇතුළත් වේ ;

(ඌ) යම් තහනම් ද්‍රව්‍යයක් හෝ තහනම් ක්‍රමයක් සන්තකයේ තබා ගැනීම. මේ සඳහා -

(i) යම් තහනම් උත්තේජක ද්‍රව්‍යයක් (මෙහි මින්මතු "ටීයූඊ" යනුවෙන් සඳහන් කරනු ලබන) චිකිත්සමය භාවිතය සඳහා නිදහස් එකක් බව හෝ පිළිගත හැකි වෙනත් සාක්ෂියකින් එම ද්‍රව්‍යය සන්තකයේ තබාගැනීම සාධාරණීය කරන්නේනම් මිස යම් ක්‍රීඩකයකු විසින් ක්‍රීඩා ඉසව්වක් තුළදී තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් තබා ගෙන සිටීම හෝ තහනම් ක්‍රමයක් භාවිතා කිරීම හෝ ක්‍රීඩා ඉසව්වකින් පිටත දී තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් සන්තකයේ තබාගෙන සිටීම හෝ තහනම් ක්‍රමයක් භාවිතා කිරීම ඇතුළත් වේ.

(ii) "ටීයූඊ" සමඟ හෝ වෙනත් පිළිගත හැකි සාධාරණීකරණයක් අනුකූල වන බවට තහවුරු වන බවට ක්‍රීඩක සහායක තැනැත්තා විසින් තහවුරු කරන්නේ නම් මිස, තරඟයක දී ක්‍රීඩක සහායක තැනැත්තකු විසින් තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් සන්තකයේ තබා ගැනීම හෝ ක්‍රීඩක සහායක තැනැත්තෙකු විසින් ක්‍රීඩකයෙකු සම්බන්ධයෙන් හෝ තරඟයක් සම්බන්ධයෙන් හෝ පුහුණුවීමක් සම්බන්ධයෙන් තරඟයෙන් පිටත දී තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් සන්තකයේ තබා ගැනීම,

ඇතුළත් වේ.

මේ ඡේදයේ කාර්ය සඳහා "පිළිගත හැකි සාධාරණීකරණය" යන්නට, කණ්ඩායමක වෛද්‍යවරයෙක් විසින් ඉතාමත් උග්‍ර හා හදිසි අවස්ථාවන්ට ප්‍රතිකාර කිරීම සඳහා තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යය රැගෙන යාම අදහස් වන අතර, සාධාරණ වෛද්‍ය හේතු මත වෛද්‍යවරයාගේ බෙහෙත් වට්ටෝරුවක් සහිතව යහලුවෙකුට හෝ නෑදෑයෙකුට දීම සඳහා තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් මිළදී ගැනීම, සන්තකයේ තබා ගැනීම ඇතුළත් නොවේ.

(එ) තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් හෝ ක්‍රමයක් නීති විරෝධීව ප්‍රවාහනය කිරීම හෝ නීති විරෝධීව ප්‍රවාහනය කිරීමට තැත්කිරීම.

(ඒ) ක්‍රීඩා තරඟයක සිටින ක්‍රීඩකයෙකු සම්බන්ධයෙන් තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් හෝ තහනම් ක්‍රමයක් යෙදීමට තැත්කිරීම හෝ ක්‍රීඩා තරඟයකින් පරිභාහිරව සිටින ක්‍රීඩකයෙකු සම්බන්ධයෙන් තරඟයෙන් පිටත තහනම් කරන ලද කිසියම් ද්‍රව්‍යයක් යෙදීම හෝ තහනම් ක්‍රමයක් යෙදීමට තැත් කිරීම.

(ඔ) 62 වන රීති යටතේ වෙනත් යම් තැනැත්තකු විසින් උත්තේජක මර්ධන රීතියක් උල්ලංඝනය කිරීමට අදාළව යම් උත්සහ කිරීමක්, සහායදීමක්, දිරිමත් කිරීමක්, ආධාර කිරීමක්, අනුබලදීමක්, කුමන්ත්‍රණය කිරීමක්, ආවරණය කිරීමක් හෝ වෙනත් යම් ජාත්‍යන්තර හවුල්වීමක් ;

(ඕ) SLADA අධිකාරි බලයට යටත් වෘත්තීමය හෝ ක්‍රීඩා ආශ්‍රිත තනතුරක් දරන ක්‍රීඩකයෙකු හෝ වෙනත් තැනැත්තෙකු ක්‍රීඩක සහායකයකු සමඟ එක්ව පහත සඳහන් ආකාරයේ කටයුතු කිරීම තහනම් වේ :-

(i) උත්තේජක මර්දන සංවිධානයක අධිකාරි බලයට යටත් නම් සහ සුදුසුකම් නොලද කාල සීමාවක් සේවය කරමින් සිටින්නේ නම් ;

(ii) උත්තේජක මර්දන සංවිධානයක අධිකාරි බලයට යටත් නොවේ නම් සහ ලෝක උත්තේජක මර්දන රීතිවලට අනුකූල වූ ප්‍රතිඵල කළමනාකරණ ක්‍රියාවලියක් තුළින් එකී සුදුසුකම් නොලැබීම වෙනුවෙන් පිළියමක් නොයොද ඇති තැන්හි දී සහ එකී තැනැත්තා ලෝක උත්තේජක මර්දන රීතිවලට අනුකූලවීම සම්බන්ධයෙන් එකී පුද්ගලයාම අදාළ වන්නේ නම් ඔහු/ඇය තහනම් උත්තේජක නීතිරීති උල්ලංඝනය කිරීමක් සිදු වූ බවට අපරාධ විනය හෝ වෘත්තීමය නඩු විභාගයක් තුළින් වරදකරු කිරීම හෝ වරදකරු බවට ඔප්පු වීම, එකී පුද්ගලයාගේ සුදුසුකම් නොලැබීමේ කාල සීමාව අපරාධ, විනය හෝ වෘත්තිමය නඩු විභාගයකින් සිදු කරන ලද තීරණය ප්‍රකාරව වසර හයක් දක්වා බලපැවැත්වීම ;

(iii) (i) සහ (ii) වන ඡේදවල විස්තරකර ඇති යම් තනිපුද්ගලයකු වෙනුවෙන් පූර්වගාමීව හෝ අතරමැදි තැනැත්තකු වශයෙන් සේවය කරන්නේ නම්.

මේ ඡේදයේ කාර්ය සඳහා, එම ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තා සම්බන්ධ අධිකරණ බලය සහිත උත්තේජක මර්දන සංවිධාන විසින් හෝ (මෙහි මින්මතු "WADA" යනුවෙන් සඳහන් කරනු ලබන) ලෝක - උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම ක්‍රීඩක සහායක තැනැත්තාගේ නුසුදුසු තත්ත්වය පිළිබඳව සහ තහනම් සම්බන්ධතා පැවැත්වීමේ විභව ප්‍රතිවිපාක පිළිබඳව සහ එම ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු විසින් සාධාරණ ලෙස සම්බන්ධතා පැවැත්වීමෙන් වැලකී සිටිය හැකි බවට එම ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තාට කලින් ලිඛිතව දැනුම්දී තිබීම අවශ්‍ය වේ.

**උත්තේජක ගැනීම ඔප්පු කිරීම**

4. උත්තේජක මර්දන රීති උල්ලංඝනය වීමක් සිදු වී ඇති බවට ඔප්පු කිරීමේ භාරය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (SLADA) සතු විය යුතුය. ඔප්පු කිරීමේ ප්‍රමිතිය යනු SLADA විසින් ඉදිරිපත් කරන ලද චෝදනාවේ බරපතලකම පිළිබඳ අවධානය යොමු කරමින් විමර්ශන මණ්ඩලය විසින් සෑහීමට පත්වන පරිදි උත්තේජක මර්දන රීති උල්ලංඝනය වීමක් සිදු වී ඇද්ද යන්න පිළිබඳව තහවුරු කර තිබිය යුතු ය. සියලු අවස්ථාවල දී මෙම ඔප්පු කිරීමේ ප්‍රමිතිය සම්භාවිතා වැඩිබරට වඩා වැඩි වන නමුත් සාධාරණ සැකයෙන් තොරව ඔප්පුකිරීමකට වඩා අඩු ය. උපකල්පනයක් නිෂ්ප්‍රභා කිරීම සඳහා හෝ නිශ්චිත කරුණු හෝ ව්‍යවස්ථානුගත කරුණු තහවුරු කිරීම සඳහා එම උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සිදු කර ඇති බවට සැලකෙන ක්‍රීඩකයා හෝ වෙනත් යම් තැනැත්තා මත උල්ලංඝනය කිරීමේ ඔප්පු කිරීමේ භාරය යොමු කර ඇති අවස්ථාවක දී, ඔප්පු කිරීමේ ප්‍රමිතිය, සම්භාව්‍යතා වැඩිබර විය යුතු වේ.

**කරුණු සහ උපකල්පන තහවුරු කිරීමේ විධි ක්‍රම**

5. SLADA ආයතනය විසින් ක්‍රීඩකයාගේ වරද පිළිගැනීම් පිළිබඳ ප්‍රකාශ, තුන්වන පාර්ශවයකින් කෙරෙන විශ්වාසදයක සාක්ෂි, විශ්වාසදයක ලිපිලේඛන සාක්ෂි, A සහ B සාම්පල වලින් ලැබෙන තහවුරු වූ විශ්ලේෂණාත්මක දත්ත හෝ ක්‍රීඩකයාගේ රුධිර සාම්පල, මුත්‍රා සාම්පල වැනි ජීව විද්‍යාත්මක තොරතුරු මත එළඹෙන නිගමන මත පදනම්ව 3 (ඉ) රීතිය යටතේ උත්තේජක මර්දන රීති උල්ලංඝනය වීමත් තහවුරු කරනු ලැබිය හැකි ය.

6. අදළ විද්‍යාත්මක ප්‍රජාව තුළින් අදහස් විමසීමෙන් අනතුරුව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) විසින් අනුමත කරන ලද හා තත්කාලීන සමාලෝචනයට බඳුන් වූ විශ්ලේෂණාත්මක ක්‍රම හෝ තීරණ විද්‍යාත්මකව වලංගු හෝ උපකල්පනය කරනු ලැබේ. විද්‍යාත්මකව වලංගු මෙම උපකල්පනය ප්‍රතික්ෂේප කිරීමට අදහස් කරන ක්‍රීඩකයෙකු හෝ වෙනත් තැනැත්තෙකු එකී අභියෝගය හා ඊට පදනම් වූ කාරණාවන් පිළිබඳව පළමුව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට (WADA) දැන්විය යුතු ය. එබඳු අභියෝගයක් වේ නම් ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය (CAS) විසින් තමන් විසින්ම සුදුසුයැයි තීරණය කරනු ලබන ආකාරයෙන් ඒ බව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට දැන්විය යුතුය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඉල්ලීමක් කරනු ලබන කල්හි, එකී අභියෝගය ඇගයීමට සහාය වනු පිණිස ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය විසින් යෝග්‍ය විද්‍යාත්මක විශේෂඥයෙකු පත්කළ යුතු ය. WADA ආයතනයට එබඳු දැනුම්දීමක් හා තීරණ මණ්ඩලයේ ලිපිගොනුව ලැබී දින 10ක් ඇතුළත අධිකරණ සහායකයෙකු හෝ එසේ නැතිනම් එම විමර්ශනයේදී සාක්ෂි සහගත පාර්ශවයක් වශයෙන් ඊට මැදිහත් වීමට WADA ආයතනයට අයිතිය තිබේ.

7. WADA ආයතනය විසින් පිළිගත් රසායනාගාර සහ WADA ආයතනය විසින් අනුමත කරන ලද අනෙකුත් රසායනාගාර මඟින් රසායනාගාර සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව නියැදි විශ්ලේෂණය හා රක්ෂිත ක්‍රියා පටිපාටීන් සිදුකරනු ලැබ තිබෙන බව උපකල්පනය කෙරේ. ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් මෙම උපකල්පන ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක්කේ රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන්ගෙන් බැහැරව කටයුතු කිරීම විශ්ලේෂණයේ ප්‍රතිඵලවලට ඉතා අහිතකර ලෙස බලපා ඇති බව සනාථ කිරීමෙනි. ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් ඉහත දැක්වෙන උපකල්පනය ප්‍රතික්ෂේප කිරීමට හේතු වශයෙන් විශ්ලේෂණාත්මක තොරතුරුවලට ඉතා අහිතකර ලෙස බලපෑ හැකි ආකාරයෙන් රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන්ගෙන් බැහැරව කටයුතු කොට ඇති බව සඳහන් කොට ඇත්නම් එහිදී ජාතික උත්තේජක මර්ධන නියෝජ්‍යායතනය සතු වගකීම වන්නේ එකී ප්‍රමිතීන්ගෙන් බැහැරවීම තුළින් විශ්ලේෂණාත්මක තොරතුරුවලට අහිතකර ලෙස බැලපෑමක් සිදු වී නොමැති බව සනාථ කිරීම වේ.

8. වෙනත් යම් ජාත්‍යන්තර ප්‍රමිතීන් හෝ ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ දක්වා ඇති වෙනත් තහනම් උත්තේජක රීතියක් හෝ ප්‍රතිපත්තියක් හෝ අහිතකර විශ්ලේෂණාත්මක වාර්තාවකට හෝ වෙනත් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමකට තුඩු නොදුන් මෙකී උත්තේජක මර්දන රීති මඟින් එකී සාක්ෂි හෝ ප්‍රතිඵල අවලංගු නොවිය යුතු ය.

9. අහිතකර විශ්ලේෂණාත්මක තීරණය හෝ වෙනත් උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් පදනම් කරගෙන උත්තේජක මර්දන රීති කඩ කිරීමකට තුඩු දිය හැකි අයුරින් වෙනත් ජාත්‍යන්තර ප්‍රමිතියක්, උත්තේජක මර්දන රීතියක් හෝ ප්‍රතිපත්තියක් පිළිපැද නැති බව ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා සනාථ කර ඇති අවස්ථාවකදී උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීමක් සම්බන්ධයෙන් විශ්ලේෂණාත්මක වාර්තාව ඉදිරිපත් කිරීමට හෝ සිද්ධිවාචක පදනමකට එය තුඩුදී නොමැති බව සනාථ කිරීමේ භාරය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට පැවරේ.

10. පවත්නා අභියාචනයක ප්‍රස්තුත කාරණයක් නොවුව ද අධිකරණයේ හෝ නිසි අධිකරණමය බලය සහිත වෘත්තිමය විනය විනිශ්චය සභාවක තීන්දුවක් මඟින් ස්වාභාවික යුක්තියේ මූලධර්මයන් උල්ලංඝනය කළ බවට ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් තහවුරු නොකළ විට එකී කරුණු ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට එරෙහිව වැරදි බව ඔප්පු කළ නොහැකි සාක්ෂියක් විය යුතු ය.

11. විමර්ශනයක් සිදුකිරීමට ප්‍රමාණවත් කාලයකට පෙර උත්තේජක මර්දන රීති උල්ලංඝනය කරනු ලැබුවේ යැයි ප්‍රකාශ කෙරෙන ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තාට විමර්ශනය සඳහා පැමිණ විමර්ශන මණ්ඩලයේ හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන ලෙස ඉල්ලීමක් කරනු ලැබූ විට එම ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම් විමර්ශන මණ්ඩලය විසින් සිදු කරනු ලබන විමර්ශනයේ දී එකී ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා සම්බන්ධයෙන් එය අහිතකර අනුමේයයක් වශයෙන් සැළකිය යුතු ය.

**තහනම් ද්‍රව්‍ය සහ තහනම් ක්‍රම**

12. තහනම් ද්‍රව්‍ය ලේඛනයේ වෙනත් යම් ආකාරයකින් විධිවිධාන සලසා ඇත්තේ නම් මිස තහනම් ද්‍රව්‍ය ලේඛනය ශ්‍රී ලංකා උත්තේජක මර්ධන නියෝජ්‍යාතයනය විසින් වැඩිදුර කටයුතු කිරීමේ ඉල්ලීමකින් තොරව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රකාශයට පත්කර මාස තුනකට පසුව බලාත්මක වන්නේ ය. ඕනෑම ක්‍රීඩකයෙක් සහ අනෙක් තැනැත්තෙක් තහනම් ද්‍රව්‍ය ලේඛනයට බැඳී සිටිය යුතු ය. තහනම් ද්‍රව්‍ය ලේඛනය පිළිබඳව මනා අවබෝධයකින් සිටීම සියලුම ක්‍රීඩකයන්ගේ හෝ අනෙක් තැනැත්තන්ගේ වගකීම විය යුතු ය.

13. 41 වන රීතිය අදාළ කර ගැනීමේ කාර්යයේ දී ඇනබොලික් කාරක හා හෝර්මෝන සහ උත්තේජක හා හෝර්මෝන ඇන්ටොගනිස්ට් හා මොඩියුලේටර්ස් හැර තහනම් ද්‍රව්‍ය ලෙස හඳුන්වන කාණ්ඩයේ සියල්ල "නිශ්චිත ද්‍රව්‍ය" ලෙස සැලකිය යුතු ය.

14. තහනම් ද්‍රව්‍ය ලැයිස්තුවට ඇතුළත් කරනු ලබන තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම, තහනම් ද්‍රව්‍ය ලේඛනයක ඇති ද්‍රව්‍ය වර්ග කිරීම, කිසියම් ද්‍රව්‍යයක් සියලු තැන්හිදී ම හෝ තරගයක් තුළ දී පමණක් තහනම් කෙරෙන සේ වර්ගීකරණය කිරීම පිළිබඳව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නිගමය අවසාන නිගමනය වන අතර එකී ද්‍රව්‍ය හෝ ක්‍රමය, වැළැක්වීම් කාරකයක් හෝ කාර්ය සාධනය වැඩි කිරීමෙහිලා ශක්‍යතාවක් නොමැති බවත්, සෞඛ්‍ය අවදනමක් නොමැති බව හෝ ක්‍රීඩාවේ ජීව ගුණයට බාධාවක් නොමැත්තේය යන කරුණු පදනම් කරගෙන ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් ඉදිරිපත් කරන අභියෝගවලට යටත් නොවිය යුතු ය.

**චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය (TUEs )**

15. (1) ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ප්‍රදනය කරන ලද චිකිත්සමය භාවිත වෙනුවෙන් වූ නිදහස් කිරීම්වලට අදළ විධිවිධානවලට අනුකූල තත්ත්වයන් යටතේ තහනම් ද්‍රව්‍යයක් හෝ එහි පරිවෘත්තීය සංඝටක හෝ සලකුණු තිබීම හෝ තහනම් ද්‍රව්‍යයක් භාවිත කිරීම හෝ භාවිත කිරීමට තැත් කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ තහනම් ද්‍රව්‍යයක් හෝ ක්‍රමයක් පරිපාලනය කිරීම හෝ පරිපාලනය කිරීමට තැත් කිරීම උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සේ නොසැලකිය යුතු ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්ධන නියෝජ්‍යායතනය විසින් තම වෙබ් අඩවිය තුළ වෙනත් යම් ආකාරයකින් නිශ්චිතව දක්වා නොමැති තැන්හි දී තහනම් ද්‍රව්‍යයක් හෝ ක්‍රමයක් චිකිත්සාමය කාර්යයක් සඳහා ජාතික මට්ටමේ ක්‍රීඩකයෙකුව අවශ්‍ය වේ නම් ඔහුට එම අවශ්‍යතාවය ඇති වූ වහාම හදිසි හෝ විශේෂ අවස්ථාවන්හි දී හෝ චිකිත්සාමය භාවිතය පිළිබඳ මුක්තිය යොදා ගැනීම පිළිබඳව දක්වෙන ප්‍රමිතිවල 15 වන ජාත්‍යන්තර රීතිය අදළවන අවස්ථාවලදී යටත් පිරිසෙයින් ක්‍රීඩකයාගේ ඊළඟ තරගයට දින 30කට කලින් ඒ සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එකී අයදුම්පත් සලකා බැලීම සඳහා මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය. ඉන් පසුව එකී කමිටුව විසින් චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතීන් හි දක්වෙන ඊට අදළ විධිවිධාන ප්‍රකාරව එකී අයදුම්පත පිළිබඳව වහාම ඇගයීමක් සිදුකොට තීරණයකට එළඹිය යුතු ය. එහි තීරණය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අවසාන තීරණය වන අතර එම තීරණය තහනම් උත්තේජක පරිපාලන හා කළමනාකරණ පද්ධතිය (ADAMS) හරහා ජාත්‍යන්තර චිකිත්සාමය භාවිතය පිළිබඳ මුක්තියට අදළ ප්‍රමිතීන්ට අනුව ක්‍රීඩකයාගේ ජාතික සම්මේලනයට ද දන්විය යුතු ය.

16. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදනය කරනු ලබන චිකිත්සාමය භාවිතය පිළිබඳ මුක්තිය ජාතික මට්ටමේ දී පමණක් වලංගු වන අතර ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයෙකු හෝ ක්‍රීඩකයෙක් වන්නා වූ තැනැත්තෙකු -

(අ) ප්‍රස්තුත ද්‍රව්‍ය හෝ ක්‍රමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදනය කරන ලද චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තියක් ක්‍රීඩකයාට දනටමත් ලැබී ඇත්නම් චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තියට අදළ වන 22 වන රීතිය ප්‍රකාරව එකී චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය පිළිගන්නා ලෙසට එම ක්‍රීඩකයා තමන්ගේ ජාත්‍යන්තර සම්මේලනයට අයදුම්පතක් ඉදිරිපත් කළ හැකි ය. චිකිත්සමය භාවිත නිදහස් කිරීම් සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතීන් හි දක්වෙන නිර්ණායකවලට එකී චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය අනුකූල වේ නම් ජාත්‍යන්තර සම්මේලනය විසින් එය ජාත්‍යන්තර මට්ටමේ තරඟ සඳහා ද පිළිගනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදනය කරන ලද චිකිත්සමය භාවිත පිළිබඳ මුක්තිය සඳහා එකී නිර්ණායක සපුරා නොමැති බව ජාත්‍යන්තර සම්මේලනයට හැඟී යයි නම් හා එය පිළිගැනීම ජාත්‍යන්තර සම්මේලනය ප්‍රතික්ෂේප කරයි නම් ජාත්‍යන්තර සම්මේලනය විසින් ඒ බව වහාම එකී ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයාට සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට හේතු සහිතව දන්විය යුතු ය. ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයා සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එකී නිවේදනය ලැබී දින 21ක් ඇතුළත එම කරුණ සමාලෝචනය කිරීම පිණිස ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත යොමු කළ යුතු ය. 18 වන වගන්තියට අනුව එම කරුණ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට යොමු කරනු ලැබුවේ නම් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදනය කරන ලද චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදනය කරන ලද චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය පිළිබඳ තීරණය ලැබෙන තෙක් ජාතික මට්ටමේ තරඟ හා තරඟවලින් පිටතදී වලංගු විය යුතු ය. එහෙත් එම තත්ත්වය ජාත්‍යන්තර මට්ටමේ තරඟවලදී වලංගු නොවිය යුතු ය. එකී කාරණය ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සමලෝචනය කරනු ලැබීම සඳහා යොමු නොකරන ලද්දේ නම් දින 21කින් සමාලෝචනය කිරීමේ අවසන් දිනය ඉකුත්වීමෙන් පසුව චිකිත්සමය භාවිත පිළිබඳ මුක්තියේ වලංගුභාවය අහෝසි වේ.

චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතීන් හි දක්වෙන නියමතාවන් ප්‍රකාරව, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදනය කරනු ලැබ ඇති චිකිත්සමය භාවිත පිළිබඳ මුක්තිය පිළිගැනීම පිණිස ජාත්‍යන්තර සම්මේලනයකට හෝ ප්‍රධාන සිද්ධි සංවිධානයකට ඉදිරිපත් කළ යුත්තේ කෙබඳු අවස්ථාවක දී ද යන්න පිළිබඳව තීරණයක් ගැනීමේ දී ක්‍රීඩකයාට සහාය සැලසිය යුතු අතර එකී පිළිගැනීම් ක්‍රියාවලිය හරහා ක්‍රීඩකයන්ට මාර්ගෝපදේශ සපයමින් උදව් කළ යුතු ය.

(ආ) චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතීන් හි දක්වෙන නිර්ණායක සපුරාලීමට අවශ්‍ය කෙරෙන වෛද්‍ය වාර්තා සහ අනෙකුත් ලිපිලේඛන නොමැතිවීමේ හේතුව මත ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදනය කරන ලද චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තියක් (TUE) පිළිගැනීමට ජාත්‍යන්තර සම්මේලනය ප්‍රතික්ෂේප කරයි නම් එකී කාරණය ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට යොමු කළ යුතු නැත. ඒ වෙනුවට එම ලිපිගොනුව සම්පූර්ණ කොට නැවතත් ජාත්‍යන්තර සම්මේලනයට ඉදිරිපත් කළ යුතුය.

(ඇ) ප්‍රස්තුත ද්‍රව්‍ය හෝ ක්‍රමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රදනය කරන ලද චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තියක් දනටමත් ක්‍රීඩකයාට ලැබී නොමැති නම් චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තියක් සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන් හි දක්වෙන ක්‍රියාකාරී පටිපාටියට අනුව ක්‍රීඩකයා විසින් සෘජුවම අයදුම්පතක් ජාත්‍යන්තර සම්මේලනයට ඉදිරිපත් කළ යුතු ය. ජාත්‍යන්තර සම්මේලනය විසින් ක්‍රීඩකයා එකී අයදුම්පත පිළිගෙන අනුමත කරන්නේ නම් ඒ බව ක්‍රීඩකයාට සහ උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට දන්විය යුතු ය. ජාත්‍යන්තර සම්මේලනය විසින් ප්‍රදනය කරන ලද චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය (TUE) ජාත්‍යන්තර ප්‍රමිතීන් හි දක්වෙන නිර්ණායකවලට අනුකූලව සිදු නොකොට ඇති බව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට හැඟීයයි නම් ඒ සම්බන්ධයෙන්

එම දැනුම්දීමේ දින සිට දින 21 කාලයක් තුළ එය ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සමාලෝචනයට යොමුකළ යුතු ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (SLADA) විසින් එකී කාරණය ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ (WADA) සමාලෝචනය සඳහා යොමු කරන්නේ නම් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ තීන්දුව ලැබෙන තෙක් ජාත්‍යන්තර සම්මේලනය විසින් ප්‍රදානය කරන ලද "චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය" ජාත්‍යන්තර මට්ටමේ තරග හා තරඟයෙන් පිටත පරීක්ෂා කිරීම් සඳහා (Out of Competition Test) වලංගු වන අතර ජාතික මට්ටමේ තරග සඳහා වලංගු නොවේ. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සමාලෝචනය පිණිස එය යොමු කරන්නේ නම් ජාත්‍යන්තර සම්මේලනය විසින් ප්‍රදානය කරන ලද චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය දින 21ක් තුළ සමාලෝචනය කිරීමේ අවසන් දිනය ඉකුත් වුව ද ජාතික මට්ටමේ තරග සඳහා වලංගු වේ.

**චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය, කල් ඉකුත්වීම, අවලංගු කිරීම**

17. (1) මෙකී උත්තේජක මර්දන රීතිවලට අනුකූලව ප්‍රදානය කරන ලද චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තියක් -

(අ) එය ප්‍රදානය කරන ලද කාලය ඉකුත්වීමේදී තවදුරටත් දැනුම් දීමක් හෝ වෙනත් යම් නියමතාවක් ඉටු කිරීමෙන් තොරව ස්වයංක්‍රීයව අවසන් විය යුතු ය ;

(ආ) චිකිත්සමය මුක්තිය පිළිබඳ කමිටුව මඟින් චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය ප්‍රදානය කිරීමේදී පනවන කොන්දේසි හා නියමයන් පරිදි ක්‍රීඩකයා විසින් අනලස්ව ක්‍රියා නොකරයි නම් එකී චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය අවලංගු කළ යුතු ය ;

(ඇ) චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය ප්‍රදානය කිරීමට අදළ නිර්ණායක ඇත්ත වශයෙන් සපුරා නොමැති බව චිකිත්සමය භාවිතය මුක්තිය පිළිබඳ කමිටුව නිගමනය කරයි නම් එකී ප්‍රදානය ඉවත් කරගත යුතු ය ;

(ඈ) සමාලෝචනය හෝ ඇපෑලක් අවලංගු කළ හැකි ය.

(2) එබඳු අවස්ථාවක ක්‍රීඩකයකු ප්‍රස්තුත තහනම් උත්තේජක ද්‍රව්‍ය හෝ ක්‍රම භාවිත කිරීම හෝ සන්තකයේ තබා ගැනීම හෝ පරිපාලනය කිරීමක දී කිසියම් චිකිත්සමය භාවිත නිදහස් කිරීමක වලංගු කාලය අවසන් වීම, අවලංගු කිරීම, ඉවත් කිරීම හෝ ප්‍රතිවර්ථනය කිරීමට පෙරාතුව ප්‍රස්තුත තහනම් ද්‍රව්‍යයක් භාවිත කිරීම, යොදනු ලැබීමේ හේතුවෙන් කිසිදු දඬුවමකට ක්‍රීඩකයා යටත් නොකළ යුතු ය.

(3) 22 වන රීතිය ප්‍රකාරව සිදුකරන සමාලෝචනයට ඉක්බිතිව නිකුත් කෙරෙන අහිතකර විශ්ලේෂණාත්මක තීන්දුව එකී දිනයට පෙරාතුව තහනම් ද්‍රව්‍ය හෝ තහනම් ක්‍රමය භාවිතා කිරීම පිළිබඳ අනුකූලතාවයක් ප්‍රකාශ කෙරෙන්නේ ද යන බව සහ උත්තේජක මර්දන රීති උල්ලංඝණය වීමක් සිදු වී නැති බව එම වාර්තාව මඟින් අවධාරණය විය යුතු ය.

**චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සමාලෝචන සහ අභියාචනා**

18. (1) වෛද්‍යවරයකු විසින් අනුමත කරනු ලැබ ඇති සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත භාරදී ඇති චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සඳහා වූ ඉල්ලීමක් එම ආයතනය විසින් ප්‍රතික්ෂේප කර ඇත්නම්, අදාළ ක්‍රීඩකයා විසින් 70 සහ 75 වන රීතිවලට අනුව ජාතික මට්ටමේ අභියාචනා මණ්ඩලයකට අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් පිරිනමන ලද චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය පිළිනොගැනීම පිළිබඳව ජාත්‍යන්තර සම්මේලනය විසින් ගනු ලබන සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට යොමු කරන ලද ඕනෑම තීරණයක් එම ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සමාලෝචනය කළ යුතු ය. ඊට අමතරව, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අගතියට පත් යම් පාර්ශවයක් විසින් කරන ලද ඉල්ලීමක් මත හෝ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තමන් විසින්ම ආරම්භ කරන ලද ඕනෑම චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තයක් සමාලෝචනය කරනු ලැබිය හැකි ය. සමාලෝචනයට භාජනය කෙරෙන චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය පිළිබඳ තීරණය ජාත්‍යන්තර ප්‍රමිතීන්හි දැක්වෙන නිර්ණායකයන්ට අනුකූල වේ නම්, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ඊට මැදිහත් නොවේ. එහෙත් ඒවා එකී නිර්ණායකවලට අනුකූල නොවේ නම් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය එය ප්‍රතිවර්තනය කරනු ඇත.

**පරීක්ෂාවන් සහ විමර්ශන**

19. (1) පරීක්ෂණ සහ විමර්ශන උත්තේජක මර්දන කාර්යයන් සඳහා පමණක් පවත්වාගෙන යා යුතු ය. පරීක්ෂණ සහ විමර්ශන සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන්වල සහ එකී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට පරිපූරක වශයෙන් පවතින්නා වූ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පිළිවෙත්වලට අනුකූලව එම පරීක්ෂණ සහ විමර්ශන කරගෙන යා යුතු ය.

(2) තහනම් ද්‍රව්‍යක් හෝ තහනම් ක්‍රමයක් භාවිත කිරීම පිළිබඳව දැඩි තහනම් කොන්දේසිවලට ක්‍රීඩකයාගේ එකඟ නොවීමට අදළ විශ්ලේෂණාත්මක සාක්ෂි ලබා ගැනීමට පරීක්ෂණ පවත්වාගෙන යා යුතු ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සිදුකළ පරීක්ෂා. විභාජන සැලසුම් පරීක්ෂා කිරීම්, පශ්චාත් පරීක්ෂා ක්‍රියාකාරකම් හා ඒවා ආශ්‍රිත ක්‍රියාකාරකම්, පරීක්ෂාවන් හා විමර්ශන සිදු කිරීම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සිදුවිය යුතු ය. පරීක්ෂා කිරීම් සහ විමර්ශන පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් හි දක්වෙන නිර්ණායකවලට අනුකූලව සිදුකළ යුතු නිමවුම් පරීක්ෂණ, අහඹු පරීක්ෂණ සහ ඉලක්ක පරීක්ෂණ සංඛ්‍යාව කොපමණදැයි ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නිශ්චය කළ යුතු ය. තවද පරීක්ෂාවන් සහ විමර්ශන පිළිබඳ වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් හි දක්වා ඇති විධිවිධාන එවැනි සියලු පරීක්ෂාවන් හි දී ස්වයංක්‍රීයව අදාළ කරගත යුතු ය.

(3) පහත සඳහන් දෑ සම්බන්ධයෙන් විමර්ශන සිදුකළ යුතු ය -

(අ) පිළිවෙලින් 23 (5) සිට (9) සහ 24 වන රීතියට අනුකූලව Atypical තීරණවලට ගුවන් බලපත්‍ර තීරණවලට සහ අහිතකර ගුවන් ගමන් බලපත්‍රවලට අදළව 3 (අ), (ආ) හෝ 3 (ඇ) රීති යටතේ උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සිදු වී ඇති ද යන්න තීරණය කිරීම පිණිස රහස් තොරතුරු හෝ සාක්ෂි රැස් කිරීම ; සහ

(ආ) උත්තේජක මර්දන රීති උල්ලංඝනය විය හැකි වෙනත් දන්වීම්වලට අදළව, 3 (ඇ) සිට 3 (ඔ) දක්වා වූ යම් රීතියක් යටතේ උත්තේජක මර්දන රීති උල්ලංඝනයක් සිදු වී ඇති ද යන්න නිශ්චය කිරීම පිණිස රහස් තොරතුරු හෝ සාක්ෂි රැස්කිරීම.

(4) ශ්‍රී ලංකා උත්තේජක මර්දන ආයතනය විසින්, ඵලදයී. බුද්ධිගෝචර සහ සමානුපාතික පරීක්ෂණ, විභාජන සැලැස්මක් නිර්මාණය කිරීම, ඉලක්ක පරීක්ෂා කිරීම, සැලසුම් කිරීම සහ ශක්‍යමාන උත්තේජක නීතිරීති උල්ලංඝනය කිරීමක් පිළිබඳව විමර්ශනය සඳහා පදනමක් නිර්මාණය කිරීම උදෙසා පවත්නා මාර්ගවලින් උත්තේජක පිළිබඳ තොරතුරු ලබා ගැනීම, තක්සේරු කිරීම හා ඒ පිළිබඳව කටයුතු කිරීම සිදුකළ යුතු ය.

(5) ව්‍යවස්ථාවේ 5.3 වන රීතියේ දක්වා ඇති තරඟ ඉසව් පරීක්ෂන සම්බන්ධයෙන් වූ අධිකරණමය සීමාවන්ට යටත්ව, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් 1 වන රීතියේ විෂය පථයට වැටෙන සමස්ත ක්‍රීඩකයන් සඳහා අභ්‍යන්තර තරඟ සහ බාහිර තරඟ පරීක්ෂණ අධිකාරියක් පැවැත්විය යුතු ය.

(6) යෝග්‍යතාවය ලබා නොමැති කාල සීමාවක් ගත කරන යම් ක්‍රීඩකයකු ඇතුළුව එම අධිකාරියේ බලය යටතේ පරීක්ෂා කරනු ලැබිය හැකි ඕනෑම ක්‍රීඩකයකුට ඕනෑම වේලාවකදී සහ ඕනෑම ස්ථානයක දී සාම්පලයක් ඉදිරිපත් කළ යුතු බවට SLADA විසින් ඉල්ලා සිටිය හැකි ය.

(7) ජාත්‍යන්තර සම්මේලනයක් හෝ ප්‍රධාන ඉසව් සංවිධානයක්, ක්‍රීඩා සංවිධානයක් මඟින් හෝ කෙලින්ම SLADA සමග පරීක්ෂණවල යම් කොටසක නියෝජිතයන් වන්නේ නම් හෝ ගිවිසගෙන ඇත්නම්, SLADA විසින් අතිරේක සාම්පල් රැස් කිරීම හෝ වියදම් දැරීමට යටත්ව අතිරේක විශ්ලේෂන ක්‍රම ඉටු කිරීමට රසායනාගාරයකට නියම කළ හැකි ය.

(8) මෙම තහනම් උත්තේජක මර්දන රීතිවලට යටත්වන ක්‍රීඩකයකු පිළිබඳ වෙනත් තහනම් උත්තේජක මර්දන සංවිධානයක් විසින් එම ක්‍රීඩකයා පරීක්ෂා කිරීම සිදුකරන අවස්ථාවක දී, SLADA සහ ක්‍රීඩකයාගේ ක්‍රීඩා සංවිධානය විසින් 15 වන වගන්තියට අනුකූලව ඒ පරීක්ෂණයට අදළව යම් උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් පිළිබඳව මෙම උත්තේජක මර්දන රීතිවලට අනුකූලව ක්‍රීඩකයාට එරෙහිව ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය.

(9) ලෝක තහනම් උත්තේජක නීතිරීති සංග්‍රහයේ 5.3 වන වගන්තිය යටතේ විධිවිධාන සලසා ඇති පරිදි හැර ක්‍රීඩා ඉසව් පැවැත්වෙන කාලසීමාවක් තුළ ක්‍රීඩා ඉසව් පැවැත්වෙන ස්ථානවල පරීක්ෂාවක් ආරම්භ කිරීම හා මෙහෙයවීම සම්බන්ධයෙන් එක් කේවල සංවිධානයක් පමණක් වගකීම් දැරිය යුතු ය. ශ්‍රී ලංකාවේදී පැවැත්වෙන ජාත්‍යන්තර තරඟවලදී නියැදි රැස්කිරීම ආරම්භ කිරීම හා මෙහෙයවීම ජාත්‍යන්තර සම්මේලනය හෝ එකී තරඟයට අදළ පාලක ආයතනය වන වෙනත් යම් ජාත්‍යන්තර සංවිධානයක් විසින් කළ යුතු ය. ශ්‍රී ලංකාවේ දී පැවැත්වෙන ජාතික තරඟවලදී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නියැදි රැස්කිරීම ආරම්භ

කොට මෙහෙයවිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ හෝ පාලක ආයතනයේ ඉල්ලීම මත, තරඟ පැවැත්වෙන කාල සීමාව තුළ දී තරඟ පැවැත්වෙන ස්ථානවලින් පිටත දී සිදු කරන ඕනෑම පරීක්ෂාවක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ හෝ අදාළ පාලක ආයතනයේ සම්බන්ධීකරණයෙන් යුතුව සිදුකළ යුතු ය.

(10) අන්‍යාකාරයකින් පරීක්ෂාවන් සිදු කිරීමේ බලතල ඇති එහෙත් තරඟයක දී ආරම්භ කිරීම හා මෙහෙයවීම සම්බන්ධයෙන් වගකියනු නොලබන යම් උත්තේජක මර්දන සංවිධානයක් තරඟ පැවැත්වෙන කාල සීමාව තුළ දී තරඟ පැවැත්වෙන ස්ථානවලදී පරීක්ෂා කිරීම් සිදුකිරීමට අදහස් කරන්නේ නම්, එම උත්තේජක මර්දන සංවිධානය විසින් පළමුව, එම පරීක්ෂාවන් පැවැත්වීම හා සම්බන්ධීකරණය කිරීම සඳහා අවසරය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන හෝ එම තරඟයට අදළ පාලක ආයතනය සමග සාකච්ඡා කළ යුතු ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ හෝ එම තරඟයට අදළ පාලක ආයතනයේ ප්‍රතිචාරය පිළිබඳව උත්තේජක මර්දන සංවිධානය විසින්, පරික්ෂාවන් හා විමර්ශන සිදු කිරීම සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතියෙහි දක්වා ඇති කාර්ය පටිපාටිවලට අනුකූලව එම පරීක්ෂාවන් සිදු කිරීම හා එම පරීක්ෂාවන් සම්බන්ධීකරණය කරනු ලබන්නේ කෙසේදැයි තීරණය කිරීම සඳහා ලෝක තහනම් උත්තේජක නියෝජ්‍යායතනයේ අවසරය ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ හෝ එම තරඟයට අදළ පාලක ආයතනය විමසා ඒ පිළිබඳ ඔවුන්ට දැන්වීමට පෙර ලෝක තහනම් උත්තේජක නියෝජ්‍යායතනයේ තීරණය අවසන් තීරණය වන අතර එය අභියාචනය කිරීමට යටත් නොවිය යුතු ය. පරීක්ෂාවන් සිදු කිරීම සඳහා වන බලය පැවරීමෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා ඇත්තේ නම් මිස, එකී පරීක්ෂාවන් තරඟයෙන් බාහිර පරීක්ෂාවන් ලෙස සලකනු ලැබිය යුතු ය. තරඟයට අදළ පාලක ආයතනයේ රීතිවල අන්‍යාකාරයෙන් විධිවිධාන සලසා ඇත්තේ නම් මිස, එකී පරීක්ෂාවන් සම්බන්ධයෙන් වන ප්‍රතිඵල කළමනාකරණය කිරීම එම පරීක්ෂාව ආරම්භ කරන තහනම් උත්තේජක සංවිධානයේ වගකීම විය යුතු ය.

(11) ජාතික තරඟ සම්බන්ධයෙන් වන ක්‍රීඩා සංවිධාන හා සංවිධායක කමිටු විසින් එකී තරඟ සඳහා වන ස්වාධීන නිරීක්ෂණ වැඩසටහන් සඳහා බලය පැවරීම හා පහසුකම් සැලසීම කළ යුතු ය.

(12) සාධාරණ ලෙස පරීක්ෂාවන් ක්‍රියාත්මක කළ හැකි විට දී, සාමූහික පරීක්ෂණ ප්‍රයත්නවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හෝ අනවශ්‍ය පුනරාවර්තී පරීක්ෂාවන් සිදුවීම වැළැක්වීම පිණිස ලෝක තහනම් උත්තේජක නියෝජ්‍යායතනය විසින් අනුමත කළ උත්තේජක මර්දනය පරිපාලනය හා කළමනාකරණ පද්ධතිය හෝ වෙනත් යම් ක්‍රමයක් මඟින් පරීක්ෂාවක් සම්බන්ධීකරණය කළ යුතු ය.

(13) පරීක්ෂාවක් හා විමර්ශන පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතියෙහි 1 වන ඇමුණුමෙහි දක්වා ඇති වතගොත තොරතුරු සැපයීම පිළිබඳ නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතු ක්‍රීඩකයන්ගේ ලියාපදිංචි පරීක්ෂා සංචිතයක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් හඳුනාගත යුතු ය. ලියාපදිංචි පරීක්ෂා සංචිතයේ සිටින එක් එක් ක්‍රීඩකයා පරීක්ෂාවන් හා විමර්ශන සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතියෙහි 1 වන දක්වා ඇති නියමයන් ප්‍රකාර එක් එක් කාරණාවට පහත දැක්වෙන දෑ සිදු කළ යුතු ය :-

(අ) ත්‍රෛමාසික පදනමක් මත තම වගතුග තොරතුරු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත දැන්වීම ;

(ආ) ඕනෑම විටක එම තොරතුරු නිවැරදිව හා සම්පූර්ණව පැවතීම සඳහා අවශ්‍ය පරිදි එම තොරතුරු යාවත්කාලීන කිරීම ; සහ

(ඇ) එකී වතගොත තොරතුරුවලට අදළ ස්ථානවල දී කෙරෙන පරීක්ෂාවන්ට තමා විසින්ම ඉදිරිපත් වීම.

(14) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, උත්තේජක මර්දන පරිපාලන හා කළමනාකරණ පද්ධතිය මඟින්, එහි ලියාපදිංචි පරීක්ෂා සංචිතයට ඇතුළත් ක්‍රීඩකයන් නම් වශයෙන් හෝ පැහැදිලිව නිර්වචනය කොට ඇති විශේෂිත නිර්ණායක මඟින් හඳුනාගනු ලබන ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු ය. එකී ක්‍රීඩකයන් හඳුනාගැනීම හා ඔවුන්ගේ වතගොත පිළිබඳ තොරතුරු රැස්කිරීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ජාත්‍යන්තර සම්මේලනය සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කළ යුතු ය. ක්‍රීඩකයෙක් සිය ජාත්‍යන්තර සම්මේලනය මඟින් ජාත්‍යන්තර ලියාපදිංචි පරීක්ෂා සංචිතයට ඇතුළත් කොට ඇති විට දී සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මඟින් ජාතික ලියාපදිංචි පරීක්ෂා සංචිතයට ඇතුළත් කොට ඇති විට දී, එම ක්‍රීඩකයාගේ වතගොත තොරතුරු ඉදිරිපත් කිරීම් පිළිගනු ලැබිය යුත්තේ ඔවුන් අතරින් කවුරුන් විසින් ද යන්න පිළිබඳ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

හා ජාත්‍යන්තර සම්මේලනය ඔවුනොවුන් අතර එකගතාවකට පැමිණිය යුතු ය. කිසිම විටක දී ක්‍රීඩකයකු විසින් එම ආයතන දෙකෙන් එක් ආයතනයකට වඩා තම වතගොත තොරතුරු ලබාදීම අවශ්‍ය නොවන්නේ ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්, එහි ලියාපදිංචි පරීක්ෂා සංචිතයට ක්‍රීඩකයන් ඇතුළත් කිරීම සඳහා වූ නිර්ණායක අවශ්‍ය පරිදි සමාලෝචනය ප්‍රතිශෝධනය කළ යුතු ය. ලියාපදංචි පරීක්ෂා සංචිතයට ඇතුළත් කිරීමට ප්‍රථමයෙන් හා ඔවුන් එම සංචිතයෙන් ඉවත් කරන විටදී ක්‍රීඩකයන්ට ඒ පිළිබඳ දැනුම් දිය යුතු ය.

(15) 3 (ඉ) රීතියේ කාර්ය සඳහා, පරීක්ෂාවන් හා විමර්ශන සම්බන්ධයෙන් වූ ජාත්‍යන්තර ප්‍රමිති නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට ක්‍රීඩකයකු අපොහොසත් වීමක්, තොරතුරු ඉදිරිපත් කිරීමේ නොහැකි වීමක් හෝ වැලකී ගිය පරීක්ෂාවක් ප්‍රකාශ කිරීම සඳහා වන පරීක්ෂාවන් හා විමර්ශන පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතියෙහි දක්වා ඇති කොන්දේසි සපුරා ඇති විට දී, පරීක්ෂාවන් හා විමර්ශන පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතියෙහි අර්ථකථනයට අනුව තොරතුරු ඉදිරිපත් කිරීමේ නොහැකිවීමක් හෝ වැලකී ගිය පරීක්ෂාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(16) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ලියාපදිංචි පරීක්ෂා භාවිතයේ සිටින යම් ක්‍රීඩකයෙක් -

(අ) තමා විශ්‍රාම ගෙන ඇති බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ලිඛිතව දක්වන්නේ නම් මිස හෝ දන්වන තෙක් ; හෝ

(ආ) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ලියාපදිංචි පරීක්ෂා සංචිතයට ඇතුළත් කිරීම සඳහා වන නිර්ණායක ඔහු විසින් තවදුරටත් නොසපුරාලන බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ඔහුට දන්වන්නේ නම් එය හෝ දක්වන තෙක් ද,

පරීක්ෂාවන් හා විමර්ශන පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතියෙහි 1 වන ඇමුණුමෙහි දක්වා ඇති වතගොත තොරතුරු පිළිබඳ තොරතුරු සැපයීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීමේ වගකීමට අඛණ්ඩව යටත් විය යුතු ය.

(17) ක්‍රීඩකයකු පිළිබඳ වතගොත තොරතුරු උත්තේජක මර්දන පරිපාලන හා කළමනාකරණ පද්ධතිය මඟින් එකී ක්‍රීඩකයා පරීක්ෂා කිරීමට බලය ඇති ලෝක උත්තේදක මර්දන නියෝජ්‍යායතනය හා වෙනත් උත්තේජක මර්දන සංවිධානවලට දැනුම් දිය යුතු අතර සෑමවිටම ඒවායේ රහස්‍යභාවය දැඩි ලෙස රැකිය යුතු ද අතර ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ 5.6 වන වගන්තියේ දක්වා ඇති කාර්ය සඳහා ම පමණක් ඒවා යොදු ගත යුතු අතර එකී කාර්ය සඳහා ඒවා තවදුරටත් අවශ්‍ය නොවන විටදී පෞද්ගලිකත්වය හා පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව ඒවා විනාශ කළ යුතු ය.

**විශ්‍රාමලත් ක්‍රීඩකයන් තරඟ කිරීමට නැවත පැමිණීම**

20. (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට තමන් විශ්‍රාම ගන්නා බවට දැනුම් දී ඇත්තා වූ ලියාපදිංචි පරීක්ෂා සංචිතයේ යම් ක්‍රීඩකයකු විසින් නැවතත් ක්‍රීඩා තරඟවලට සහභාගී වීමට තමා අදහස් කරන බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත ලිඛිත දැන්වීමක් ලබා දී පරීක්ෂාවන් හා විමර්ශන සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රමිතියේ 1 වන ඇමුණුමෙහි දක්වා ඇති වතගොත පිළිබඳ තොරතුරු සැපයීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම ද ඇතුළුව නැවතත් තරඟවලට සහභාගී වීමට පෙර මාස හයක කාලසීමාවක් සඳහා පරීක්ෂාවන්ට තමා විසින්ම ඉදිරිපත්වන තෙක් ජාත්‍යන්තර තරඟ හෝ ජාතික තරඟ සඳහා නැවත සහභාගී විය නොහැකි ය. මාස හයක ලිඛිත දැනුම් දීමේ රීතිය දැඩිව ක්‍රියාත්මක කිරීම පැහැදිලිවම යම් ක්‍රීඩකයකුට අසාධාරණයක් වන විට දී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හා ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනය විමසා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම රීතිය සම්බන්ධයෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය. මෙම තීරණයට විරුද්ධව 13 වන වගන්තිය යටතේ අභියාචනය කරනු ලැබිය හැකි ය. මේ රීතිය උල්ලංඝනය කරමින් යම් තරඟයක දී ලබා ගන්නා වූ ඕනෑම තරඟ ප්‍රතිඵලයක් සුදුසුකම් නොලැබිය යුතු ය.

(2) සුදුසුකම් නොලද කාලසීමාවකට යටත්ව සිටිය දී ක්‍රීඩකයකු ක්‍රීඩාවෙන් විශ්‍රාම ගනු ලැබුවහොත්, නැවතත් ක්‍රීඩා තරඟවලට සහභාගීවීමට තමා අදහස් කරන බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ සිය ජාත්‍යන්තර සම්මේලනය වෙත එම ක්‍රීඩකයා විසින් මාස හයක පූර්ව ලිඛිත දැනුම්දීමක් හෝ එම කාලසීමාව මාස හයකට වඩා දීර්ඝ වන්නේ නම් එම ක්‍රීඩකයා විශ්‍රාම ගිය දිනට ඉතිරිව පැවැති සුදුසුකම් නොලද කාලසීමාව අනුරූප කාලසීමාවක් සඳහා වූ දැනුම් දීමක් ලබාදී පරීක්ෂාවන් හා විමර්ශන සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රමිතියෙහි 1 වන ඇමුණුමෙහි දක්වා ඇති වතගොත පිළිබඳ තොරතුරු සැපයීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම ඇතුළුව එම දැනුම්දීමට අදාළ කාලසීමාව සඳහා පරීක්ෂාවක් සඳහා තමා විසින්ම ඉදිරිපත් වන තෙක් ජාත්‍යන්තර තරඟ හෝ ජාතික තරඟ සඳහා නැවත සහභාගී නොවිය යුතු ය.

### නියැදි විශ්ලේෂණය සඳහා වන මූලධර්ම

21. (1) 3 (අ) හා (ආ) රීතිවල කාර්ය සඳහා, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් පිළිගත් හෝ අන්‍යාකාරයෙන් අනුමත කරන ලද රසායනාගාර තුළ දී පමණක් නියැදි විශ්ලේෂණය කළ යුතු ය. ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් පිළිගත් හෝ අනුමත කළ රසායනාගාරයක් තෝරා ගැනීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තීරණය කළ යුතු ය. එසේම, කිසිම නියැදියක් එම ක්‍රීඩකයාගේ කැමැත්ත නොමැතිව යම් පර්යේෂණ කාර්යයක් සඳහා භාවිත නොකළ යුතු ය.

(2) තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම හා ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ 4.5 වන වගන්තියේ විස්තර කර ඇති අන්වේෂණ වැඩසටහනට අනුව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් ද්‍රව්‍ය හඳුනාගැනීම, ඩී.එන්.ඒ. හෝ ජානමය තොරතුරු ඇතුළුව ක්‍රීඩකයකුගේ මුත්‍රා, රුධිරය හෝ වෙනත් ගර්භයකට අදාළ පරාමිතික පිළිබඳ තොරතුරු ලබා ගැනීමේදී සහාය වීම හෝ වෙනත් යම් නීත්‍යානුකූල උත්තේජක මර්දන කාර්යයක් සඳහා නියැදි විශ්ලේෂණය කළ යුතු ය. නියැදි අනාගත විශ්ලේෂණය සඳහා ගබඩා කිරීම ද කරනු ලැබිය හැකි ය.

(3) ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ 6.4 වන වගන්තියට සහ පරීක්ෂාවන් හා විමර්ශන පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතියෙහි 4.9 වන වගන්තියට අනුකූලව නියැදි විශ්ලේෂණය කරන මෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් රසායනාගාරවලට නියම කළ යුතු ය.

(4) රසායනාගාර සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව රසායනාගාර විසින් නියැදි විශ්ලේෂණය කොට ප්‍රතිඵල වාර්තා කළ යුතු ය. පරීක්ෂාවන් හි ඵලදායී බව සහතික කිරීම සඳහා ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ 5.4.1 වන වගන්තියේ සඳහන් තාක්ෂණික ලේඛනය මගින් විශේෂිත ක්‍රීඩා සහ ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා උචිත අවදානම් ඇගයීම පදනම් කරගත් නියැදි විශ්ලේෂණ විශේෂාංග පිහිටුවනු ලැබිය යුතු අතර පහත සඳහන් අවස්ථාවන්හි දී හැර රසායනාගාර විසින් එකී විෂයාංගවලට අනුකූලව නියැදි විශ්ලේෂණය කළ යුතු ය :-

(අ) තාක්ෂණික ලේඛනයේ විස්තර කර ඇති විෂයාංගවලට වඩා පුළුල් විෂයාංග භාවිත කරමින් සිය නියැදි විශ්ලේෂණය කරන ලෙස ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් රසායනාගාරවලින් ඉල්ලා සිටිය හැකි ය ;

(ආ) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තම පරීක්ෂා විභජන සැලැස්මෙහි සඳහන් ආකාරයෙන් තම රටෙහි හෝ ප්‍රස්තුත ක්‍රීඩාවෙහි විශේෂිත අවස්ථානුගත කරුණු හේතුවෙන් පුළුල් බවින් අඩු විශ්ලේෂණයක් යොදා ගැනීම උචිත වන බවට ලෝක තහනම් උත්තේජක නියෝජ්‍යායතනය සෑහීමට පත්කොට ඇත්නම් පමණක් තාක්ෂණික ලේඛනයේ සඳහන් විෂයාංගවලට වඩා පුළුල් බවින් අඩු විෂයාංග භාවිත කරමින් ස්වකීය නියැදි විශ්ලේෂණය කරන ලෙස රසායනාගාරවලින් ඉල්ලා සිටිය හැකි ය ;

(ඇ) රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතියේ විධිවිධාන සලසා ඇති පරිදි රසායනාගාර විසින් තාක්ෂණික ලේඛනයෙහි විස්තර කර ඇති නියැදි විශ්ලේෂණ විෂයාංගයන්හි ඇතුළත් නොවන හෝ පරීක්ෂා කිරීමේ අධිකාරිය විසින් නිශ්චිතව සඳහන් කොට නොමැති තහනම් ද්‍රව්‍ය හෝ තහනම් ක්‍රම සම්බන්ධයෙන් තම මූලිකත්වයෙන් හා වියදමින් නියැදි විශ්ලේෂණය කරනු ලැබිය හැකිය. එවැනි යම් විශ්ලේෂණයක ප්‍රතිඵලය වාර්තා කළ යුතු අතර වෙනත් ඕනෑම විශ්ලේෂණාත්මක ප්‍රතිඵලයක ඇති වලංගුභාවය හා වැදගත්කම ඊට තිබිය යුතු ය.

(5) (2) වන හා (3) ඡේදයන්හි දක්වා ඇති කාර්ය සඳහා පහත සඳහන් පරිදි ඕනෑම නියැදියක් ගබඩා කොට ඉන් පසුව තවදුරටත් විශ්ලේෂණය කිරීමට යටත්ව තබාගත යුතු ය :-

(අ) තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඕනෑම අවස්ථාවක දී ; හෝ

(ආ) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් A හා B නියැදි විශ්ලේෂණ ප්‍රතිඵල යන ප්‍රතිඵල දෙකම හෝ "B" නියැදි විශ්ලේෂණය අත්හැර ඇති විට දී හෝ විශ්ලේෂණය සිදු නොකරනු ලබන විට දී "A" නියැදි ප්‍රතිඵලය 3 (1) (අ), (ආ) සහ (ඇ) රීතිය යටතේ වන උත්තේජක මර්දන රීති පිළිබඳ උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වන ස්ථිර පදනම ලෙස එම ක්‍රීඩකයාට දන්වීමට පෙර, ඕනෑම අවස්ථාවකදී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ද එසේ තවදුරටත් නියැදි විශ්ලේෂණය කිරීම රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව සිදුකළ යුතු ය.

**ප්‍රතිඵල සමාලෝචන කටයුතු සිදු කිරීමේ වගකීම**

22. (1) ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ 7 වන වගන්තියේ දක්වා ඇති මූලධර්මවලට අනුකූලව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එහි උත්තේජක මර්දනය පිළිබඳ අධිකරණ බලය තුළ ක්‍රීඩකයන් හා වෙනත් තැනැත්තන් පිළිබඳ ප්‍රතිඵල කළමනාකරණය කිරීමේ වගකීම දැරිය යුතු ය.

(2) ප්‍රතිඵල කළමනාකරණය කිරීම සම්බන්ධ වගකීම තීරණය කිරීමේ කාර්යයේ දී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් 19 (7) වන රීතියේ දක්වා ඇති තත්ත්වයන් යටතේ අතිරේක නියැදි රැස්කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවන්හි දී, එම ආයතනය නියැදි රැස් කිරීමට මූලික වී එම කටයුතු මෙහෙයවන ලද උත්තේජක මර්දන සංවිධානය ලෙස සැලකිය යුතු වේ. කෙසේ නමුත්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ වියදමින් විවිධාකාරයේ විශ්ලේෂණ කිරීම් සඳහා රසායනාගාරයට උපදෙස් දෙන තැන්හිදී නියැදි රැස්කිරීම සඳහා මූලික වූ සහ එය මෙහෙයවන ලද උත්තේජක මර්දන සංවිධානය ලෙස පිළිගනු ලබන්නේ ජාත්‍යන්තර සම්මේලනය හෝ ප්‍රධාන සිද්ධි සංවිධායක ආයතනයයි.

(3) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මූලිකත්වයෙන් සිදු කරනු ලබන පරීක්ෂාවන්හි ප්‍රතිඵලවලට අදාළ ප්‍රතිඵල කළමනාකරණය පහත දැක්වෙන පරිදි කරගෙන යා යුතු ය :-

(අ) සියලු විශ්ලේෂණයන් හි ප්‍රතිඵල කේතාංක ආකෘතියෙන් රසායනාගාරයේ බලයලත් නියෝජිතයකු විසින් අත්සන් කළ වාර්තාවක් මඟින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සැපිය යුතු ය. සියලු සන්නිවේදන රහස්‍යබවින් යුතුව සහ තහනම් උත්තේජක පරිපාලන හා කළමනාකරණ පද්ධතිය අනුකූලව සිදුකළ යුතු ය ;

(ආ) අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් ලැබීමෙන් පසු, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් :-

(i) චිකිත්සාමක භාවිත නිදහස් කිරීම සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතියෙහි විධිවිධාන සලසා ඇති පරිදි අදාළ චිකිත්සාවය භාවිත නිදහස් කිරීමක් ප්‍රදනය කරනු ලැබ ඇත් ද හෝ ප්‍රදනය කරනු ලැබේ ද යන්න ; හෝ

(ii) අහිතකර විශ්ලේෂණාත්මක තීරණයට හේතු වූ පරීක්ෂා හා විමර්ශන පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතියෙන් වෙනස්ව කටයුතු කිරීමක් දක්නට ඇත් ද යන්න තීරණය කිරීම සඳහා සමාලෝචනයක් සිදුකළ යුතු ය ;

(ඇ) 22 (3) (ආ) රීතිය යටතේ වන අහිතකර විශ්ලේෂණාත්මක තීරණයකට අදාළ සමාලෝචනයෙන් අදාළ චිකිත්සක භාවිත නිදහස් කිරීමක් හෝ අහිතකර විශ්ලේෂණාත්මක තීරණයට හේතු වූ පරීක්ෂණ හා විමර්ශන පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතියෙන් හෝ රසායනාගාර සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රමිතියෙන් වෙනස්ව කටයුතු කිරීමක් හෙළිදරවු වන්නේ නම්, සම්පූර්ණ පරීක්ෂාවට ප්‍රතිශේධාත්මක ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ බව ක්‍රීඩකයාට, ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනයට, ක්‍රීඩකයාගේ ක්‍රීඩා සංවිධානයට හා ලෝක තහනම් උත්තේජක නියෝජ්‍යායතනයට දැන්විය යුතු ය.

**අහිතකර විශ්ලේෂණාත්මක තීරණයකට අදාළ සමාලෝචනයක් පසු දැනුම් දීම**

23. (1) 22 (3) (ආ) රීතිය යටතේ වන අහිතකර විශ්ලේෂණාත්මක තීරණයකට අදාළ සම්ලෝචනයෙන්, භාවිත නිදහස් කිරීම සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතියෙහි විධිවිධාන සලසා ඇති පරිදි අදාළ චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තියක් හෝ චිකිත්සාවය භාවිතය පිළිබඳ මුක්තියක් සඳහා හිමිකම් ලැබීමක් හෝ අහිතකර විශ්ලේෂණාත්මක තීරණයට හේතු වූ පරීක්ෂා හා විමර්ශන පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතියෙන් හෝ රසායනාගාර සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රමිතියෙන් වෙනස්ව කටයුතු කිරීමක් හෙළදරවු නොවන්නේ නම් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් 80 වන රීතියේ දක්වා ඇති ආකාරයට එම ක්‍රීඩකයාට හා ඒ සමගම එම ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනයට, එම ක්‍රීඩකයාගේ ක්‍රීඩා සංවිධානයට හා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට -

(අ) අහිතකර විශ්ලේෂණාත්මක තීරණය ;

(ආ) උල්ලංඝනය කළ උත්තේජක මර්දන රීතිය ;

(ඇ) "B" නියැදියක් විශ්ලේෂණය ඉල්ලා සිටීමට හෝ නිශ්චිතව දක්වා ඇති අවසන් දිනය වන විට එබඳු ඉල්ලීමක් කිරීමට අපොහොසත් වන්නේ නම්, "B" නියැදියක් විශ්ලේෂණය අත්හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය හැකි ලෙස ඉල්ලා සිටීමට ක්‍රීඩකයාට ඇති අයිතිය ;

(ඈ) ක්‍රීඩකයා හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් "B" නියැදියේ විශ්ලේෂණයක් ඉල්ලා සිටීම තීරණය කරනු ලැබුවහොත්, "B" නියැදියේ විශ්ලේෂණය සඳහා නියමිත දිනය, වේලාව හා ස්ථානය ;

(ඉ) රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව "B" නියැදිය විවෘත කර විශ්ලේෂණය කිරීමට ක්‍රීඩකයාට හෝ ක්‍රීඩකයාගේ නියෝජිතයාට ඇති අවස්ථාව ;

(ඊ) රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතියෙහි නියම කොට ඇති තොරතුරු ඇතුළත් වන්නා වූ "A" හා "B" නියැදි පිළිබඳ රසායනාගාර ලිපිලේඛන කට්ටලයේ පිටපත් ඉල්ලා සිටීමට ක්‍රීඩකයාට ඇති අයිතිය අහිතකර විශ්ලේෂණාත්මක තීරණය උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් ලෙස ඉදිරියට නොයාමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය තීරණය කරනු ලබන්නේ නම්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඒ බව එම ක්‍රීඩකයාට, ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනයට, ක්‍රීඩකයාගේ ක්‍රීඩා සංවිධානයට හා ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට දැනුම් දිය යුතු යන්න,

පිළිබඳ වහාම දැනුම් දිය යුතු ය.

(2) ක්‍රීඩකයා හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඉල්ලා සිටිනු ලබන විට දී, රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව "B" නියැදිය විශ්ලේෂණය කිරීමට වැඩපිළිවෙළක් සැලසිය යුතු ය. ක්‍රීඩකයකු විසින් "B" නියැදියේ විශ්ලේෂණය සඳහා වන නියමය අත්හැරීමෙන් "A" නියැදියේ විශ්ලේෂණාත්මක ප්‍රතිඵල පිළිගනු ලැබිය හැකි ය. කෙසේ නුමුදු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් "B" නියැදියේ විශ්ලේෂණ සම්බන්ධයෙන් කටයුතු කරගෙන යාමට තීරණය කළ හැකි ය. " B" නියැදිය විශ්ලේෂණය කරන අවස්ථාවේ දී ක්‍රීඩකයාට හෝ ඔහුගේ නියෝජිතයාට එම ස්ථානයට පැමිණීමට ඉඩ දිය යුතු ය. තව ද, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නියෝජිතයන්ට ද එසේම, ක්‍රීඩකයාගේ ක්‍රීඩා සංවිධානයේ නියෝජිතයකුට ද එතැනට පැමිණීමට අවසර දිය යුතු ය.

(3) B නියැදි විශ්ලේෂණය මඟින් A නියැදි විශ්ලේෂණය තහවුරු නොවේ නම් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් 3(2)(i) සහ (ii) වන උත්තේජක මර්දන රීති යටතේ එය උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීමක් ලෙස ඉදිරියට නොගෙන යන්නේ නම් සම්පූර්ණ සිද්ධියම ප්‍රතිෂේධාත්මක එකක් සේ සැලකෙන අතර, ක්‍රීඩකයාට ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනයට හා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ඒ බව දැන්විය යුතු ය.

(4) B නියැදිය විශ්ලේෂණය තුළින් A නියැදියේ විශ්ලේෂණය තහවුරු වේ නම් එහි කරුණු ක්‍රීඩකයාට, ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනයට ක්‍රීඩකයාගේ ජාතික සම්මේලනයට හා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට වාර්තා කළ යුතු ය. ආදර්ශිය තීරණයක් ලැබීමේ දී පහත දැක්වෙන කරුණු තීරණය කිරීම පිණිස ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සාමාලෝචනය සිදුකළ යුතු ය :-

(අ) චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව චිකිත්සක භාවිත පිළිබඳ මුක්තිය ප්‍රදානය කරනු ලැබ තිබේ ද, නැතහොත් ප්‍රදානය කරනු ලැබේ ද යන බව ; හෝ

(ආ) පරීක්ෂාවන් හා විමර්ෂණ සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් හෝ ආදර්ශීය තීරණවලට එළඹි රසායනාගාර සඳහා වූ ප්‍රමිතීන් වලින් බැහැරව කටයුතු කළ බව පැහැදිලිව පෙනී යන්නේ ද යන බව.

(5) 23(4) රීතිය යටතේ ආදර්ශිය තීරණයක සමාලෝචනයක් තුළින් අදාළ චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය හෝ පරීක්ෂාවන් හෝ විමර්ශණ පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් හෝ ආදර්ශීය තීරණ වලට එළඹි රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන්ගෙන් බැහැරව කටයුතු කළ බව අනාවරණය වුවහොත් සමස්ථ පරීක්ෂාව අසාදු පරීක්ෂාවක් ලෙස සැලකිය යුතු අතර ක්‍රීඩකයාට, ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනයට හා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට දැනුම් දිය යුතු ය.

(6) එකී සමාලෝචන තුළින් අදාළ චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තියක් හෝ පරීක්ෂාවන් හා විමර්ෂණ පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතින්ගෙන් හෝ ආදර්ශීය තීරණවලට එළඹි රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන්ගෙන් බැහැර වීමක් අනාවරණය නොවුවහොත් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අවශ්‍ය විමර්ෂණය සිදුකිරීම හෝ එය සිදුකිරීමට සැලැස්වීම කළ යුතු ය. විමර්ෂනය අවසන් කිරීමෙන් පසුව 23(1) රීතිය ප්‍රකාරව අහිතකර විශ්ලේෂනාත්මක තීරණයක් ලෙස ආදර්ශීය තීරණය ඉදිරියට ගෙන යාම හෝ එසේත් නැතිනම් අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් ලෙස ආදර්ශිය තීරණය ඉදිරියට ගෙන නොයන බව ක්‍රීඩකයාට ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනයට, ක්‍රීඩකයාගේ ජාතික සම්මේලනයට දැන්විය යුතු ය.

(7) පහත දැක්වෙන තත්ත්වයන් නොපවතී නම් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තම විමර්ශනය අවසන් වන තෙක් හා ආදර්ශීය තීරණයක්, අහිතකර විශ්ලේෂනාත්මක තීරණයක් ලෙස ඉදිරියට ගෙන යන්නේ ද නැද්ද පිළිබඳව තීරණයක් ගන්නා තෙක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ආදර්ශීය තීරණයක් පිළිබඳව නිවේදනයක් නිකුත් නොකළ යුතු ය :-

(අ) තම විමර්ශන නිමවීමට පෙර B නියැදිය විශ්ලේෂණය කිරීමට ශ්‍රී ලංකා තහනම් උත්තේජක නියෝජ්‍යායතනය තීරණය කරන්නේ නම් එම තීරණය ක්‍රීඩකයාට දැනුම් දිය යුතු අතර ඊට ආදර්ශීය නිගමනයේ විස්තර ද (ඇ) සිට (ඊ) ඡේද වල විස්තර කොට ඇති තොරතුරු ද ඇතුළත් කළ යුතු ය.

(ආ) ජාත්‍යන්තර ක්‍රීඩා තරඟයක් පැවැත්වීමට ඉතා කෙටි කලකට පෙරාතුව ප්‍රධාන සිද්ධි සංවිධානයක් හෝ ජාත්‍යන්තර තරඟයකට තම කණ්ඩායමේ සාමාජිකයන් තෝරා ගැනීමේ අවසන් දිනයට ඉතා කෙටි කලකට පෙරාතුව ක්‍රීඩා සංවිධානයක් විසින් ඉදිරිපත් කරන ලද ලේඛනයක සඳහන් යම් ක්‍රීඩකයකු සම්බන්ධයෙන් එතෙක් තීන්දු වී නැති ආදර්ශීය තීරණ තිබේදැයි ශ්‍රී ලංකා තහනම් උත්තේජක නියෝජ්‍යායතනයෙන් විමසන අවස්ථාවක දී පළමුව ක්‍රීඩකයාට ඒ බව දැනුම් දීමක් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා තහනම් උත්තේජක නියෝජ්‍යායතනය විසින් ප්‍රධාන සිද්ධි සංවිධානයකට ඒ බව දැන්විය යුතු ය.

**ආදර්ශීය ජීව දත්ත තොරතුරු සහ අහිතකර ජීව දත්ත තොරතුරු පොත සමලෝචනය**

24. ආදර්ශීය ජීව දත්ත තොරතුරු සහ අහිතකර ජීව දත්ත තොරතුරු සමාලෝචනය කළ යුත්තේ පරීක්ෂාවන් සහ විමර්ශන සිදුකිරීම සහ රසායනාගාර සඳහා නියමිත ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ය. එබඳු අවස්ථාවක, තහනම් උත්තේජක රීති උල්ලංඝණය වීමක් සිදු වී ඇති බව ශ්‍රී ලංකා තහනම් උත්තේජක නියෝජ්‍යායතනයට නිසැකව තහවුරු වේ නම්, ඒ බව වහාම ක්‍රීඩකයාට, ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනයට සහ ක්‍රීඩකයාගේ ජාතික සම්මේලනයට සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට එකවර දැන්විය යුතු අතර ඊට පදනම් කර ගත් කරුණු ද දැන්විය යුතු ය.

**වතගොත තොරතුරු දැන්වීමට අපොහොසත් වීම පිළිබඳ සමාලෝචන කිරීම**

25. පරීක්ෂාවන් සහ විමර්ශන සම්බන්ධයෙන් වන ප්‍රමිතීන්හි 1 වන ඇමුණුම පරිදි තමන්ගේ වතගොත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු ක්‍රීඩකයන් සම්බන්ධයෙන් පරීක්ෂාවන් සහ විමර්ශන පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්හි නිර්වචනය කොට ඇති පරිදි ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ශක්‍යමාන තොරතුරු වාර්තා කිරීමට අපොහොසත්වීම් හා වැලකී ගිය පරීක්ෂාවන් පිළිබඳව සමාලෝචනය කළ යුතු ය. එබඳු අවස්ථාවන් හි දී 4(ඉ) රීතිය අනුව උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීමක් සිදු වී ඇති බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ඒත්තු යන්නේ නම් 4(ඉ) රීතිය උල්ලංඝණය කිරීම තහවුරු කරන බව හා එයට පදනම් වූ හේතුන් ද ක්‍රීඩකයාට, ඒ සමඟම ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනයට, ක්‍රීඩකයාගේ ජාතික සම්මේලනයට සහ ලෝක තහනම් උත්තේජක නියෝජ්‍යායතනයට දැන්විය යුතු ය.

**22(3) සිට 25 දක්වා වූ රීතින් මඟින් ආවරණය නොවන සෙසු උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීම සමාලෝචනය කිරීම.**

26. 22(3) සිට 25 දක්වා රීතින් මඟින් ආවරණය නොවන සෙසු උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් කළ යුතු ඕනෑම පසු විපරම් විමර්ශනයක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් කළ යුතු ය.

එබඳු අවස්ථාවක තහනම් උත්තේජක රීති උල්ලංඝණය කිරීමක් සිදු වී ඇතැයි ඒත්තු යන්නේ නම් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් වහාම ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට සහ එම අවස්ථාවේ දී ම ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනයට, ක්‍රීඩකයාගේ ක්‍රීඩා සංවිධානයට සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට උත්තේජක මර්දන රීති උල්ලංඝණය කළ බවට තහවුරු වූ හා තහවුරු කිරීමට පදනම් වූ හේතු ද දැන්විය යුතු ය.

**පෙර දී සිදු කරන ලද උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීම්.**

27. ඉහත දැක්වූ පරිදි තහවුරු වූ උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීමක් සිදුව ඇතැයි ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට නිවේදනය කිරීමට පෙරාතුව කිසියම් උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීම් කිසිවක් සිදු වී ඇත්දැයි යන්න පිළිබඳව දැන ගැනීම පිණිස ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය උත්තේජක මර්දනය පිළිබඳ පරිපාලනය හා කළමණාකරණ පද්ධතිය හරහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හා අදාළ උත්තේජක මර්දන සංවිධාන සමඟ සම්බන්ධව කටයුතු කළ යුතු ය.

**අනිවාර්ය තාවකාලික අත්හිටුවීම්.**

28. "A" නියැදි විශ්ලේෂණයකින් නිශ්චිතව දක්වා ඇති ද්‍රව්‍යයක් නොවන තහනම් ද්‍රව්‍යයක් හෝ ක්‍රමයක් පිළිබඳව අහිතකර විශ්ලේෂණාත්මක වාර්තාවක් නිකුත් කර ඇත්තේ නම් සහ 23(3)(ආ) රීතිය යටතේ සිදු කෙරෙන සමාලෝචනයක් මඟින් අදාළ චිකිත්සමය භාවිතය පිළිබඳ මුක්තිය (TUE) ප්‍රකට වීමක් හෝ පරීක්ෂාවක් හා විමර්ෂණ සඳහා නියමිත ජාත්‍යන්තර ප්‍රමිති සහ අහිතකර විශ්ලේෂණාත්මක තීරණ නිකුත් කළ රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිති වලින් බැහැර වීමක් ප්‍රකට වේ නම් 22(3), 23(1) සිට (4)

වන හෝ 24 වන රීතියෙහි විස්තර කොට ඇති නිවේදනය ලැබුණු විට හෝ ලැබුණු වහාම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තාවකාලිකව අත්හිටුවීමක් පැනවිය යුතු ය.

**වෛකල්පිත තාවකාලික අත්හිටුවීම්**

29. වෛකල්පිත තාවකාලික අත්හිටුවීම් නිශ්චිතව දක්වා ඇති අහිතකර විශ්ලේෂණාත්මක වාර්තාවක් සම්බන්ධයෙන් හෝ 28 වන රීතියෙන් ආවරණය නොවන වෙනත් යම් උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීමක් සම්බන්ධයෙන් ගත් කළ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය විසින් ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා සම්බන්ධයෙන් ඔවුන්ට එල්ල වී ඇති උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීම තහවුරු වීම මත 22(3) සිට 26 දක්වා වන රීති මගින් විස්තර කොට ඇති පරිදි සමාලෝචනය කිරීමෙන් සහ දැනුම් දීමෙන් පසු ඕනෑම අවස්ථාවක සහ 34 සිට 39 දක්වා රීතිවල විස්තර කොට ඇති පරිදි අවසාන විමර්ශනයට පෙරාතුව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඔවුනට තාවකාලික අත්හිටුවීමක් පැනවිය යුතු ය.

30. (1) 28 හෝ 29 වන රීතිවල කරුණු වලට යටත්ව පහත සඳහන් තාවකාලික අත්හිටුවීමක් ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට පැනවිය යුතු ය :-

(අ) තාවකාලික අත්හිටුවීම පැනවීමට ප්‍රථම හෝ කාලීන පදනමක් මත ක්‍රීඩකයාට තාවකාලික විමර්ශනයක් සඳහා අවස්ථාව ලබා දීම ; හෝ

(ආ) තාවකාලික අත්හිටුවීම පැනවීමෙන් ඉක්බිතිව කාලීන පදනමක් මත 34 වන රීතියේ සිට 39 වන රීතිය අනුව කඩිනම් අවසාන විමර්ශනයක් සඳහා ක්‍රීඩකයාට අවස්ථාවක් ලබා දීම.

ඊට අමතරව, 69(5) සිට 75 දක්වා වූ රීති වල දක්වා ඇති පරිදි ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තාට තාවකාලික අත්හිටුවීමට එරෙහිව අභියාචනා කිරීමේ අයිතියක් තිබේ.

(2) තාවකාලික අත්හිටුවීම පදනම් වී ඇති එකී උල්ලංඝණය සම්බන්ධයෙන් බාහිර ද්‍රව්‍යයක් කලවම් වී ඇතැයි යන්න විමර්ෂණ මණ්ඩලයට පැහැදිලි කිරීමට ක්‍රීඩකයාට හැකිවන්නේ නම් තාවකාලික අත්හිටුවීම ඉවත් කළ යුතු ය. බාහිර ද්‍රව්‍යයක් කලවම් වී තිබෙන්නට ඇතැයි යන්න තහවුරු කිරීමට ක්‍රීඩකයා විසින් ඉදිරිපත් කරන කරුණු මත විමර්ෂණ මණ්ඩලය විසින් එකී අනිවාර්ය තාවකාලික තහනම ඉවත් නොකිරීමට තීරණයක් ගනු ලැබුයේ නම් ඊට එරෙහිව අභියාචනා කළ නොහැකි වේ.

(3) ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා පහත දැක්වෙන කරුණු තහවුරු නොකරන්නේ නම් මිස තාවකාලික අත්හිටුවීම හෝ ඉවත් කිරීම නොකළ යුතු යː-

(අ) උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීමක් සිදු වී ඇතැයි යන නිගමනය පිළිගැනීමට සාධාරණ සම්භාවිතාවක් නොමැති බව ;

(ආ) උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීම සිදුව ඇතැයි කෙරෙන නිගමනය සම්බන්ධයෙන් ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් වැරැද්දක් හෝ නොසැලකිල්ලක් සිදු නොවූ බවට නොබිඳිය හැකි තර්කයක් ඇති බවට හා එහෙයින් එබඳු උත්තේජක මර්දන රීති කඩ කිරීමක් සම්බන්ධයෙන් වෙනත් යම් අයුරකින් ලබන ඕනෑම අයෝග්‍යතා කාලපරිච්ඡේදයක් 46 වන රීතිය අදාළ කර ගැනීම නිසරණය වන බව ; හෝ

(ඇ) 34 වන රීතියේ සිට 39 වන රීතිය දක්වා වූ රීති අනුව අවසාන විමර්ෂණයට පෙරාතුව තාවකාලික අත්හිටුවීමක් පැනවීමේ දී සියලු තත්ත්වයන් යටතේ පැහැදිලිවම අසාධාරණ බව ප්‍රකට වන සාධක ඇති බවට ඇති හේතු ඇති බව.

(4) තාවකාලික අත්හිටුවීමක් 'A' නියැදිය සම්බන්ධයෙන් වන අහිතකර විශ්ලේෂණ තීරණයක් පදනම් කරගෙන සිදු කරන ලද විටක ඉන් ඉක්බිතිව වූ "B" නියැදිය විශ්ලේෂණයකින් පසුව එය තහවුරු නොවන කල්හි 4 වන රීතිය උල්ලංඝණය කළ බවට තවදුරටත් තාවකාලික අත්හිටුවීමකට ක්‍රීඩකයා යටත් නොකළ යුතු ය. තව ද, 4 වන රීතිය උල්ලංඝණය කිරීමක් පදනම් කර ගෙන ක්‍රීඩකයා හෝ ක්‍රීඩකයාගේ කණ්ඩායම තරගයකින් ඉවත් කර ඇති තැන් හි සහ ඉන් ඉක්බිතිව කෙරෙන 'B' නියැදි විශ්ලේෂණය මගින් 'A' නියැදි විශ්ලේෂණය තහවුරු නොවන තැන්හි දී තරගයට බාධාවක් නොවන පරිදි ක්‍රීඩකයා හෝ ක්‍රීඩකයාගේ කණ්ඩායම එම තරගයේ අනෙක් ඉසව් සඳහා සහභාගී විය යුතු ය. ඊට අමතරව ක්‍රීඩකයා හෝ ක්‍රීඩකයාගේ කණ්ඩායම ඊට පසුව අනෙකුත් තරග සඳහා ද සහභාගී විය හැකි ය.

(5) ක්‍රීඩකයෙක් හෝ අනෙක් තැනැත්තාට උත්තේජක මර්දන රීතිය උල්ලංඝණය කිරීමක් පිළිබඳව දැනුම් දී තිබෙන, එහෙත් තාවකාලික අත්හිටුවීමක් පනවා නොමැති සියලු අවස්ථාවන් සම්බන්ධයෙන් එකී කාරණය පිළිබඳව තීරණයක් ලැබෙන්නට තිබිය දී ස්වේච්ඡාවෙන් එකී තාවකාලික අත්හිටුවීම පිළිගැනීමට අවස්ථාව ලබා දිය යුතු ය.

**විමර්ෂණයක් නොමැතිව තීරණ ගැනීම.**

31. (1) ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තා අතින් උත්තේජක මර්දන රීති කඩකිරීමක් ඕනෑම අවස්ථාවක දී සිදුවන්නට ඇති බව පිළිගැනීම මත විමර්ෂණයක් ප්‍රතික්ෂේප කිරීම කළ හැකි අතර ශ්‍රී ලංකා තහනම් උත්තේජක නියෝජ්‍යායතනය විසින් උත්තේජක මර්දන රීති මඟින් නියම කොට දක්වා ඇති දඬුවම් මෙකී උත්තේජක මර්දන රීති යටතේ වූ දඬුවම් සම්බන්ධයෙන් වූ අභිමතානුසාරී බලතල පවතින අවස්ථාවන්හි දී ද පිළිගත හැකි ය.

(2) මීට විකල්පමය වශයෙන් උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීමක් පිළිබඳ චෝදනා ලැබූ ක්‍රීඩකයන් හෝ අනෙක් තැනැත්තා විසින් නිශ්චිත වශයෙන් උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීමක් සිදු කොට ඇති බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් දැන්වීමක් කරනු ලැබූ කල්හි එහි නියම කොට දක්වා ඇති අවසන් දිනයට කලින් වාද කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු හෝ ඇය විසින් එකී තහනම් රීති උල්ලංඝනය කළ බව පිළිගැනෙන අතර විමර්ෂණය ප්‍රතික්ෂේප කරනු ලැබූවකු සේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ඉදිරිපත් කොට ඇති උත්තේජක මර්දන රීති යටතේ දඬුවම් පිළිබඳ අභිමතානුසාරී බලතල පිළිගත යුතු ය.

(3) 31(1) හෝ 31(2) වන රීති අදාළ වන අවස්ථාවල දී, විමර්ෂණ මණ්ඩලයක් ඉදිරියේ පවත්වනු ලබන විමර්ෂණයක් අවශ්‍ය නොවේ. ඒ වෙනුවට උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීම තහවුරු කරමින් හා එහි ප්‍රතිඵලයක් වශයෙන් පනවනු ලබන දඬුවම සඳහන් කරමින් ලිඛිත තීරණය සහ අයෝග්‍යතා කාල සීමාවක් හා එයට හේත සපුරා සඳහන් කරමින් දැන්වීමක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායනය විසින් නිකුත් කළ යුතු ය. අනෙකුත් උත්තේජක මර්දන සංවිධාන වලට ද එම තීරණයේ පිටපත් 75 වන රීතිය යටතේ අභියාචනා කිරීමේ අයිතිය ද සහිතව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් යැවිය යුතු අතර, 82(2) වන රීතිය ප්‍රකාරව එම තීරණය ප්‍රසිද්ධියේ හෙළිදරව් කළ යුතු ය.

**ප්‍රතිඵල කළමණාකරණ තීරණ දැනුම් දීම.**

32. උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීම, තහවුරු කිරීම, උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීම තහවුරු කිරීම් ඉවත් කිරීම, තාවකාලික අත්හිටුවීම් පැනවීම හෝ විමර්ෂණයක් නොමැතිව දඬුවම් පැමිණවීම පිළිබඳ ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා සමඟ එකඟතාවයකට පැමිණීම් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සිදුකොට ඇති අවස්ථාවන්හි දී 81(1) වන රීතිය යටතේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සෙසු උත්තේජක මර්දන සංවිධානය වෙත ඒ පිළිබඳව 75 වන රීතිය යටතේ අභියාචනා කිරීමේ අයිතිය සහිතව දැන්වීමක් කළ යුතු ය.

**ක්‍රීඩාවෙන් විශ්‍රාම ගැනීම.**

33. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රතිඵල කළමනාකරණ ක්‍රියාවලියක නිරත වෙමින් සිටින අවස්ථාවක ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා ක්‍රීඩාවෙන් විශ්‍රාම ගනී නම් එකී ක්‍රියාවලිය නිම කිරීම සඳහා තම අධිකරණ බලය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය තමන් වෙත රඳවා ගත යුතු ය. කිසියම් අහිතකර කළමනාකරණ ක්‍රියාවලියක් ආරම්භ කර තිබීමට ප්‍රථම ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විශ්‍රාම ගනී නම් හා ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් උත්තේජක මර්දන රීති කඩකිරීම සිදු කරන අවස්ථාවේ දී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත ප්‍රතිඵල කළමනාකරණය පිණිස පැවරෙන්නට තිබූ ප්‍රතිඵල කළමණාකරණ අධිකාරී බලයක් වේ නම්, එබඳු තැන්හි දී එකී උත්තේජක මර්දන රීති කඩකිරීම සම්බන්ධයෙන් ප්‍රතිඵල කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දක නියෝජ්‍යායතනයට අධිකාරී බලතල තිබිය යුතු ය.

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රතිඵල කළමනාකරණයෙන් පසුව සිදු කෙරෙන විමර්ෂණ.**

34. (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ විධායකය විසින් විමර්ෂණ සාධාරණ හා අපක්ෂපාතීව සිදු කිරීම පිණිස නීති ක්ෂේත්‍රයේ වසර පහකට නොඅඩු කාලයක් නිරතව සිටි එක් සභාපතිවරයෙක් සහ උපසභාපතිවරුන් දෙදෙනෙකු සහ ඊට අමතර වශයෙන් ක්‍රීඩා පරිපාලකයෙක් හෝ ක්‍රීඩකයෙක් වශයෙන් කටයුතු කරන ලද සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත් කළ යුතු ය. මණ්ඩලයේ එක් එක් සාමාජිකයෙක් අවුරුදු හතරක කාලයක් සේවය කළ යුතු ය. මණ්ඩලයේ සාමාජිකයෙක් මිය ගිය හොත් හෝ ඉල්ලා අස්වූව හොත් එයින් ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ විධායක විසින් වෙන යම් පුද්ගලයකු ඊට පත් කළ යුතු ය. එසේ පත්වන තැනැත්තා ඔහුට කලින් එම තනතුරේ සිටි තැනැත්තාගේ ඉතිරි නිල කාලය සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(2) උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීමක් තහවුරු කරමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ක්‍රීඩකයකුට හෝ අනෙක් තැනැත්තාට නිවේදනයක් යවන්නේ නම් සහ ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා 31(1) වන හෝ 31(2) රීති අනුව විමර්ෂණය ප්‍රතික්ෂේප නොකරන්නේ නම් එම කාරණය විමර්ෂණය කොට තීන්දු කිරීම සඳහා උත්තේජක විමර්ෂණ මණ්ඩලයට යොමු කළ යුතු ය. එබඳු යොමු කිරීමක දී උත්තේජක විමර්ෂණ මණ්ඩලයේ සභාපති විසින් එම කාර්යය විභාග කොට තීන්දු කිරීම පිණිස මණ්ඩලයේ එක් සාමාජිකයකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඒ සඳහා පත් කළ යුතු ය. එකී පත් කරන ලද සාමාජිකයන් එම නඩුවට

පෙරාතුව සම්බන්ධතාවයක් ඇති තැනැත්තන් නොවිය යුතු ය. පාර්ශවයන්ගෙන් ඕනෑම පාර්ශවයක අපක්ෂාතීත්වයට බලපෑමක් ඇතිවිය හැකි ඕනෑම තත්ත්වයක් වේ නම් ඒ පිළිබඳ ඔවුන් පත්වීම ලබන අවස්ථාවේ දී සභාපතිවරයාට දැන්විය යුතු ය.

**සාධාරණ විමර්ෂණයක් සඳහා වූ මූලධර්ම**

35. (1) සාධාරණ කාලයක් තුළ විමර්ෂණය සඳහා දින නියම කොට විමර්ෂණය නිමාවට පත් කළ යුතු ය. උත්තේජක මර්දන රීතිවලට යටත් වන තරඟ ඉසව් සම්බන්ධයෙන් වන විමර්ෂණ සම්බන්ධයෙන් ගත් කළ විමර්ෂණ මණ්ඩලය එයින් අවසර දෙනු ලබන තැන්හි දී කඩිනම් ක්‍රියාවලියක් තුළින් විමර්ෂණ පැවැත්විය යුතු ය.

(2) උත්තේජන මර්දන විමර්ෂණ මණ්ඩලය විමර්ෂණ කටයුතු සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය තීරණය කළ යුතු ය.

(3) ශ්‍රී ලංකා උත්තේජන මර්දන නියෝජ්‍යායතනය ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තාගේ ජාතික සම්මේලනය නිරීක්ෂකයින් ලෙස විමර්ෂණයට සහභාගී විය යුතු ය. කෙසේවුවත් තවමත් තීරණ නොගෙන ඇති නඩු සහ සියලු විමර්ෂණවල ප්‍රතිඵල පිළිබඳ ශ්‍රී ලංකා උත්තේජක මර්දන ආයතනය විසින් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය දැනුවත් කරනු ලැබිය යුතු ය.

(4) උත්තේජක විමර්ෂණ මණ්ඩලය විසින් සැමවිටම, සියලු පාර්ශව සම්බන්ධයෙන් සාධාරණ හා අපක්ෂපාතී පිළිවෙතක් අනුගමනය කළ යුතු ය.

**උත්තේජක විමර්ෂණ මණ්ඩලයේ තීරණ.**

36. විමර්ෂණය අවසන් කිරීමෙන් පසුව හෝ ඉන් ඉක්බිතිව කාලීන පදනමක් මත උත්තේජක විමර්ෂණ මණ්ඩලය විසින් තම තීරණයට හේතු සම්පූර්ණයෙන් සඳහන් කරමින් පැනවූ අයෝග්‍යතා කාලසීමාව ලිඛිතව සඳහන් කරමින් දිනය හා අත්සන් සහිතව ඒකමතික හෝ බහුතරයකගේ තීරණයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

37. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම තීරණය ක්‍රීඩකයාට හෝ අනෙත් තැනැත්තාට, ඔහුගේ ජාතික සම්මේලනයට සහ උත්තේජක මර්දන සංවිධානවලට 75 වන රීතිය යටතේ අභියාචනා කිරීමේ අයිතිය ද සඳහන් කරමින් දැන්විය යුතු ය.

38. 69 සිට 79 දක්වා වූ රීතිවල දැක්වෙන විධිවිධාන යටතේ එම තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් නොකරනු ලබන්නේ නම් හා එය උත්තේජක මර්ධන රීතියක් උල්ලංඝණය කරනු ලැබූ බවට වූ තීරණයක් නම්, 82(2) වන රීතිය යටතේ එය ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කළ යුතු ය.

කෙසේ වුව ද, එය උත්තේජක මර්දන රීතියක් උල්ලංඝණය නොකරනු ලැබූ බවට වූ තීරණයක් වේ නම් එකී තීරණයට පාදක වූ ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තාගේ කැමැත්ත පරිදි පමණක් එකී තීරණය ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කළ යුතු ය. එබඳු කැමැත්තක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සාධාරණ ප්‍රයත්නයක් දැරිය යුතු අතර, එසේ කැමැත්ත ලබා ගැනීමෙන් පසු එකී තීරණය සමස්ත වශයෙන් ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් උචිත යැයි අනුමත කරන ලද ආකාරයට ප්‍රසිද්ධියට පත් කළ යුතු ය. බාලවයස්කරුවකු සම්බන්ධයෙන් නම්, 84 වන රීතියේ සඳහන් මූලධර්ම අදාළ කරගත යුතු ය.

**ක්‍රීඩා බේරුම්කරණය අධිකරණයේ විභාගවන කේවල විමර්ෂණ**

39. ක්‍රීඩා බේරුම්කරණය අධිකරණය ඉදිරියේ විභාග වන කේවල විමර්ෂණ ජාත්‍යන්තර මට්ටමේ හෝ ජාතික මට්ටමේ ක්‍රීඩකයන්ට එරෙහි උත්තේජක මර්දන රීති උල්ලංඝණය කිරීමේ නඩු පිළිබඳ පූර්ව විමර්ශනයක් කිරීමේ අවශ්‍යතාවයකින් තොරව සෘජුවම ක්‍රීඩා බේරුම්කරණය අධිකරණය හරහා ක්‍රීඩකයාගේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සහ පළමුවර විමර්ෂනයක තීන්දුවට එරෙහිව අභියාචනය කිරීමේ අයිතිය ඇති වෙනත් උත්තේජක මර්දන සංවිධානවල කැමැත්ත ඇතිව සිදු කළ යුතු ය.

**කේවල ප්‍රතිඵල ස්වයංක්‍රීයව නුසුදුසු බවට පත්වීම.**

40. කේවල තරඟයක් තුළ උත්තේජක මර්දන රීතින් උල්ලංඝණය කිරීමක් වේ නම් එම තරඟයේ ප්‍රතිඵලයක් ලෙස ලබාගන්නා පදක්කම්, ලකුණු හා ත්‍යාග ඇතුළු සියලු දෑ ක්‍රීඩකයාට අහිමි වේ.

**උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදුවන තරඟ අවස්ථාවක දී ප්‍රතිඵල නුදුසුදුභාවයට පත්වීම**

41. කිසියම් තරඟයක් තුළ දී හෝ තරඟයක් සම්බන්ධයෙන් සිදුවන උත්තේජක මර්දන රීතීන් උල්ලංඝනයක දී 43 වන රීතියේ විධිවිධාන හැර එම තරඟයේ පාලක මණ්ඩලයේ තීරණය අනුව ක්‍රීඩකයා විසින් එම තරඟයේ දී තනිව ලබාගත් ප්‍රතිඵලවල සියලු පදක්කම් ලකුණු හා ත්‍යාග නුසුදුසුභාවයට පත්වේ.

42. කිසියම් තරඟයක සෙසු පත්‍රඑල නුසුදුසුභාවයට පත් කරන්නේ ද නැද්ද යන වග සලකා බැලීමේ දී ක්‍රීඩකයා විසින් සිදුකරන ලද උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමේ බරපතලකම සහ එම ක්‍රීඩකයා අනෙකුත් තරඟ සම්බන්ධයෙන් තහනම් උත්තේජක ගත් බවට තහවුරු නොවීම යන කරුණු ද ඇතුළත් විය යුතු ය.

43. උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය වීම තමා විසින් සිදු කරන ලද වරදක් හෝ නොසැලකිල්ලක් නිසා නොවන බව තහවුරු කිරීමට ක්‍රීඩකයා සමත් වේ නම් සහ තහනම් උත්තේජක රීතිය උල්ලංඝනය සිදු වූ තරඟය හැර අනෙකුත් තරඟවල දී ක්‍රීඩකයා විසින් ලැබූ ප්‍රතිඵල කෙරෙහි බලපෑමක් ඇත්වන්නට ඉඩ ඇත්තේ නම් එම තරඟවල දී ක්‍රීඩකයා වෙත වෙනම ලද ප්‍රතිඵල නුදුසුදුභාවයට පත් නොකළ යුතු ය.

**ඉදිරිපත් වීමට සුදුසුකම් නොලැබීම තහනම් ද්‍රව්‍යයක් හෝ ක්‍රමයක් භාවිතා කිරීමට තැත් කිරීම හෝ සන්තකයේ තබා ගැනීම**

44. 46, 47 වන රීති සහ 48 සිට 52 දක්වා වූ රීති ප්‍රකාරව කෙරෙන අඩුකිරීම්වලට හෝ අත්හිටුවීම්වලට යටත්ව 4(අ), (ආ), රීති, 31(ඇ) හෝ 4(උ) (i) (ii) වන රීති උල්ලංඝනය කිරීම වෙනුවෙන් පනවනු ලබන අයෝග්‍යතා කාල සීමාවන් පහත පරිදි වේ - :

(අ) අයෝග්‍යතා කාල සීමාව පහත සඳහන් අවස්ථාවල දී අවුරුදු හතරක් විය යුතු ය.:-

(i) උත්තේජක මර්දන රීතිය උල්ලංඝනය කිරීම ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් හිතාමතාම කරන ලද්දක් නොවන බව ඔප්පු නොකිරීම හා උත්තේජක මර්ධන රීති උල්ලංඝනය කිරීමට නිශ්චිතව සඳහන් කරන ලද ද්‍රව්‍යයක් සම්බන්ධව නොවීම.

(ii) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමට නිශ්චිතව සඳහන් කරන ලද ද්‍රව්‍යයක් සම්බන්ධ වීම සහ එකී උත්තේජක මර්දන රීති හිතාමතාම උල්ලංඝනය කරන ලද බව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඔප්පු කළ හැකි වීම.

(ආ) 44(අ) සහ (ආ) වන රීති අදාළ නොවන්නේ නම් සුදුසුකම් නොලබන කාල සීමාව අවුරුදු දෙකක් විය යුතු ය.

(ඇ) 44 සහ 45 වන රීතිවල කාර්යය සඳහා "චේතනාන්විත" යන යෙදුම යොදා ගැනීමේ අභිප්‍රාය වන්නේ ක්‍රීඩකයකු හෝ වෙනත් තැනැත්තකු උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමේ ක්‍රියාවක නිරත වූ බව හෝ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමේ ක්‍රියාව කැපී පෙනෙන තරමේ අවධානමකින් යුක්ත වූ බව පැහැදිලිව දැන දැනම එම ක්‍රියාවෙහි නිරත වූ බව දැක්වීමය. උත්තේජක ද්‍රව්‍ය නිශ්චිතව දක්වන ලද ද්‍රව්‍යයක් බවත් තහනම් ද්‍රව්‍ය තරඟයෙන් පිටත දී භාවිතා කරන ලද බවත් ක්‍රීඩකයා විසින් ඔප්පු කරනු ලැබිය හැකි වේ නම් තරඟයක් තුළ දී පමණක් භාවිතා කළ උත්තේජක මර්දන ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් වූ අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් තුළින් ප්‍රකාශ වන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් චේතනාන්විතව සිදු කරන ලදැයි යන තර්කය බිඳ වැටේ. තව ද උත්තේජක ද්‍රව්‍ය නිශ්චිතව දක්වන ලද ද්‍රව්‍යයක් නොවන බවත් තහනම් ද්‍රව්‍ය ක්‍රීඩා කාර්යසාධකයට සම්බන්ධයක් නැති තත්ත්වයක් තුළ තරඟයෙන් පිටත දී භාවිතා කරන ලද බවත් ක්‍රීඩකයා විසින් ඔප්පු කරනු ලැබිය හැකි වේ නම් තරඟයක් තුළ දී පමණක් භාවිතා කිරීම තහනම් ද්‍රව්‍යක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද අහිතකර විශ්ලේෂණාත්මක තීරණයක් තුළින් ප්‍රකාශ වන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් චේතනාන්විතව සිදුකරන ලදැයි නොසැලකිය යුතු ය.

**අනෙකුත් තහනම් උත්තේජක රීති උල්ලංඝනය කිරීම සඳහා ඇති අයෝග්‍යතාවය**

45. 44 වන රීතිය මඟින් සලසා ඇති විධිවිධාන හැර, 47 වන රීතිය හෝ 48 වන රීතියේ සිට 52 වන රීතිය දක්වා වූ රීති අදාළ වන්නේ නම් මිස, උත්තේජක මර්දන රීති කඩකිරීම් සඳහා වූ අයෝග්‍යතා කාලසීමාවන් පහත පරිදි වේ. -:

(අ) 4(ඇ) හෝ 4(ඊ) රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වසර හතරක අයෝග්‍යතා කාලසීමාවක් පැනවිය යුතු අතර, නියැදි රැස්කිරීම සඳහා ඉදිරිපත් කිරීමට 44(ඇ) රීතිය මඟින් අර්ථ දක්වා ඇති පරිදි අසමත් වූයේ චේතනාන්විතව නොවන බව ඔප්පු කිරීමට ක්‍රීඩකයා අසමත් වූයේ නම් අයෝග්‍යතා කාලසීමාව වසර දෙකක් විය යුතු ය.

(ආ) 4(ඉ) වන රීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අයෝග්‍යතා කාලසීමාව වසර දෙකක් වන නමුත් ක්‍රීඩකයා විසින් කරන ලද වරදේ තරම ගැන සලකා බැලීම මත එය අවුරුදු එකක් දක්වා අඩුකිරීමකට යටත් වේ. කෙසේ නමුත් මෙම වගන්තියේ දක්වා ඇති වසර දෙක එක් වසරක් යනුවෙන් එකී අයෝග්‍යතාවය ලිහිල් කිරීමේ නම්‍යතාවය, අවසන් මොහොතේ ක්‍රීඩකයාගේ වතගොත තොරතුරු වෙනස් වීමේ රටාව හෝ ක්‍රීඩකයින් පරීක්ෂාවක් සඳහා ඉදිරිපත් වීම මඟහැර යාම වැනි දැඩි සැකයට තුඩු දෙන අවස්ථාවන් හි දී ඔවුන්ට නොලැබේ.

(ඇ) 4(ඉ) සහ 4(එ) වන රීති උල්ලංඝනය සඳහා වූ අයෝග්‍යතා කාලසීමාව, උල්ලංඝනය කිරීමේ බරපතලකම අනුව අවම වශයෙන් වසර හතරේ සිට ජීවිත කාලය දක්වා විය යුතු ය. 4(ඉ) සහ 4(එ) යන රීති යටතේ බාලවයස්කරුවකු සම්බන්ධ වන යම් උල්ලංඝනය කිරීමක්, බරපතල උල්ලංඝනය කිරීමක් ලෙසින් සලකනු ලැබිය යුතු අතර නිශ්චිතව සඳහන් කරන ලද ද්‍රව්‍යයක් සඳහා හරුණු කොට ක්‍රීඩා සහායක තැනැත්තෙකු විසින් සිදු කරනු ලැබූ උල්ලංඝනය කිරීමක් සඳහා නම් ජීවිත කාලය දක්වා වූ අයෝග්‍යතාවයක් ඇති වන්නේ ය. තව ද, ක්‍රීඩා සම්බන්ධයෙන් නොවන්නා වූ, නීති සහ නියෝග ද උල්ලංඝනය විය හැකි 4(ඉ) හෝ 4(එ) යන රීතිවල සැලකිය යුතු උල්ලංඝනය කිරීම්, සුදුසු පරිපාලනමය, වෘත්තීමය හෝ අධිකරණමය බලධරයන් වෙත වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(ඈ) 4(උ) රීතිය උල්ලංඝනය කිරීම සඳහා පනවනු ලබන අයෝග්‍යතා කාල සීමාව, උල්ලංඝනය කිරීමේ බරපතලකම මත පදනම්ව අවුරුදු දෙකකට නොඅඩු විය යුතු අතර, අවුරුදු හතරකට නොවැඩි විය යුතු ය.

(ඉ) 4(ඔ) රීතිය උල්ලංඝනය කිරීම සඳහා, ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තාගේ වරදේ ප්‍රමාණය සහ වෙනත් අවස්ථානුගත කරුණු මත පදනම් වෙමින් අයෝග්‍යතා කාල සීමාව අවම වශයෙන් එක් අවුරුද්දකට අඩු කිරීමකට යටත් ව, අවුරුදු දෙකක් විය යුතු ය.

**වරදක් හෝ නොසැලකිලිමත් බවක් සිදුවී නොමැති තැන්හි දී අයෝග්‍යතාව ඉවත් කිරීම**

46. කේවල විෂයක් සම්බන්ධයෙන් කිසියම් ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තා විසින් තමන් විසින් වරදක් හෝ නොසැලකිල්ලක් සිදුකරනු ලැබුවේ නැතැයි ඔප්පුකරන්නේ නම් අදාළ අයෝග්‍යතා කාලසීමාව යම් ආකාරයකින් ඉවත් කළ යුතු ය.

**කැපී පෙනෙන වරදක් නොසැලකිල්ලක් සිදු නොවූයේය යන පදනම මත අයෝග්‍යතා කාලසීමාව අඩුකිරීම**

47. (1) 3(1), 3(1) එ හෝ 3(ඉ) යන රීති උල්ලංඝනය කිරීමේ දී නිශ්චිත ද්‍රව්‍ය හෝ දූෂ්‍ය වූ ද්‍රව්‍ය විෂයන් සම්බන්ධයෙන් පනවනු ලබන දඬුවම් අඩු කිරීම පහත පරිදි විය යුතු ය:-

(අ) නිශ්චිතව දක්වා ඇති ද්‍රව්‍ය උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමකට සම්බන්ධ වී ඇති සිද්ධියක දී එය කැපී පෙනෙන වැරැද්දක් හෝ නොසැලකිලිමත් වීමකින් සිදු නොවූවක් බව ක්‍රීඩකයා විසින් තහවුරු කරනු හැකි වේ නම් ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තාගේ වරදේ බරපතලකම සලකා උපරිම වශයෙන් අවුරුදු දෙකක් පැනවිය යුතු අතර ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තා විසින් කරන ලද වරදේ බරපතලකම මත උපරිම වශයෙන් අවුරුදු දෙකක අයෝග්‍යතා කාලසීමාවක් පැනවිය යුතු වේ.

(ආ) දූෂ්‍ය වූ විෂයන් පරීක්ෂාවට භාජනය කරන ලද තහනම් ද්‍රව්‍යයට දූෂ්‍ය වූ ද්‍රව්‍යයක් මුසු වී ඇති බව ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් තහවුරු කරනු ලැබිය හැකි නම් සහ තමන් විසින් කරන ලද කැපී පෙනන වරදකින් හෝ නොසැලකිලිමත් වීමකින් එය සිදු නොවූ බව තහවුරු කළ හැකි නම් අයෝග්‍යතාව පැනවීමේ දී ඊට අවම කාලසීමාවක්, තරවටු කිරීමක් සහ කිසිඳු අයෝග්‍යතා කාලයක් නියම නොකිරීම යනාදී පියවර ගත හැකි අතර ක්‍රීඩකයාගේ හා අනෙක් තැනැත්තාගේ වරදේ බරපතලකම මත එය උපරිම වශයෙන් අවුරුදු දෙකක් විය යුතු ය.

(2) 47 (1) රීතිය අදාළ නොවන තනි සිද්ධියක් සම්බන්ධයෙන් ගත් කළ කැපී පෙනෙන වරදක් හෝ නොසැලකිලිමත් වීමක් තමන් අතින් සිදුවී නැති බව ක්‍රීඩකයා විසින් ඔප්පු කරනු ලැබිය හැකි නම් 42 සිට 52 දක්වා වගන්තිවල ඇති "තවදුරටක් අඩු කිරීම හෝ අහෝසි කිරීම" විධිවිධාන ප්‍රකාරව ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් සිදුකරන ලද වරදේ තරම පදනම් කරගෙන වෙනත් යම් අයෝග්‍යතා කාලසීමාවක් අඩු කළ යුතු ය. එසේ අඩු කරනු ලබන කාලය වෙනත් යම් ආකාරයකින් අදාළ කරගන්නේ නම් අයෝග්‍යතා කාලසීමාවෙන් භාගයකට වඩා අඩු නොවිය යුතු ය. වෙනත් යම් ආකාරයකින් අදාළ කරගනු ලබන කාලය ජීවිත කාලය සඳහාම වේ නම් මෙම වගන්තිය යටතේ අඩුකරනු ලබන කාලය අවුරුදු 8 කට වඩා අඩුවිය යුතු ය.

48. (1) 69 වන රීතියේ සිට 79 වන රීතිය යටතේ වූ අවසාන අභියාචනා තීන්දුවට පෙරාතුව හෝ අභියාචනා කිරීමට ඇති කාලය ඉකුත් වීමේ දී ප්‍රතිඵල කළමණාකරණය කිරීමේ අධිකාරී බලය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත පැවරී ඇති කේවල සිද්ධියක් සම්බන්ධයෙන් ගත්කළ ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් උත්තේජක මර්දන සංවිධානයකට, අපරාධ අධිකාරියකට හෝ වෘත්තීය විනය ආයතනයකට පහත සඳහන් කාර්යන් හි දී සහාය දී ඇති විටෙක කේවල සිද්ධයක් සම්බන්ධයෙන් පනවා ඇති "අයෝග්‍යතා" කාල සීමාවෙන් කොටසක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අත්හිටුවිය යුතු ය :-

(අ) තවත් පුද්ගලයෙකු විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් උත්තේජක මර්දන සංවිධානයක් විසින් සොයාගැනීම හෝ ඉදිරිපත් කිරීම; හෝ

(ආ) අපරාධ හෝ විනය ආයතනයක් විසින් තවත් පුද්ගලයෙක් විසින් කරන ලද සාපරාධී විෂමාචාරයක් හෝ වෘත්තීය නීතිරීති කඩ කිරීමක් සොයා ගැනීම හෝ ඉදිරිපත් කිරීමට සැලකිය යුතු සහායක් දෙනු ලබන තැනැත්තා විසින් සපයනු ලබන තොරතුරු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ලැබීමට සැලැස්විය යුතු ය. 69 වැනි රීතියේ සිට 79 වන රීතිය යටතේ අවසාන අභියාචනා තීන්දුවක් හෝ අභියාචනා කිරීමට ඇති කාලය ඉකුත් වීමෙන් පසුව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සහ අදාළ ජාත්‍යන්තර සම්මේලනයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව පමණක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් වෙනත් අයුරකින් අදාළ කරගන්නා වූ අයෝග්‍යතා කාල සීමාවේ කොටසක් අත්හිටුවිය යුතු ය. අයෝග්‍යතා කාල සීමාව එකී ආකාරයෙන් අත්හිටුවීම කොතරම් ප්‍රමාණයකට සිදුකළ යුතු ද යන්නට පදනම් කරගත යුත්තේ ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් උත්තේජක මර්දන රීතියක් කොතරම් ප්‍රමාණයකට උල්ලංඝනය කළේ ද යන වගත් ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතා කිරීම මුලිනුපුටා දැමීමේ ප්‍රයත්නයේ දී ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් දෙන ලද සහායේ වැදගත්කමත් අනුවය. එකී ආකාරයෙන් අදාළ කරගන්නා වූ අයෝග්‍යතා කාලසීමාවෙන් කරනු ලබන අඩුකිරීම් හතරෙන් තුනකට වඩා නොවිය යුතු ය. එකී අයුරින් පනවනු ලබන අදාළ අයෝග්‍යතා කාලසීමාව ජීවිත කාලය සඳහා වූවක් නම් මෙම වගන්තිය යටතේ අත්හිටුවනු නොලැබූ කාලසීමාව අවුරුදු අටකට නොඅඩු කාලයක් විය යුතු ය. සහයෝගයෙන් කටයුතු කිරීම, සම්පූර්ණ වූ ද විශ්වාසදායක වූ හා සැලකිය යුතු සහායක් දැක්වීමට අනෙක් තැනැත්තා අපොහොසත් වන්නේ නම්, මුලින් පනවන ලද අයෝග්‍යතා කාලසීමාව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නැවත ප්‍රතිස්ථාපනය කළ යුතු ය. අත්හිටුවන ලද අයෝග්‍යතා කාලය ප්‍රතිස්ථාපනය කිරීමට හෝ අත්හිටුවන ලද "අයෝග්‍යතා කාලය" ප්‍රතිස්ථාපනය නොකිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය තීරණය කරන්නේ නම් 69 වන රීතියේ සිට 79 වන රීතිය යටතේ අභියාචනා කිරීමට හිමිකම් ඇති පුද්ගලයකු විසින් එම තීරණයට විරුද්ධව අභියාචනා කළ හැකි ය.

(2) උත්තේජක සංවිධානවලට හරවත් සහායක් සැලසීම සඳහා ක්‍රීඩකයින් හා අනෙකුත් තැනැත්තන් තවදුරටත් උනන්දු කරවීම සඳහා, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කොට ඇතැයි තහවුරු වී ඇති ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තාගේ ඉල්ලීම පරිදි ලෝක උත්තේජක මර්දන ආයතනය, ප්‍රතිඵල කළමණාකරණ ක්‍රියාවලියේ කිනම් අවස්ථාවක දී වුව ද 69 වන රීතියේ සිට 79 වන රීතිය යටතේ වූ අවසාන අභියාචනා තීන්දුවක් ඇතුළුව වෙනත් යම් ආකාරයකින් අදාළ කරගත හැකි අයෝග්‍යතා කාල සීමාවන් සහ අනෙකුත් දඬුවම් අත්හිටුවීමකට එකඟ විය යුතු ය. විශේෂිත තත්ත්වයක් යටතේ මෙම වගන්තිය තුළ හරවත් සහාය සැලසීම වෙනුවෙන් වෙනත් යම් අයුරකින් සලසා ඇති අත්හිටුවීම් ඉක්මවා යන අයෝග්‍යතා කාල සීමාවක් හෝ එසේත් නැතිනම් කිසිදු අයෝග්‍යතා කාල සීමාවක් නොමැති හෝ ත්‍යාග මුදල් දඩ හෝ වියදම් ආපසු නොගෙවීමට පවා තුඩුදෙන අත්හිටුවීම්වලට ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය එකඟ විය හැකි ය. ලෝක උත්තේජක මර්දන ආයතනයේ අනුමැතිය මෙම වගන්තියේ වෙනත් යම් ආකාරයකින් විධිවිධාන සලසා ඇති පරිදි තහනම ප්‍රතිස්ථාපනය කිරීමට යටත් විය යුතු ය. 69 වන රීතියේ සිට 79 වන රීතිය යටතේ ඇති විධිවිධාන නොසලකා මෙම වගන්තිය අනුව ලෝක උත්තේජක මර්දන සංවිධානයක් විසින් අභියාචනා නොකළ යුතු ය.

49. හරවත් සහායක් වෙනුවෙන් වෙනත් යම් ආකාරයකින් අදාළ ඕනෑම කොටසක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අත්හිටුවන්නේ නම් එසේ කිරීමට තුඩුදුන් හේතු සඳහන් නිවේදනයක් 81 වන රීතිය මඟින් දක්වා ඇති පරිදි 75 වන රීතිය යටතේ අභියාචනා කිරීමට ඇති අයිතිය ද සඳහන් කරමින් අනෙකුත් උත්තේජක මර්දන සංවිධානය වෙත යැවිය යුතු ය. අතිවිශේෂ අවස්ථාවන්හි දී තහනම් උත්තේජක විෂයෙහි යහපත තකා "හරවත් සහාය" ගිවිසුම් හෝ හරවත් සහාය සලසනු ලබන ආකාරය පිළිබඳ හෙළිදරව් කිරීම් සීමා කෙරෙන හෝ ප්‍රමාද කිරීමට සුදුසු ආකාරයේ රහස්‍යතා ගිවිසුම්වල එළඹීමට ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත බලය පැවරිය යුතු ය.

**වෙනත් සාක්ෂි නොමැති විට තහනම් උත්තේජක රීතියක් උල්ලංඝනය කළ බව පිළිගැනීම**

50. තහනම් උත්තේජක ගත් බවට නියැදි පරීක්ෂාවකින් තහවුරු වීමෙන් ඉක්බිතිව නිවේදනයක් ලැබීමට පෙරාතුව හෝ 3(1) රීතිය හැර උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක දී 23 වැනි රීතියේ සිට 33 වන රීතිය ප්‍රකාරව උත්තේජක මර්දන රීති කඩකිරීමක් පිළිගත් බවට පළමු නිවේදනය ලැබීමට පෙරාතුව ක්‍රීඩකයෙකු හෝ අනෙක් තැනැත්තා උත්තේජක මර්දන රීති කඩකිරීමක් සිදු කළ බව ස්වේච්ඡාවෙන් පිළිගනී නම් සහ එම පිළිගැනීම උත්තේජක මර්දන රීති උල්ලංඝනය කළ බවට වූ එකම විශ්වාසදායක සාක්ෂිය වේ නම් අයෝග්‍යතා කාලය අඩු කරනු ලැබිය හැකි නමුත් එම කාලය අයෝග්‍යතා කාලසීමාවෙන් භාගයකට වඩා අඩු නොවිය යුතු ය.

**44(අ) හා (ආ) වන රීති හෝ 45(අ) රීතිය යටතේ පැනවිය හැකි දඬුවමක් අභියස උත්තේජක මර්දන රීති කඩකල බව වහා පිළිගැනීම**

51. ක්‍රීඩකයකු විසින් හෝ අනෙක් තැනැත්තා විසින් නියැදි රැස් කිරීමක් මගහැරීමක් හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ නියැදි රැස්කිරීමක දී නුසුදුසු ලෙස නියැදි ගැනීම හේතුකොට ගෙන 44(අ) හා (ආ) වන රීති හෝ 45(අ) රීතිය යටතේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හමුවේ තහවුරු වූ උත්තේජක මර්දන රීති කඩකිරීමක් සම්බන්ධයෙන් වසර හතරක තහනමකට ලක්වන අතර එකී වරදේ බරපතලකම ගැන සහ එකී වරදේ ප්‍රමාණය පදනම් කරගෙන ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යාතනයේ සහ ශ්‍රී ලංකා

උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ අභිමතය සහ අනුමතය මත අයෝග්‍යතා කාලසීමාව අවම වශයෙන් අවුරුදු දෙකක් දක්වා අඩුකිරීමක් කරනු ලැබිය හැකි ය.

**තහනමක් අඩු කිරීම පිණිස බහුවිධ හේතූන් අදාළ කර ගැනීම**

52. 48 සිට 52 වන රීති යටතේ අඩුකිරීමක් හෝ අත්හිටුවීමක් අදාළ කර ගැනීමට ප්‍රථම ක්‍රීඩකයෙක් හෝ අනෙක් තැනැත්තා විසින් 46, 47 හෝ 48 සිට 52 දක්වා රීතිවලට විධිවිධාන එකකට වැඩි ගණනක් යටතේ තහනම අඩුකිරීම සඳහා හිමිකම් ලැබීමට අයිතියක් ඇතැයි තහවුරු කරන්නේ නම් වෙනත් යම් ආකාරයකින් අදාළ කරගන්නා වූ අයෝග්‍යතා කාල සීමාව, 44, 45, 46 සහ 47 රීති යටතේ තීරණය කළ යුතු ය. 48 සිට 52 දක්වා වන රීති යටතේ, අයෝග්‍යතා කාලය අඩු කිරීමට හෝ අත්හිටවනු ලැබීමකට තමන්ට හිමිකම් ඇති බවට ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා තහවුරු කොට ඇත්තේ නම් අයෝග්‍යතා කාලය අඩු කිරීම හෝ අත්හිටුවීම සිදු කළ යුතු අතර එය එකී අදාළ අයෝග්‍යතා කාලයෙන් හතරෙන් එකකට වඩා අඩු නොවිය හැකි ය.

**බහුවිධ උල්ලංඝනය කිරීම**

53. (1) ක්‍රීඩකයෙක් හෝ අනෙක් තැනැත්තා විසින් සිදු කරනු ලබන දෙවැනි උත්තේජක මර්දන රීති කඩකිරීමක දී, පනවනු ලබන අයෝග්‍යතා කාල සීමාව :-

(අ) හය මසකට වැඩි විය යුතු ය;

(ආ) 48 සිට 52 දක්වා වන රීති යටතේ ලබා දී ඇති කිසිඳු අඩුකිරීමක් සැලකිල්ලට නොගෙන පළමුවෙන් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කළ අවස්ථාවේදී පනවන ලද අයෝග්‍යතා කාලසීමාව මෙන් එකහමාරක අයෝග්‍යතා කාලසීමාවකට; හෝ

(ඇ) 48 සිට 52 දක්වා වන රීති යටතේ ප්‍රධානය කරනු ලද කිසිදු අඩු කිරීමක් සැලකිල්ලට නොගෙන, එකී රීති කඩකිරීම පළමු උත්තේජක මර්දන රීති කඩකිරීමක් සේ සලකා, දෙවැනි උත්තේජක මර්දන රීති කඩකිරීම සඳහා වෙනත් යම් අයුරකින් අදාළ කරගන්නා වූ අයෝග්‍යතා කාලය මෙන් දෙගුණයක කාලයක් විය යුතු ය,

ඉහත සඳහන් පරිදි තහවුරු කරන ලද අයෝග්‍යතා කාලය 48 සිට 52 දක්වා රීති අදාළ කර ගැනීමෙන් තවදුරටත් අඩු කළ හැකි ය.

(2) තෙවැනි වරට උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් ගත් කළ 46 හෝ 47 වන රීති යටතේ අයෝග්‍යතා කාලසීමාව ඉවත් කිරීම හෝ අඩුකිරීම සඳහා වූ කොන්දේසි සපුරාලීම මඟින් හෝ 4(ඉ) රීතිය යටතේ වූ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධ වී ඇත්නම් හැර ජීවිත කාලය සඳහාම වූ අයෝග්‍යතාවයක් ඊට අනිවාර්යයෙන්ම නියම වේ. මෙකී විශේෂිත උල්ලංඝනය කිරීම්වලදී අයෝග්‍යතා කාලසීමාව අවුරුදු අටේ සිට ජීවිත කාලය දක්වා වූ කාලසීමාවක් විය යුතු ය.

(3) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් ඊට අදාළ ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා තමන් විසින් කිසිඳු වරදක් හෝ නොසැලකිල්ලක් සිදු නොවූ බව ඔප්පු කොට ඇත්නම් මෙම වගන්තියේ කාර්යයන් සඳහා පෙර අවස්ථාවක ඔහු විසින් සිදු කරන ලද උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් රීති උල්ලංඝනය කිරීමක් ලෙස නොසැලකිය යුතු ය.

**ඇතැම් ශක්‍යමාන බහුවිධ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම්**

54. (1) 44(අ) හා (ආ) හෝ 45(අ) රීති යටතේ බහුවිධ උල්ලංඝනය කිරීම් සඳහා තහනම් පැනවීමේ කාර්යයන් හිදී 22 වන රීතියේ සිට 33 වන රීතිය ප්‍රකාරව ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තාට දැන්වීමක් ලැබීමේ පසුව හෝ පළමු උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම පිළිබඳව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට දැනුම්දීමක් කිරීමට සාධාරණ ප්‍රයත්නයක් දැරීමෙන් පසුව ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් දෙවැනි උත්තේජක මර්දන රීති කඩකිරීම සිදු කළ බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ඔප්පු කරනු ලැබිය හැකි නම් පමණක් උත්තේජක මර්දන රීති දෙවන වරට උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට මෙය තහවුරු කිරීමට අසමත් වේ නම් එකී උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම් සාමූහිකව පළමු එක් උල්ලංඝනය කිරීමක් ලෙස සැලකිය යුතු අතර පනවනු ලබන තහනම පදනම් කර ගත යුත්තේ වඩාත් දැඩි දඬුවම් නියමවන උල්ලංඝනය කිරීමක් ලෙස ය.

(2) උත්තේජක මර්දන රීතියක් කඩකිරීම සම්බන්ධයෙන් පළමු තහනම පැනවීමෙන් පසුව, ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් පළමු උත්තේජක මර්දන රීති කඩකිරීම පිළිබඳව කරන ලද දැනුම්දීමට පෙරාතුව කරන ලද උත්තේජක මර්දන රීති කඩකිරීමක් පිළිබඳව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ට තොරතුරු ලැබී ඇත්නම් එකී උල්ලංඝනය කිරීම් දෙකම සඳහා පනවන්නට

තිබූ තහනම පදනම් කරගෙන අතිරේක තහනමක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් පැනවිය යුතු ය. මුලින් ම සිදුකළ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම දක්වා වූ කාලයට අදාළ සියලු තරගවල ප්‍රතිඵල 55 වන රීතිය පරිදි නුදුසුදු භාවයට පත්වේ.

53 වන රීතියේ සිට 54 වන රීතිවල කාර්යයන් සඳහා, බහුවිධ තහනම් උත්තේජක රීති කඩකිරීම් සලකා බැලීම එකම දස වසරක කාලය තුළ සිදුවිය යුතු ය.

**නියැදි රැස් කිරීමකින් ඉක්බිතිව හෝ උත්තේජක මර්දන රීති කඩකිරීමක් සිදු කිරීමෙන් අනතුරුව තරඟ ප්‍රතිඵල නුදුසුදුභාවයට පත් කිරීම**

55. 40 වන රීතිය තහනම් උත්තේජක නිරීක්ෂණය වූ බව ධනාත්මකව තහවුරු කෙරෙන නියැදියක් අනුව තරඟයක ප්‍රතිඵල ස්වයංක්‍රීයව නුසුදුසු බවට පත් වීමට අමතර වශයෙන් ධනාත්මක නියැදියක් තරඟයක් තුළ හෝ තරඟයකින් පිටත දී රැස්කළ දිනයේ සිට ක්‍රීඩකයා විසින් ලබාගන්නා ලද සෙසු සියලු තරඟවල ප්‍රතිඵල හෝ අනෙකුත් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම් කිසියම් තාවකාලික අත්හිටුවීමක් හෝ අයෝග්‍යතා කාලයක් ආරම්භ වීමත් සමඟ සිදුවේ නම් ඉහත කී තරඟ ප්‍රතිඵල තුළින් ක්‍රීඩකයා ලබාගත් පදක්කම්, ලකුණු හා ත්‍යාග ඇතුළු සියල්ල හා ස්ථාන තුළින් උද්ගතවන සියළු ප්‍රතිලාභ නුසුදුසුභාවයට පත් වේ.

**ක්‍රීඩා බේරුම්කරණ අධිකරණ පිරිවැය ප්‍රධාන හා රාජසන්තක කළ ත්‍යාග මුදල් දීම**

56. ක්‍රීඩා බේරුම්කරණ අධිකරණ පිරිවැය ප්‍රදාන හා රාජසන්තක කළ ත්‍යාග මුදල් නැවත ගෙවීමේ දී ප්‍රමුඛතාව, පළමුව ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය විසින් තීන්දු කරන ලද පිරිවැය ගෙවීම; දෙවනුව, අදාළ ජාත්‍යන්තර සම්මේලනයේ නීතිරීතිවල විධිවිධාන තුළ දැක්වෙන්නේ නම් ඒ අනුව රාජසන්තක කළ ත්‍යාග මුදල් නැවත දීම සහ තෙවනුව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ වියදම් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් දීම කළ යුතු ය.

**මූල්‍ය ප්‍රතිඵල**

57. (1) ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සිදු කිරීමේ දී තම අභිමතානුසාරී බලය හා සමානුපාතික බව පිළිබඳ මූලධර්මයන්ට යටත්ව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් :-

(අ) ක්‍රීඩකයාගෙන් හෝ අනෙක් තැනැත්තාට උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම තුළින් උද්ගත වූ වියදම්, පනවා ඇති අයෝග්‍යතා කාල සීමාව පිළිබඳ ව නොසලකා දඩ මුදලක් අය කර ගත යුතු ය; හෝ

(ආ) උපරිම අයෝග්‍ය කාලසීමාව දැනටමත් පනවා ඇති නම්, ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා මත එ. ජ. ඩොලර් ................ ට නොඅඩු ප්‍රමාණයක දඩ මුදලක් පැනවිය යුතු ය.

(2) මූල්‍ය තහංචි පැනවීම හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන ආයතනය විසින් පිරිවැය අයකරනු ලැබීම. අයෝග්‍යතාව ලඝු කිරීමට හෝ මෙකී උත්තේජක මර්දන රීති හෝ ලෝක තහනම් උත්තේජක නීති සංග්‍රහය යටතේ වෙනත් ලෙසකින් අදාළ කරගත හැකි සෙසු තහංචි පදනමක් ලෙස නොසැලකිය යුතු ය.

**අයෝග්‍යතා කාලසීමාව ආරම්භ වීම**

58. පහත දැක්වෙන හේතු හැරුණුකොට අයෝග්‍යතාව පැන වූ අවසන් විමර්ශන තීන්දුව දුන් දින සිට හෝ විමර්ශනය අත් හැරීමක් හෝ නොපැවැත්වීමක් සිදුවේ නම් අයෝග්‍යතාව පිළිගනු ලබන දින හෝ වෙනත් අයුරකින් පැනවූ දිනය අයෝග්‍යතාව ආරම්භ වන දිනය විය යුතු ය.

**ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට විමර්ෂණ ක්‍රියාවලියේ දී අදාළ නොවන ප්‍රමාදවීම්**

59. ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට අදාළ නොවන තහනම් උත්තේජක විමර්ශන ක්‍රියාවලියේ හෝ සෙසු උත්තේජක පාලන විෂයන් හි සැලකිය යුතු ප්‍රමාදයක් තිබෙන තන්හි දී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් උත්තේජන මර්දන රීති උල්ලංඝනය කිරීමක් අවසන් වරට සිදු වූ දිනය හෝ නියැදි රැස්කළ දිනයට හැකිතාක් පෙර දිනයකින් ආරම්භ වන පරිදි "අයෝග්‍යතා" කාලය ආරම්භ කළ යුතු ය. අයෝග්‍යතා කාල සීමාව තුළ තරඟවලින් ලබාගත් සියලු ප්‍රතිඵල අතීත සබලතාව සහිත අයෝග්‍යතාව ඇතුළුව නුසුදුසු බවට පත් කළ යුතු ය.

**කාලෝචිත පිළිගැනීම**

60. උත්තේජන මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට චෝදනායක් යොමු කරන අවස්ථාවකදී වහාම එම වරද පිළිගනු ලබන තැන්හි දී නියැදි රැස්කළ දිනයට නුදුරු

කාලයේ සිට හෝ තවත් උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් අවසන් වරට සිදු වූ දිනයේ සිට අයෝග්‍යතා කාලය ආරම්භ විය යුතු ය. මේ එක් එක් අවස්ථාවේ දී කෙසේ නමුත්, මෙම වගන්තිය අදාළ කර ගන්නා තැන්හිදී ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් එකී තහනම පනවන ලද දිනය යනාදියෙන් ඔබ්බට ගොස් ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් අඩු ගණනේ අයෝග්‍යතා කාලසීමාවේ භාගයක කාලසීමාවක් තුළ එකී "අයෝග්‍යතාව" ට යටත්ව සිටිය යුතු ය. 51 වන රීතිය යටතේ අයෝග්‍යතා කාලය දැනටමත් අඩු කොට ඇතිවිට මෙම රීතිය අදාළ නොවේ.

### තාවකාලික අත්හිටුවීම හෝ අයෝග්‍යතා කාලය ගත කිරීමේ වාසිය

61. (1) තාවකාලික අත්හිටුවීමක් පනවනු ලැබීමෙන් පසුව ඊට ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් ගරු කරන ලද්දේ නම්, අවසාන වශයෙන් පනවනු ලබන අයෝග්‍යතා කාලසීමාවක් මත පනවනු ලබන තාවකාලික අත්හිටුවීම් සම්බන්ධයෙන් ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට එහි වාසිය ලැබිය යුතු ය. පසුව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ තීරණයක් අනුව අයෝග්‍යතා කාල සීමාවකට යටත්ව සිටින ක්‍රීඩකයෙක් හෝ අනෙක් තැනැත්තෙක් සම්බන්ධයෙන් ගත් කළ අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් ඉක්බිතිව අවසානයේ දී පනවනු ලබන ඕනෑම අයෝග්‍යතා කාලසීමාවක් මත, ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට එම තාවකාලික අත්හිටුවීමේ වාසිය හිමිවිය යුතු ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙතින් යම් ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තා විසින් ලිඛිතව තාවකාලිකව අත්හිටුවීමක් ස්වේච්ඡාවෙන් බාරගෙන ඒ අනුව කටයුතු කරයි නම්, අයෝග්‍යතා කාලසීමාව වෙනුවෙන් කෙරෙන එකී ස්වේච්ඡාමය අත්හිටුවීම පිළිගැනීම වෙනුවෙන් ලැබෙන වාසිය එම ක්‍රීඩකයාට හෝ අනෙකුත් තැනැත්තාට හිමිවිය යුතු ය. 80 වන රීතිය යටතේ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කළ බවට වූ නිවේදනය ලැබිය යුතු එක් එක් පාර්ශවයට ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් ස්වේච්ඡාවෙන්ම තාවකාලික අත්හිටුවීම පිළිගැනීමේ ලිපියේ පිටපතක් වහාම සැලැස්විය යුතු ය.

### අයෝග්‍යතා කාල සීමාව තුළ තත්වය

62. (1) අයෝග්‍ය සේ නිවේදනය කරනු ලැබ ඇති කිසිම ක්‍රීඩකයෙක් හෝ අනෙක් තැනැත්තා විසින් තම අයෝග්‍යතා කාල සීමාව තුළ දී ඕනෑම අත්සන්කරුවෙකුගේ, අත්සන්කරුවෙකුගේ සාමාජික සංවිධානයක් විසින් සංවිධානය කරන ලද තරඟයක් හෝ ක්‍රියාකාරකමක් වෙනුවෙන් කුමන තරාතිරමකින් හෝ සහභාගී වීම හෝ රාජ්‍ය නියෝජ්‍යායතනයක් විසින් මුදල් සම්පාදිත කිසිඳු වෘත්තීයවේදී සංගමයක් හෝ ජාත්‍යන්තර හෝ ජාතික මට්ටමේ තරඟ සංවිධානයක් හෝ ඕනෑම විශිෂ්ඨ ගණයේ හෝ ජාතික මට්ටමේ ක්‍රීඩාමය ක්‍රියාකාරකමක් වෙනුවෙන් සහභාගි විය නොහැකි ය.

(2) වසර හතරකට වැඩි අයෝග්‍යතා කාලසීමාවකට යටත් වූ ක්‍රීඩකයෙක් හෝ අනෙක් තැනැත්තකු වසර හතරක අයෝග්‍යතා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව තහනම් නොකරන ලද හෝ වෙනත් යම් ආකාරයකින් ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ අත්සන්කරු හෝ ලෝක තහනම් උත්තේජක නීති සංග්‍රහයේ අත්සන්කරුගේ සාමාජිකයකුගේ අධිකරණ බලයට යටත් නොවන දේශීය තරඟවලට සහභාගී විය හැකි අතර, එකී දේශීය තරඟ, ඍජුව හෝ වක්‍රව ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා ජාතික ශූරතාව හෝ ජ්‍යාත්‍යන්තර තරඟ සඳහා තරඟ කිරීමට හෝ ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා මොනම තරාතිරමක් යටතේ හෝ බාලවයස්කරුවන් සමඟ සහභාගී නොවන තරඟ විය යුතු ය.

(3) අයෝග්‍යතා කාලසීමාවකට යටත් වන ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා පරීක්ෂාවකට යටත් විය යුතු ය.

### පුහුණුවට ආපසු පැමිණීම

63. 62 වන රීතියට ව්‍යාතිරේඛයක් ලෙස කණ්ඩායමක් කැටුව පුහුණුව පිණිස හෝ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සාමාජික ආයතනයක් යටතේ වූ සාමාජික සංවිධානයක පහසුකම් ලබා ගැනීම පිණිස යම් ක්‍රීඩකයෙකුට පුහුණුව සඳහා ක්‍රීඩකයාගේ අයෝග්‍යතා කාල සීමාවේ අවසාන මාස දෙකක කාලයක් තුළ හෝ පනවන ලද අයෝග්‍යතා කාල සීමාවේ අවසන් කාර්තුව තුළ පැමිණිය හැකි ය.

### අයෝග්‍යතා කාලය තුළ දී තරඟවලට සහභාගීවීමේ තහනම කඩ කිරීම

64. (1) 62 වන රීතියේ විස්තර කරනු ලැබ ඇති පරිදි අයෝග්‍යතාවට ලක් කරනු ලැබ ඇති ක්‍රීඩකයෙකු හෝ අනෙක් තැනැත්තකු එකී අයෝග්‍යතා කාලසීමාව තුළ ක්‍රීඩාවලට සහභාගී වීම තහනම් කිරීමේ නියෝගය උල්ලංඝනය කොට ඇත්නම්, ක්‍රීඩාවලට සහභාගී වීමෙන් ලත් ප්‍රතිඵල නුදුසුදු බවට පත් කරනු ලැබිය යුතු අතර මුල් අයෝග්‍යතා කාලසීමා කාලයට සමාන නව අයෝග්‍යතා කාලයක් ඔහුගේ අයෝග්‍යතා කාලසීමාවේ අවසානයට එකතු කරනු ලැබිය යුතු ය. ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් කරන ලද වරදේ ප්‍රමාණය හා අනෙකුත් තත්වයන් පදනම් කරගෙන නව අයෝග්‍යතා කාලය සීරුමාරු කළ යුතු ය. තරඟවලට සහභාගීවීමේ තහනම කඩ කළේද යන වග සහ සීරුමාරු කිරීම යෝග්‍ය ද යන්න සම්බන්ධයෙන් තීරණය කිරීම ප්‍රතිඵල කළමණාකරණයෙන් ඉක්බිතිව

මූලික අයෝග්‍යතාව පැනවූ උත්තේජක මර්දන සංවිධානය විසින් සිදුකළ යුතු ය. මෙම තීරණයට එරෙහිව 69 සිට 79 දක්වා රීති යටතේ අභියාචනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) අයෝග්‍යතා කාලයක් තුළදී ක්‍රීඩක සහායක පුද්ගලයෙකු හෝ අනෙක් පුද්ගලයෙකු තරඟවලට සහභාගීවීමේ තහනමක දී කිසියම් තැනැත්තෙකුට සහාය වේ නම්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම ක්‍රීඩක සහායක පුද්ගලයෙකු හෝ එවැනි පුද්ගලයෙකුට 4(එ) වන රීතියේ සඳහන්කර ඇති පරිදි තහංචි පැනවිය යුතු ය.

**අයෝග්‍යතා කාලය තුළදී, මූල්‍ය සහාය අත්හිටුවීම**

65. (1) මීට අමතර වශයෙන්, 46 හෝ 47 වන රීතිවල විස්තර කරනු ලැබ ඇති පරිදි අඩුකළ තහනමක සම්බන්ධයක් නොමැති ඕනෑම උත්තේජක මර්දන රීතියක් කඩකිරීමේදී, එබදු පුද්ගලයෙකු විසින් ලබා ඇති කිසියම් හෝ සියලු ක්‍රීඩා ආශ්‍රිත මූල්‍ය සහාය හෝ ප්‍රතිලාභ, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ශ්‍රී ලංකා රජය සහ ජාතික සම්මේලන විසින් අත්හිටවනු ලැබිය යුතු ය.

(2) 82 වන රීතියේ දක්වා ඇති පරිදි එක් එක් තහංචියේ අනිවාර්ය කොටසට ස්වයංක්‍රීයව ප්‍රකාශයට පත් කිරීමක් ඇතුළත් විය යුතු ය.

**කණ්ඩායම් ක්‍රීඩා පරීක්ෂාවන්**

66. ක්‍රීඩා තරඟයක් සම්බන්ධයෙන් 22 වන රීතියේ සිට 23 වැනි රීති යටතේ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳව කණ්ඩායම් ක්‍රීඩාවක එක් සාමාජිකයෙකුට වැඩි ගණනකට දැනුම් දී තිබෙන අවස්ථාවක එම තරඟයට අදාළ පාලක ආයතනය විසින් ක්‍රීඩා තරඟ කාලය තුළ දී සුදුසු ඉලක්කගත පරීක්ෂාවක් සිදුකළ යුතු ය.

**කණ්ඩායම් ක්‍රීඩා සඳහා දඬුවම්**

67. කණ්ඩායම් ක්‍රීඩාවකට අයත් කණ්ඩායමක සාමාජිකයන් දෙදෙනෙකුට වැඩි ගණනක් විසින් තරඟ කාල සීමාවේ දී උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කරනු ලැබ ඇත්නම් එම තරඟයේ පාලක මණ්ඩලය විසින් උත්තේජක මර්දන රීති කඩකිරීම පිළිබඳව එක් එක් ක්‍රීඩකයාට වෙන වෙනම පනවනු ලබන දඬුවම්වලට අමතර වශයෙන් කණ්ඩායමට උචිත තහනමක් පැනවිය යුතු ය.

**කණ්ඩායම් තරඟ සඳහා වඩාත් දැඩි දඬුවම් නියම කළ යුත්තේ තරඟ පාලක මණ්ඩලය විසින් ය**

68. (1) 67 වන රීතියේ දැක්වෙන ඉසව් කාර්යයන් පනවනු ලබන දඬුවම්වලට වඩා දැඩි දඬුවම් කණ්ඩායම් තරඟ සඳහා පැනවීම සහතික කිරීමට තරඟයක පාලක මණ්ඩලය ඉටාගත යුතු ය.

(2) උත්තේජක මර්දන රීතිවලට අනුව කටයුතු නොකරන ජාතික සම්මේලන සඳහා සපයනු ලබන මූල්‍යාධාර කිසියම් ප්‍රමාණයක් හෝ මුළු ප්‍රමාණයම හෝ අත්හිටුවන ලෙස අදාළ රාජ්‍ය අධිකාරී ආයතනවලින් ඉල්ලා සිටීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට බලය ඇත.

(3) ජාතික සම්මේලනයකට අනුබද්ධව සිටින ක්‍රීඩකයෙක් හෝ වෙනත් තැනැත්තෙකු විසින් සිදුකරනු ලද උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමකට අදාළ වන සියලු පිරිවැය විමර්ශනය කිරීමේ වියදම් හා ගමන් වියදම් ඇතුළුව එහෙත් රසායනාගාර ගාස්තුවට සීමා නොවී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ප්‍රතිපූර්ණය කිරීමට ජාතික සම්මේලනයට බැඳී සිටිය යුතු ය.

(4) ජාත්‍යන්තර තරඟ සඳහා ක්‍රීඩකයින් හා ඒවායේ නිලධාරීන්ගේ යෝග්‍යතාව පිළිගැනීම හා පහත දැක්වෙන කාරණා මත දඩගැසීම් සම්බන්ධයෙන් අතිරේක විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ජාතික ඔලිම්පික් කමිටුව මඟින් ඉල්ලා සිටිය හැකි ය:-

(අ) ජාතික සම්මේලනයකට අනුබද්ධ ක්‍රීඩකයින් හෝ අනෙක් තැනැත්තන් විසින් 12 මසක කාලයක් තුළ දී 4(ඇ) රීතියේ සඳහන් කඩකිරීම් හැර මෙකී උත්තේජක මර්දන රීති කඩකිරීම් වාර 4 කට හෝ ඊට වැඩි ගණනක් සිදු කිරීම;

(ආ) එක් ක්‍රීඩකයෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් විසින් හෝ අනෙක් තැනැත්තා විසින් ජාත්‍යන්තර තරඟයක් පැවැත්වෙන කාලය තුළ දී සිදුකරනු ලබන උත්තේජක මර්දන රීති කඩකිරීම;

(ඇ) ක්‍රීඩකයාගේ වතගොත පිළිබඳ තොරතුරු ලබාදෙන ලෙස ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙතින් ඉල්ලීමක් ලැබුණු පසු ඒ පිළිබඳව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය දැනුවත් කිරීමට ජාතික සම්මේලනයක් අපොහොසත් වීම.

### අභියාචනා කරනු ලැබීමට යටත් තීරණ

69. (1) අභියාචනා කරනු ලැබීමට යටත් තීරණ 69(5) සිට 74 සහ 79 වැනි රීතියේ හෝ මෙකී උත්තේජක මර්දන රීතිවල වෙනත් යම් ආකාරයකින් පනවා ඇති විධිවිධාන හෝ ලෝක උත්තේජක මර්දන රීති සංග්‍රහය හෝ ජාත්‍යන්තර ප්‍රමිතීන් ප්‍රකාරව මෙකී උත්තේජක මර්දන රීති යටතේ එළඹී තීරණවලට එරෙහිව අභියාචනා කළ හැකි වේ. අභියාචනා මණ්ඩලය වෙනත් යම් නියෝගයක් නොකළ හොත් මිස එම තීරණ එකී අභියාචනයට යටත්ව බලපැවැත්විය යුතු ය. අභියාචනයක් ආරම්භවීමට උත්තේජක මර්දන ආයතනයේ නීතිරීතිවලට පශ්චාත් සාමාලෝචනයක් කළ යුතු බවට දැක්වෙන විධිවිධාන නියමයන් අත්හල යුතු ය. එසේ වී නමුත් එබඳු සමාලෝචනයක් 69 (4) වන රීතියේ දැක්වෙන පරිදි හැර 70 වන රීතියේ මූලධර්මවලට ගරු කළ යුතු ය.

(2) අභියාචනා කරනු ලැබ ඇති සමාලෝචනයේ විෂය පථයට, ප්‍රස්තුත විෂය කරුණට අදාළ සියලු ගැටළු ඇතුළත් වන අතර වෙසෙසින්ම, මූලික තීන්දුව ගන්නා තැනැත්තා ඉදිරියේ දී ප්‍රශ්නගත කරුණුවලට හෝ සමාලෝචනයේ විෂය පථයට පමණක් සීමා නොවේ.

(3) ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය තම තීන්දුවට එළඹීමේ දී, කිසියම් මණ්ඩලයක් මගින් ක්‍රියාවේ යොදවන ලද අභිමතයට ගරු සැලකිල්ලක් දීම අවශ්‍ය නොවේ.

(4) 69 සිට 79 වන රීති යටතේ අභියාචනා කිරීමට ලෝක තහනම් උත්තේජක නියෝජ්‍යායතනයට අයිතියක් ඇති අවස්ථාවකදී සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ක්‍රියාවලිය තුළ වෙනත් යම් පාර්ශවයක් විසින් අභියාචනයක් ඉදිරිපත් කොට නැත්නම් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ ක්‍රියාවලිය හරහා ඉදිරිපත්වන වෙනත් ප්‍රතිකර්මවලට ගරු නොකොට ලෝක තහනම් උත්තේජක නියෝජ්‍ය ආයතනය විසින් සෘජුවම ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයට අභියාචනා කළ හැකි ය.

(5) උත්තේජක මර්දන රීතියක් කඩකිරීමක් සම්බන්ධයෙන් දෙන ලද තීන්දුවක්, උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් පිළිබඳව දඬුවමක් පැනවීමට හෝ නොපැනවීමට ගත් තීරණයක්, හෝ උත්තේජක මර්දන රීතියක් කඩ නොකළ බවට වූ තීරණයක් පටිපාටිමය හේතුන් මත උදාහරණයක් ලෙස නියම කිරීම් ඇතුළුව උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකරණ කටයුතු ඉදිරියට ගෙනයාමට නොහැකි වූ බවට තීරණයක්, 20 (1) රීතිය යටතේ විශ්‍රාම ගිය ක්‍රීඩකයකු නැවත තරඟ සඳහා සහභාගී වීම සම්බන්ධයෙන් දෙනු ලබන මාස හයක දැනුම් දීමේ නියමයට ව්‍යාතිරේක ලබා නොදීමට වූ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ තීරණයක් ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ 22(1) වන රීතිය යටතේ ප්‍රතිඵල කළමනාකරණය පැවරීම සම්බන්ධයෙන් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ තීරණයක් අහිතකර විශ්ලේෂණාත්මක වාර්තාවක් හෝ ආදර්ශීය තීන්දුවක් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් ලෙස ඉදිරියට ගෙන ඒම සඳහා වූ තීරණයක් හෝ 26 වැනි රීතිය යටතේ විමර්ශනයක් සිදු කිරීමෙන් පසුව උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු නොකිරීම සඳහා වූ තීරණයක්, තාවකාලික නඩු විභාගයක ප්‍රතිඵලයක් වශයෙන් වූ තාවකාලික අත්හිටුවීමක් පැනවීමට වූ තීරණයක්, 28 සිට 30 වන රීතිවලට අනුකූලව කටයුතු කිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අසමත් ව ඇතැයි පැවසෙන උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳව හෝ දඬුවම් පිළිබඳව විධානයක් කිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයට අධිකරණ බලයක් නොමැති බවට වූ තීරණයක්, 48 සිට 49 දක්වා රීති යටතේ අයෝග්‍යතා කාල සීමාව අත්හිටුවීමට හෝ එසේ නොකිරීමට හෝ අයෝග්‍යතා කාලසීමාව ප්‍රතිස්ථාපනය කිරීමට හෝ එසේ නොකිරීමට, 64 වන රීතිය යටතේ වූ තීරණ සහ 85 වැනි රීතිය යටතේ තවත් තහනම් උත්තේජක මර්දන සංවිධානයක තීරණයක් නොපිළිගැනීමට වූ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ තීරණයකට එරෙහිව 69(5) සිට 74, 75, 76, 77, 78 සහ 79 දක්වා වූ රීතිවල විශේෂයෙන් විධිවිධාන පනවා ඇති පරිදි අභියාචනා කරනු ලැබිය හැකි ය.

(6) ජාත්‍යන්තර තරඟවලට සහභාගී වීම හෝ ජාත්‍යන්තර ක්‍රීඩකයින් සම්බන්යෙන් උද්ගතවන සිද්ධිවලට අදාළ තීරණවලට එරෙහිව 75 වන රීතියේ සඳහන් පරිදි ඕනෑම පාර්ශවයක් විසින් අභියාචනා, විශේෂයෙන් ම ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

### වෙනත් ක්‍රීඩකයින් හෝ වෙන් තැනැත්තන් අදාළවන අභියාචනා

70. (1) 69(6) වැනි රීතිය අදාළ නොවන තැන්හි දී ක්‍රීඩා බේරුම්කරණ උසාවියක් ඉදිරියේ අදාළ වන විධිවිධාන යටතේ තීරණයට එරෙහිව විශේෂයෙන් ම ක්‍රීඩා බේරුම්කරණ උසාවියට අභියාචනාවක් ඉදිරිපත් කළ යුතු ය.

(2) 69(6) වන රීතිය අදාළ නොවන අවස්ථාවන්හි දී, තීරණයට එරෙහිව ජාතික තහනම් උත්තේජක අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. මේ විකල්පය තෝරා ගැනීමේ දී, ජාතික උත්තේජක මර්දන සංවිධාන විසින් 71 සිට 73 දක්වා වූ රීතිවල සඳහන් විකල්ප තෝරාගත හැකි ය.

එසේ වුව ද, ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ දැක්වෙන අදාළ විධිවිධාන ප්‍රකාරව, තම තමන්ගේ ජාතික අභියාචනා මණ්ඩලවල කාර්ය පටිපාටි ස්ථාපනය කිරීමට යම් උත්තෙජක මර්දන සංවිධානයකට නිදහස පවතී.

**ජාතික තහනම් උත්තේජක අභියාචනා මණ්ඩලය ඉදිරියේ සිදුකරන නඩු විභාග**

71. (1) උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම තුළින් උද්ගතවන කරුණු සම්බන්ධයෙන් අභියාචනා විමර්ශනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නීතිය හා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි හසල දැනුමක් ඇති සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත විය යුතු උත්තේජක මර්දන අභියාචනා මණ්ඩලයක් (මෙහි මින්මතු "අභියාචනා මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) පත්කරනු ලැබිය යුතු ය.

(2) අභියාචනා මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම ඉල්ලා අස්වීමෙන්, මියයාමෙන් හෝ ධුරයෙන් ඉවත් කිරීමෙන් ස්වකීය ධුරය හිස්කළ හොත් මිස, ඔහු පත් කළ දින සිට වසර ........... කාල සීමවක් සඳහා ධුරය දැරිය යුතු ය. ඉවත් කිරීමකින් හැර ධුර කාලය අවසන්වීමට නියමිත යම් සාමාජිකයකු, නැවත පත්කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය. එවැනි නැවත පත්කිරීමක්, අනුගාමී වන හෝ නොවන තවත් එක් ධුරකාලයකට නොවැඩි විය යුතු ය.

(3) අභියාචනා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් යම් සාමාජිකයෙකු, රෝගාතුර වීම, අශක්නුතාවකට පත්වීම හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් තම ධුරයේ කාර්ය තාවකාලිකව ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, ඒ පිළිබඳ ලිඛිතව අමාත්‍යවරයා වෙත දැන්විය යුතු ය. එවැනි අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, එම සමාජිකයාගෙන් ධුරයේ කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මඟින්, අභියාචනා මණ්ඩලයේ යම් සාමාජිකයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එවැනි ඉල්ලා අස්වීමක් අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

(5) ඉල්ලා අස්වීමක් සඳහා හේතු දැක්වීමෙන් පසු අමාත්‍යවරයා විසින් යම් සාමාජිකයෙකුව ධුරයෙන් ඉවත්කරනු ලැබිය හැකි ය. එවැනි ඉවත්කිරීමක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

(6) යම් සාමාජිකයෙකු මියයන, ධුරයෙන් අස්වන හෝ ධුරයෙන් ඉවත්කරනු ලබන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, (1) උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් එම සාමාජිකයා වෙනුවට වෙනත් සුදුසු තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය. එසේ පත්කළ තැනැත්තා විසින්, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුරකාලයේ ඉතිරි කාල සීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

(7) අමාත්‍යවරයා විසින් අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන් අතරින් එක් අයකු සභාපතිවරයා (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් හඳුන්වනු ලබන) ලෙස පත්කළ යුතු ය.

(8) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මඟින්, සභාපතිවරයා ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසන් ලිඛිතව පිළිගනු දින සිට බලාත්මක විය යුතු ය.

(9) ඉල්ලා අස්වීම සඳහා හේතු දැක්වීමෙන් පසු, අමාත්‍යවරයා විසින් සභාපතිවරයාට සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(10) අභියාචනා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සභාපතිවරයා විසින්, ඔහුගේ ධුර කාලය තුළ සභාපති ධුරය දරනු ලැබිය යුතු ය.

(11) රෝගාතුර වීම, අශක්නුතාවකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර වීම හේතුවෙන් සභාපතිවරයාට තම ධුරයේ කාර්ය තාවකාලිකව සිදු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට අභියාචනා මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු පත්කරනු ලැබිය යුතු ය.

(12) යම් සාමාජිකයෙකුට නඩුවට සම්බන්ධ කිසිදු පූර්ව සම්බන්ධතාවක් නොපැවතිය යුතු ය. විශේෂයෙන් ම වර්තමාන නඩුවේ සඳහන් එම ක්‍රීඩකයාගේ ම චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තියක් හෝ අභියාචනාවක් මීට පෙර කිසිඳු සාමාජිකයකු විසින් සලකා නොබලා තිබිය හැකි ය. තමා මණ්ඩලයට පත් කරනු ලැබීමේ දී පාර්ශවයන්ගෙන් යම් පාර්ශවයක් සම්බන්ධයෙන් බලපෑ හැකි අපක්ෂපාතීත්වය පිළිබඳ යම් තත්ත්වයක් මණ්ඩලයේ සභාපතිවරයාට හෙළිදරව් කළ යුතු ය.

(13) නඩුවක් විභාග කිරීම සඳහා සභාපතිවරයා විසින් පත්කරන ලද සාමාජිකයෙක් එම නඩුව විභාග කිරීමට කුමන කරුණක් නිසා හෝ අකමැති වේ නම් හෝ අසමත් වේ නම්, සභාපතිවරයා විසින් එම නඩුව විභාග කිරීම සඳහා වෙනත් සාමාජිකයකු හෝ අලුත් විමර්ශන මණ්ඩලයක් පත්කළ යුතු ය.

(14) මණ්ඩලයට අවශ්‍ය වන පරිදි, මණ්ඩලයට සහාය දීමට හෝ උපදෙස්දීමට විශේෂඥයකු පත්කිරීමේ බලය, ජාතික උත්තේජක මර්දන අභියාචනා මණ්ඩලයට තිබිය යුතු ය. පාර්ශවයක් වශයෙන් එම තැනැත්තාට නඩු කටයුතුවලට සම්බන්ධ වීමේ හා ජාතික තහනම් උත්තේජක මර්දන අභියාචනා මණ්ඩලයේ නඩු විභාගවලට සම්බන්ධවීමේ අයිතිය තිබේ.

(15) ජාත්‍යන්තර සම්මේලනය හෝ අදාළ ක්‍රීඩා සංවිධානය නඩු විභාගයේ පාර්ශවයක් නොවන්නේ නම්, ජාතික ඔලිම්පික් කමිටුව නඩු විභාගයේ පාර්ශවයක් නොවන්නේ නම් එම ආයතනයකට ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට නිරීක්ෂකයකු වශයෙන් ජාතික උත්තේජක මර්දන අභියාචනා මණ්ඩලයේ නඩු විභාගවලට සහභාගීවීමේ අයිතිය තිබේ.

(16) මේ රීතිය ප්‍රකාරව සිදුකෙරෙන නඩු, කඩිනමින් අවසන් කළ යුතු අතර සියලු නඩු සම්බන්ධයෙන් ගත් කළ විශේෂ අවස්ථානුගත කරුණු අදාළ වීම මත හැර උත්තේජක මර්දන නඩු විභාග කරන මණ්ඩලයේ තීරණය දී මාස තුනක් ඇතුළත එකී නඩු විභාග අවසන් කළ යුතු වේ.

(17) තරඟ සම්බන්ධයෙන් සිදු කෙරෙන නඩු විභාග කඩිනමින් පදනමක් මත සිදුකළ හැකි ය.

**ජාතික උත්තේජක මර්දන අභියාචනා මණ්ඩලයේ නඩු කටයුතු**

72. (1) මෙම උත්තේජක මර්දන රීතිවල දැක්වෙන විධිවිධානයන්ට යටත් ව, ජාතික උත්තේජක මර්දන අභියාචනා මණ්ඩලයට තම කාර්ය පටිපාටි නියාමනය කිරීමේ බලය තිබිය යුතු ය.

(2) අභියාචනා කරන තැනැත්තා විසින් තම නඩුව ඉදිරිපත් කළ යුතු අතර වගඋත්තරකාර පාර්ශවය හෝ පාර්ශව විසින් ඔවුන්ගේ නඩු ඊට ප්‍රතිචාරාත්මකව ඉදිරිපත් කළ යුතු ය.

(3) දැනුම් දීමකින් පසුව යම් පාර්ශවයක් විසින් හෝ එම පාර්ශවයේ නියෝජිතයා විසින් නඩු විභාගයකට සහභාගීවීමට අපොහොසත් වීම, නඩු විභාගයට සහභාගීවීමට එම පාර්ශවයට ඇති අයිතිය අත්හළ සේ සැලකේ. මෙම අයිතිය සාධාරණ හේතූන් මත ප්‍රතිස්ථාපනය කළ හැකි ය.

(4) තම පාර්ශවයේ වියදමින් නඩු විභාගයක් නියෝජනය කිරීමේ අයිතිය එක් එක් පාර්ශවයට තිබිය යුතු ය.

(5) නඩුව විභාග කරන මණ්ඩලය විසින් අවශ්‍ය යැයි සලකනු ලබන්නේ නම්, නඩුව විභාග කරන අවස්ථාවේ දී භාෂා පරිවර්තකයකු ලබා ගැනීමේ අයිතිය සෑම පාර්ශවයකටම තිබිය යුතු ය. නඩුව විභාග කරන මණ්ඩලය විසින් යම් භාෂා පරිවර්තකයකු සඳහා වන පිරිවැය හඳුනා ගැනීම හා ඒ සම්බන්ධ වගකීම තීරණය කළ යුතු ය.

(6) ජාතික උත්තේජක මර්දන නඩු විභාග කරන මණ්ඩලයේ අභිමතයට යටත් ව, දුරකථනයකින් හෝ වෙනත් මාර්ගයකින් සාක්ෂි ලබා ගැනීම සඳහා සාක්ෂිකරුවන් කැඳවීමේ හා ප්‍රශ්න කිරීමේ අයිතිය ඇතුළුව සාක්ෂි ඉදිරිපත් කිරීමේ අයිතිය නඩු විභාගයන්ට අදාළ එක් එක් පාර්ශවයන්ට තිබේ.

(7) ජාතික තහනම් උත්තේජක මර්දන අභියාචනා මණ්ඩලයේ යම් නියමයකට හෝ නියෝගයකට අනුව කටයුතු කිරීමට යම් පාර්ශවයක් විසින් අසමත් වීම, ජාතික උත්තේජක මර්දන අභියාචනා මණ්ඩලයේ නඩු විභාග කටයුතු වළකාලීමට හේතුවක් නොවිය යුතු අතර ජාතික උත්තේජක මර්දන අභියාචනා මණ්ඩලය විසින් තම තීරණය ගනු ලැබීමේ දී එවැනි අසමත්වීමක් පිළිබඳ සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

**ජාතික උත්තේජක මර්දන අභියාචනා මණ්ඩලයේ තීරණ**

73. (1) නඩු විභාගය අවසානයේ දී හෝ ඉන් ඉක්බිතිව කාලීන පදනමක් මත ජාතික උත්තේජක මර්දන අභියාචනා මණ්ඩලය විසින්, දියහැකි උපරිම තහනමක් නොපැනවූයේ ඇයි ද යන්න සඳහා අදාළ විය හැකි සාධාරණීකරණයක් ඇතුළත්ව තීරණය සඳහා වන සම්පූර්ණ හේතූන් සහ ඒ සඳහා පනවන ලද යම් අයෝග්‍යතා කාලසීමාව ඇතුළත්වන ලිඛිත, දාතම යෙදූ සහ අත්සන සහිත තීරණයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන විසින් තම තීරණය, 75 වන රීතිය යටතේ අභියාචනා කිරීමට ඇති අයිතිය ද සමඟ, ක්‍රීඩකයාට හෝ වෙනත් තැනැත්තකුට, ඔහුගේ/ඇයගේ ක්‍රීඩා සංවිධානයට සහ උත්තේජක මර්දන සංවිධානවලට ලබා දිය යුතු ය.

(3) 75 වන රීතියේ විධිවිධාන ප්‍රකාරව තීරණයට එරෙහිව අභියාචනා සිදු කළ හැකි ය. තීරණයකට එරෙහිව අභියාචනාවක් ඉදිරිපත් නොකරන ලද්දේ නම්, ඉන්පසු -

(අ) එම තීරණය උත්තේජක මර්දන රීති උල්ලංඝනය කළ බවට වූ තීරණයක් නම්, එය 82(2) වන රීතියේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසිද්ධියේ හෙළිදරව් කළ යුතු ය; එහෙත්

(ආ) එම තීරණය උත්තේජක මර්දන රීති උල්ලංඝනය නොකළ බවට වූ තීරණයක් නම්, එය ප්‍රසිද්ධියේ හෙළිදරව් කළ යුත්තේ එම තීරණයට යටත් ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකුගේ කැමැත්ත මත පමණි. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එසේ කැමැත්ත ලබා ගැනීම සඳහා සාධාරණ ප්‍රයත්නයක් දැරිය යුතු අතර කැමැත්ත ලබාගතහොත්, ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු විසින් අනුමත කරන පරිදි සමස්ත තීරණයම හෝ එයින් සමහර කරුණු ඉවත්කරන ලද ආකාරයෙන් ප්‍රසිද්ධියේ හෙළිදරව් කළ යුතු ය.

**අභියාචනා කිරීමට හිමිකම් ඇති තැනැත්තන්**

74. (1) 69(6) වන රීතිය යටතේ වන කරුණු සම්බන්ධයෙන් ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය වෙත අභියාචනා කිරීමට පහත දැක්වෙන පාර්ශවයන්ට අයිතිය තිබේ:-

(අ) අභියාචනා කරනු ලැබ ඇති තීරණයට යටත් ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු ;

(ආ) තීරණය දෙනු ලැබ ඇති නඩුවට අදාළ අනෙක් පාර්ශවය ;

(ඇ) අදාළ ජාත්‍යන්තර සම්මේලනය ;

(ඈ) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හා අදාළ තැනැත්තා ජාතික පුරවැසියකු හෝ බලපත්‍රධාරියකු වන අවස්ථාවක දී තමා වාසය කරන රටේ හෝ රටවල ජාතික උත්තේජක මර්දන සංවිධානය ;

(ඉ) ඔලිම්පික් ක්‍රීඩා හෝ පැරා ඔලිම්පික් ක්‍රීඩා සඳහා වූ සුදුසුකම් සම්බන්ධයෙන් බලපෑමක් ඇතිවන තීරණ ඇතුළුව එම තීරණ මඟින් ඔලිම්පික් ක්‍රීඩා හෝ පැරා ඔලිම්පික් ක්‍රීඩා සම්බන්ධයෙන් යම් බලපෑමක් ඇතිවිය හැකි අවස්ථාවක දී, අදාළ පරිදි ජත්‍යන්තර ඔලිම්පික් කමිටුව හෝ ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුව ; සහ

(ඊ) ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය.

(2) 70 වන රීතිය යටතේ වන කරුණු සම්බන්ධයෙන් පහත දැක්වෙන පාර්ශවයන් අවම වශයෙන් අභියාචනා කිරීමට හිමිකම් ලබති.

(අ) අභියාචනා කරනු ලැබ ඇති තීරණයට යටත් ක්‍රීඩකයා හෝ වෙනත් තැනැත්තකු ;

(ආ) තීරණය දෙනු ලැබ ඇති නඩුවට අදාළ අනෙක් පාර්ශවය ;

(ඇ) අදාළ ජාත්‍යන්තර සම්මේලනය ;

(ඈ) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හා අදාළ තැනැත්තා වාසය කරන රටේ හෝ රටවල ජාතික උත්තේජක මර්දන සංවිධානය ;

(ඉ) ඔලිම්පික් ක්‍රීඩා හෝ පැරා ඔලිම්පික් ක්‍රීඩා සඳහා වූ සුදුසුකම් සම්බන්ධයෙන් බලපෑමක් ඇතිවන තීරණ ඇතුළුව එම තීරණය මඟින් ඔලිම්පික් ක්‍රීඩා හෝ පැරා ඔලිම්පික් ක්‍රීඩා සම්බන්ධයෙන් යම් බලපමක් ඇතිවිය හැකි අවස්ථාවක දී, අදාළ පරිදි ජත්‍යන්තර ඔලිම්පික් කමිටුව හෝ ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුව ; සහ

(ඊ) ලෝක තහනම් උත්තේජක නියෝජ්‍යායතනය.

(3) මෙහි වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් වුව ද, තාවකාලික අත්හිටුවීමකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි එකම තැනැත්තා වන්නේ තාවකාලික අත්හිටුවීමකට භාජනය වී ඇති ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා ය.

(4) ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය (CAS) වෙත යොමුකරන ලද නඩුවල නම් සඳහන් කරන ලද ඕනෑම වගඋත්තරකරුවකු විසින් උත්තේජක මර්දන රීති සංග්‍රහය යටතේ ඉදිරිපත් කෙරෙන හරස් අභියාචනා සහ ඉන්ඉක්බිතිව ඉදිරිපත් කරන අභියාචනා සඳහා වෙසෙසින්ම අවසර දෙනු ලැබේ. මෙම රීතිය යටතේ අභියාචනා කිරීමට අයිතිය ඇති ඕනෑම පාර්ශවයන් විසින් හරස් අභියාචනයක් හෝ ඉන්ඉක්බිති අභියාචනයක් පාර්ශවයේ පිළිතුරට පෙරාතුවම ගොනු කළ යුතු ය.

**නිසි කාලයට තීරණයක් දීමට අපොහොසත් වීම.**

75. උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කරනු ලැබ ඇත්දැයි යන්න පිළිබඳව තීරණයක් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නියම කරන ලද සාධාරණ අවසන් කාල සීමාව ඇතුළත දීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අපොහොසත් වන අවස්ථාවක දී, උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමත් සිදු නොවූ බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තීරණයක් දෙනු ලැබූ ලෙස සලකා ක්‍රීඩා බේරුම්කරණ අධිකරණයට (CAS) ඍජුවම අභියාචනයක් ඉදිරිපත් කිරීමට ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් කටයුතු කරනු ලැබිය හැකි ය. උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කර ඇති බවට සහ ඍජුවම බේරුම්කරණ අධිකරණයට (CAS) අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සාධාරණ ලෙස ක්‍රියා කර ඇති බවට බේරුම්කරණ අධිකරණයට සභාව විසින් නිශ්චිය කරන්නේ නම්, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එම අභියාචනයට අදාළ, නඩු පැවරීමේ දී දරන ලද පිරිවැය සහ ඇටෝර්නි ගාස්තු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ප්‍රතිපූර්ණය කළ යුතු ය.

**චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් අභියාචනා**

76. විශේෂයෙන්ම 16 සිට 18 දක්වා රීතිවල විධිවිධාන සලකා ඇති පරිදි චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සම්බන්ධයෙන් වන තීරණවලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

**අභියාචනා තීරණ පිළිබඳව දැනුම් දීම.**

77. අභියාචනාවක් සම්බන්ධයෙන් පාර්ශවයන් වන ඕනෑම උත්තේජක මර්දන සංවිධානයක්, අභියාචනා තීරණය ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට සහ 14.2 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි 75 වන රීතිය යටතේ අභියාචනා කිරීමට හිමිකම් ලබා තිබෙන වෙනත් උත්තේජක මර්දන සංවිධානවලට වහාම ලබා දිය යුතු ය.

**12 වන වගන්තිය අනුව තීරණවලට එරෙහිව අභියාචනා කිරීම.**

78. 68 වන රීතියට අනුව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගනු ලබන තීරණවලට එරෙහිව විශේෂයෙන්ම ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය වෙත ක්‍රීඩා සංවිධාන විසින් අභියාචනා කරනු ලැබිය හැකි ය.

**අභියාචනා ගොනු කිරීම සඳහා කාලය**

79. (1) ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය වෙත අභියාචනාවක් ගොනු කිරීමේ කාලය, යම් තීරණයකට එරෙහිව අභියාචනාවක් කරන පාර්ශවයට තීරණය ලැබුණු දින සිට දින 21ක කාලයක් විය යුතු ය.

එසේ වුව ද, අභියාචනා කිරීමට හිමිකම් ඇති පාර්ශවයක්, එහෙත් අභියාචනා කිරීමකට තුඩුදුන් තීරණයට නඩුවේ පාර්ශවයක් නොවන පාර්ශවයක් විසින් ගොනු කරන ලද අභියාචනාවක් සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අදාළ විය යුතු ය:-

(අ) තීරණය දැනුම් දුන් දිනයේ සිට දින පහළොවක් ඇතුළත, එකී තීරණය දුන් මණ්ඩලයෙන් නඩු ගොනුවේ පිටපතක් ඉල්ලා සිටීමට එකී පාර්ශවයට හිමිකම තිබිය යුතු ය ;

(ආ) එබඳු ඉල්ලීමක් දින පහළොවක් ඇතුළත කරන ලද්දේ නම්, එබඳු ඉල්ලීමක් කරනු ලබන පාර්ශවය විසින් බේරුම්කරණ අධිකරණය (CAS) වෙත අභියාචනයක් ගොනු කිරීමට එම ගොනුව ලැබීමේ සිට දින විසි එකක කාලයක් තිබිය යුතු ය ;

එසේම තවදුරටත් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගොනුකරනු ලබන අභියාචනයක් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය වන්නේ -

(අ) නඩුවේ වෙනත් යම් පාර්ශවයක් විසින් අභියාචනයක් ඉදිරිපත් කළ හැකිව තිබූ අවසාන දිනයෙන් පසුව එළඹෙන දින විසි එකක කාලයක් ; හෝ

(ආ) තීරණයට සම්බන්ධ සම්පූර්ණ ගොනුව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ලැබීමෙන් පසුව එළඹෙන දින විසි එකක කාලයක්,

වේ.

**රහස්‍යභාවය සහ වාර්තාකරණය**

80. (1) යම් ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තකුට එරෙහිව උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් තහවුරු වී ඇති බවට ඒ පිළිබඳව එම ක්‍රීඩකයන්ට හෝ අනෙක් තැනැත්තන්ට දැනුම් දීම මෙකී උත්තේජක මර්දන රීතිවල 22 වන සහ 23 වන රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි සිදුවිය යුතු ය. ක්‍රීඩා සංවිධානයක සාමාජිකයකු වන ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තකු වෙත කෙරෙන දැනුම් දීමේ කාර්යය ක්‍රීඩා සංවිධානයට දැනුම් දීම මඟින් සම්පූර්ණ වේ.

(2) උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් තහවුරු වීමක් පිළිබඳව ජාත්‍යන්තර සම්මේලනවලට සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට දැනුම්දීමට උත්තේජක මර්දන රීතිවල 22 වන සහ 23 වන රීති යටතේ වූ විධිවිධාන සලස්වා ඇති පරිදි සිදු විය යුතු අතර ඊට සමගාමීව ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට දැනුම්දීම ද සිදුවිය යුතු ය.

(3) උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් පිළිබඳව 3(අ) සහ (ආ) රීති යටතේ වූ දැන්වීමක, ක්‍රීඩාවේ නියැළී සිටින ක්‍රීඩකයාගේ නම, රට ක්‍රීඩාව සහ ක්ෂේත්‍රය, ක්‍රීඩකයාගේ තරඟකාරී මට්ටම, පරීක්ෂාව තරඟය තුළද නැතිනම් තරඟයෙන් පිටත ද යන වග, නියැදි රැස් කිරීමේ දිනය, රසායනාගාරය විසින් වාර්තා කරන ලද විශ්ලේෂණාත්මක ප්‍රතිඵල සහ පරීක්ෂා කිරීම් සහ විමර්ශන සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව නියම කර ඇති පරිදි වූ වෙනත් තොරතුරු ඇතුළත් විය යුතු ය.

(4) 80(1) වන රීතියට අනුව උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳ දැනුම් දීමකට හේතු වී නොමැති විමර්ශන සම්බන්ධයෙන් හැර 22 සිට 33 දක්වා, 34 සිට 38 දක්වා වන රීතිවලට හෝ 69 සිට 79 දක්වා වන රීතිවලට අනුව පවත්වන ලද යම් සමාලෝචනයක හෝ නීති කෘත්‍යවල තත්ත්වය සහ සොයාගැනීම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර සම්මේලනය සහ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ක්‍රමිකව යාවත්කාලීන කරනු ලැබිය යුතු අතර හේතු සහිත පැහැදිලි කිරීමක් හෝ කාරණාව විසඳීම පිළිබඳ පැහැදිළි කරනු ලබන තීරණය ලිඛිතව වහාම සපයනු ලැබිය යුතු ය.

(5) 82 වන රීතිය මඟින් නියම කර ඇති පරිදි ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් මෙම තොරතුරු ප්‍රසිද්ධියේ හෙළිදරව් කරන තෙක් හෝ ප්‍රසිද්ධ හෙළිදරව් කිරීමට අසමත් වන තෙක් මෙම තොරතුරු ලද සංවිධාන විසින් ඒවා දැනගත යුතු තැනැත්තන්ට හැර වෙනත් යම් තැනැත්තකුට හෙළිදරව් නොකළ යුතු ය.

(6) අහිතකර විශ්ලේශන තීරණ, ආදර්ශීය තීරණ සහ අනෙකුත් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම් පිළිබඳ තොතුරු 82 වන රීතියට අනුකූලව ප්‍රසිද්ධියේ හෙළිදරව් කරනු ලබන තෙක් එකී තොරතුරුවල රහස්‍යභාවයක් පවතින බව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සහතික කළ යුතු අතර ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ එහි ඕනෑම සේවකයකු, කොන්ත්‍රාත්කරුවකු, එවැනි රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීම සඳහා මෙන්ම එකී රහස්‍ය තොරතුරු අවධිමත් ලෙස හෝ අවසරයක් නොමැතිව හෙළිදරව් කිරීම පිළිබඳව විමර්ශනය කිරීම හා විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන විධිවිධාන ඇතුළත් කළ යුතු ය.

**උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම පිළිබඳ තීරණ දැනුම්දීම සහ ලිපිගොනු ඉල්ලා සිටීම.**

81. (1) 32 වන සහ 36 සිට 39 දක්වා වන රීති, 46 වන, 47 වන, 48 සිට 52 දක්වා සහ 64 වන රීතිවලට අනුව ගන්නා ලද යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධ තීරණයක්, අදාළ වන්නේ නම් පමණක්, දිය හැකි උපරිම දඬුවම් නොපැනවීමට හේතු සාධාරණීකරණය කිරීමද ඇතුළුව, එම තීරණයට පාදක වූ සියලු හේතු ඇතුළත් කළ යුතු ය. තීරණය ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ප්‍රංශ භාෂාවෙන් නොකරන ලද අවස්ථාවක දී, එම තීරණය හා ඊට අදාළ හේතු පිළිබඳ කෙටි ඉංග්‍රීසි හෝ ප්‍රංශ භාෂාමය සාරාංශයක් යම් ජාතික උත්තේජක මර්දන සංවිධානයක් විසින් සැපයිය යුතු ය.

(2) 81 (1) වන රීතියට අනුව ලැබී ඇති තීරණයක් සම්බන්ධයෙන් අභියාචනා කිරීමට අයිතියක් ඇති තහනම් උත්තේජක මර්දන සංවිධානයක් විසින් එම තීරණය ලැබී දින පහළොවක් ඇතුළත එම තීරණයට අදාළ සම්පූර්ණ ගොනුවේ පිටපතක් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

**ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම.**

82. (1) උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තහවුරු කරනු ලැබූ යම් ක්‍රීඩකයකුගේ හෝ අනෙක් තැනැත්තකුගේ අනන්‍යතාවය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රසිද්ධියේ හෙළිදරව් කරනු ලැබිය හැකි වනුයේ, 80 (2) වන රීතියට අනුව ලෝක උත්තේජ මර්දන නියෝජ්‍යායතනයට සහ ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තාගේ ජාත්‍යන්තර සම්මේලනයට දැනුම්දීමට සමගාමීව සහ 23 (1) සිට (4) දක්වා වන, 23 (5) සිට (9) දක්වා වන; 24 වන, 25 වන හෝ 26 වන රීතිවලට අනුකූලව ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට දැනුම් දීමක් කිරීමෙන් පසුව පමණි.

(2) 69(6) වන රීතිය හෝ 70 වන රීතිය යටතේ අවසාන අභියාචනා තීරණයක් නිශ්චය කර තැබීමෙන් පසුව දින විස්සකට නොඅඩු කාලයක් තුළ දී, හෝ එම අභියාචනය අත්හැර දමා ඇතිනම්, හෝ 34 සිට 38 දක්වා වන රීතිවලට අනුකූලව නඩුව විභාග කිරීම

අත්හැර දමා ඇතිනම්, හෝ උත්තේජක මර්දන රීති උල්ලංඝනය තහවුරු කිරීම කල්වේලා ඇතිව අභියෝගයට ලක් නොකරනු ලැබුවේ නම්, එම ක්‍රීඩාව, උල්ලංඝනය කරන ලද උත්තේජක මර්දන රීතිය, එම උත්තේජක මර්දන රීතිය උල්ලංඝනය කළ ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තාගේ නම, ඊට සම්බන්ධ තහනම් ද්‍රව්‍ය තහනම් ක්‍රමවේදයක් ඇත්නම් එය සහ පනවන ලද දඬුවම් ඇතුළුව එම කාරණය පිළිබඳ විසඳුම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රසිද්ධියේ වාර්තා කළ යුතු ය. ඉහත විස්තර කරන ලද තොරතුරු ඇතුළත් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම් පිළිබඳව අවසාන අභියාචන තීන්දු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් දින විස්සක් ඇතුළත ප්‍රසිද්ධියේ වාර්තා කළ යුතු ය.

(3) කෙසේ වුවද නඩු විභාග කිරීමකින් හෝ අභියාචනාවක් විභාග කිරීමකින් පසුව එම ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් උත්තේජක මර්දන රීති උල්ලංඝනය වීමක් සිදුකොට නොමැති බවට නිශ්චය කෙරෙන අවස්ථාවක දී, එම තීරණයට භාජනය වූ ක්‍රීඩකයාගේ හෝ අනෙක් තැනැත්තාගේ කැමැත්ත ඇතිව පමණක් එම තීරණය ප්‍රසිද්ධියේ හෙළිදරව් කරනු ලැබිය හැකි ය. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එලෙස කැමැත්ත ලබා ගැනීම සඳහා සැලකිය යුතු ප්‍රයත්නයක් දැරිය යුතු ය. එසේ කැමැත්ත ලැබුණේ නම්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එකී ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් අනුමත කරන අයුරින් එකී තීරණය සම්පූර්ණයෙන්ම හෝ සංස්කරණය කරන ලද ආකාරයකින් ප්‍රසිද්ධියේ හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

(4) අවම වශයෙන් නියම කරන ලද තොරතුරු ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ වෙබ් අඩවියට ඇතුළත් කිරීම මඟින් හෝ වෙනත් යම් ආකාරයකින් ප්‍රසිද්ධියට පත් කිරීමෙන් සහ මසකට වැඩි කාලයක් හෝ අයෝග්‍යතා කාල සීමාව තුළ එම තොරතුරු තබා ගැනීම මඟින් ප්‍රසිද්ධියට පත් කිරීම සිදු කළ යුතු ය.

(5) විභාග වෙමින් පවතින් යම් නඩුවක් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හෝ ක්‍රීඩා සංවිධාන හෝ එම ආයතන දෙකේ කිසිදු නිලධරයකු විසින්, උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් සිදු කොට ඇති බවට තහවුරු වී ඇති ක්‍රීඩකයාට හෝ අනෙක් තැනැත්තාට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට පොදු මහජනතාව විසින් කරනු ලබන විවේචනවලට ප්‍රතිචාරාත්මක වශයෙන් හැර, එම නඩුවට අදාළ විශේෂිත සිද්ධීන් පිළිබඳ ප්‍රසිද්ධියේ විවේචනය කිරීමක් සිදුනොකළ යුතු ය.

(6) උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් සිදු කළ බවට තහවුරු වූ ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා බාල වයස්කාරයකු වන අවස්ථාවක දී, 82 වන රීතියේ නියම කරනු ලබන අනිවාර්ය මහජන වාර්තාකරණය අවශ්‍ය නොවන්නේ ය. බාල වයස්කාරයකු සම්බන්ධ වී ඇති නඩුවක් සම්බන්ධයෙන් ගත් කළ ඒවායෙහි වෛකල්පිත මහජන වාර්තාකරණය එම නඩුවේ පරිසිද්ධීන් සහ පරිවේෂණවලට සාමානුපාතික විය යුතු ය.

(7) ශ්‍රී ලංකා උත්තේජක මර්ධන නියෝජ්‍යායතනය විසින් යටත් පිරිසෙයින් වාර්ෂිකව හෝ තම උත්තේජක පාලන කටයුතු පිළිබඳ සාමාන්‍ය සංඛ්‍යා ලේඛන වාර්තාවක් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ද පිටපතක් සහිතව ප්‍රකාශයට පත් කළ යුතු ය. තව ද පරීක්ෂාවට ලක් කරන ලද එක් එක් ක්‍රීඩකයාගේ නම සහ පරීක්ෂාව සිදු කළ දිනය ද දැක්වෙන වාර්තා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ප්‍රකාශයට පත් කළ යුතු ය.

**උත්තේජක පාලන තොරතුරු නිශ්කාෂණාගාරය**

83. සමායෝජිත පරීක්ෂණ විභාජන ක්‍රම සම්පාදනය සඳහා පහසුකම් සැලසීම මෙන්ම විවිධ උත්තේජක මර්දන සංවිධානවලින් පරීක්ෂණ පැවැත්වීමේ දී සිදුවන අනවශ්‍ය ද්විත්වකරණය වැළැක්වීම සඳහා, අදාළ ක්‍රීඩකයින් පිළිබඳව සිදු කෙරෙන සියලු තරඟය තුළ හා තරඟයෙන් පිටත පරීක්ෂාවන් පිළිබඳ තොරතුරු එකී පරීක්ෂණ පවත්වා අවසන් වූ පසුව හැකි ඉක්මණින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් උත්තේජක මර්දන පරිපාලන හා කළමනාකරණ පද්ධතිය හරහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතන නිශ්කාෂණාගාරය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය. යෝග්‍ය අවස්ථාවන්හිදී සහ අදාළ වන්නා වූ රීතිවලට අනුකූලව මෙම තොරතුරු ක්‍රීඩකයාට, ක්‍රීඩකයාගේ ජාත්‍යන්තර සම්මේලනයට සහ ක්‍රීඩකයා පිළිබඳව පරීක්ෂණ සිදු කිරීමට බලය ඇති වෙනත් යම් උත්තේජක මර්දන සංවිධානවලට ලබා ගත හැකිවන පරිදි සැලැස්විය යුතු ය.

**දත්තවල රහසිගත බව**

84. (1) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අවශ්‍ය වන සහ යෝග්‍ය අවස්ථාවන්හිදී ක්‍රීඩකයන් සහ අනෙක් තැනැත්තන් සම්බන්ධ පෞද්ගලික තොරතුරු රැස් කිරීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ හෙළිදරව් කිරීම විශේෂයෙන්ම ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහය, රහස්‍යභාවය සහ පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතිය ඇතුළුව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට යටත්ව සිදුකරනු ලැබිය හැකි ය.

(2) මෙම උත්තේජක මර්දන රීතිවලට අනුකූලව යම් තැනැත්තකු වෙත තම පෞද්ගලික දත්ත ඇතුළුව තොරතුරු ඉදිරිපත් කරනු ලබන යම් සහභාගිකරුවකු, අදාළ දත්ත ආරක්ෂා කිරීමේ රීතිවලට අනුකූලව සහ අන්‍යාකාරයකින්, එකී තොතුරු ලද තැනැත්තා

විසින්, රහස්‍යභාවය සහ පෞද්ගලික තොතුරු ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සහ අන්‍යාකාරයකින් මෙම උත්තේජක මර්දන රීති ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා එම තොරතුරු රැස් කිරීම සකස් කිරීම, හෙළිදරව් කිරීම සහ භාවිතා කිරීම සිදු කරනු ලැබීමට එකඟවන්නේ යැයි සලකනු ලැබිය යුතු ය.

**තීරණ අදාළ කරගැනීම සහ පිළිගැනීම.**

85. (1) 69 සිට 79 දක්වා රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි අභියාචනා කිරීමට ඇති අයිතියට යටත්ව, යම් අත්සන්කරුවකු සම්බන්ධයෙන් වන, ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයට අනුකූල වන සහ එකී අත්සන්කරුගේ බලාධිකාරය තුළ වන, පරීක්ෂාවක, නඩු විභාගයක ප්‍රතිඵල හෝ වෙනත් යම් අවසාන තීරණයක් ලොව පුරා අදාළත්වයට පත්විය යුතු අතර ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සහ සියලු ක්‍රීඩා සංවිධාන විසින් පිළිගැනීමට සහ ගෞරවයට පාත්‍ර විය යුතු ය.

(2) ලෝක උත්තේජක නීති සංග්‍රහය නොපිළිගත් ආයතනවල රීති අන්‍යාකාරයකින් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ රීති සංග්‍රහය සමග අනුකූල නොවේ නම්, එකී ආයතනවලින් ගන්නා ලද පියවර ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සහ සියලු ක්‍රීඩා සංවිධාන විසින් පිළිගනු ලැබිය යුතු ය.

(3) 69 සිට 79 දක්වා වන රීතිවල විධිවිධාන සලස්වා ඇති අභියාචනා කිරීමේ අයිතියට යටත්වන පරිදි මෙම උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ යම් තීරණයක් සියලු ක්‍රීඩා සංවිධාන විසින් පිළිගනු ලැබිය යුතු අතර එවැනි තීරණයක් බලාත්මක කිරීම සඳහා අවශ්‍යවන සියලු ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගනු ලැබිය යුතු ය.

**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ තහනම් උත්තේජක රීති අන්තර්ගත කිරීම සහ ක්‍රීඩා සංවිධානවල බැඳියාවන්.**

86. (1) සියලු ක්‍රීඩා සංවිධාන සහ ඒවායෙහි සාමාජිකයින් මෙම උත්තේජක මර්දන රීතිවලට අනුකූල විය යුතු ය. ක්‍රීඩා සංවිධානයේ අධිකරණ බලය යටතේ වන ක්‍රීඩකයන් සහ අනෙක් තැනැත්තන්ට එරෙහිව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින්ම ඍජුවම මෙකී උත්තේජක මර්දන රීති බලාත්මක කිරීමට හැකි වන පරිදි එම උත්තේජක මර්දන රීති එක් එක් ක්‍රීඩා සංවිධානයේ රීතිවලට ඍජුවම හෝ සඳහන් කිරීම මගින් අන්තර්ගත කරනු ලැබිය යුතු ය.

(2) ක්‍රීඩා සංවිධානයක් හෝ එහි සාමාජිකත්වය දරන සංවිධානයක් විසින් බලය ලබා දී ඇති හෝ සංවිධානය කරන ලද තරඟයක හෝ ක්‍රියාකාරකමක සහභාගි වන සියලු ක්‍රීඩකයන් සහ පුහුණුකරුවකු, කළමණාකරුවකු, කණ්ඩායමේ නිලධාරි මණ්ඩලයක්, නිලධරයකු, වෛද්‍ය හෝ අතුරු වෛද්‍ය නිලධරයන් වශයෙන් සහභාගී වන එක් එක් ක්‍රීඩක සහායක පිරිස් මෙම උත්තේජක මර්දන රීතිවලට බැඳී සිටිය යුතු බවට එකඟ වීමට සහ එවැනි සහභාගිවීමක කොන්දේසියක් ලෙස ප්‍රතිඵල, කළමනාකරණ අධිකාරය වෙත ඉදිරිපත් කිරීමට නියම කරමින් සෑම සංවිධානයක් විසින්ම රීති පිහිටුවනු ලැබිය යුතු ය.

(3) සියලු ක්‍රීඩා සංවිධාන විසින් යම් උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීමක් අඟවන ඉඟියක් හෝ ඊට සම්බන්ධ ඕනෑම තොරතුරක් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත සහ ඔවුන්ගේ ජාත්‍යන්තර සම්මේලනය වෙත වාර්තා කළ යුතු අතර ඒ පිළිබඳව විමර්ශන පැවැත්වීමට බලය ඇති යම් උත්තේජක මර්දන සංවිධානයක් විසින් පවත්වනු ලබන විමර්ශනවලට සහයෝගය දිය යුතු ය.

(4) වලංගු සාධාරණීකරණයක් නොමැතිව තහනම් ද්‍රව්‍ය හෝ තහනම් ක්‍රම භාවිතා කරන ක්‍රීඩක සහයක පිරිස් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ හෝ ක්‍රීඩා සංවිධානයේ අධිකරණ බලය යටතේ ක්‍රීඩකයන්ට සහාය සැලසීමෙන් වළකාලීම සඳහා සියලු ක්‍රීඩා සංවිධාන විසින් විනය රීති පවත්වා ගත යුතු ය.

(5) සියලු ක්‍රීඩා සංවිධාන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සමඟ සම්බන්ධතාවයෙන් යුතුව සහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීම් මෙහෙයවීමට නියම කරනු ලැබිය යුතු ය.

**සීමාකාරක පිළිබඳ ව්‍යවස්ථාව.**

87. 22 සිට 33 දක්වා රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි ක්‍රීඩකයකු හෝ අනෙක් තැනැත්තාට උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම පිළිබඳව, උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සිදු වී ඇති බවට තහවුරු වූ දින සිට වසර දහයක් ඇතුළත දැනුම්දීමක් සිදු කර ඇති හෝ සාධාරණ අයුරින් දැනුම් දීමක් කිරීමට උත්සහ දැරීමක් සිදුකර ඇත්නම් මිස ඔහුට/ඇයට එරෙහිව උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම පිළිබඳ නඩු විභාගයක් ආරම්භ කළ නොහැක.

**ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අනුකූලතා වාර්තා ඉදිරිපත් කිරීම.**

88. ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහයේ 23.5.2 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් එකී නීති සංග්‍රහයට වූ අනුකූලතාව වාර්තා කරනු ලැබේ.

**අධ්‍යාපනය.**

89. යටත් පිරිසෙයින් 18.2 වගන්තියෙහි සඳහන් කොට ඇති කරුණු පිළිබඳව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් උත්තේජක ද්‍රව්‍යවලින් තොර ක්‍රීඩා වෙනුවෙන් අධ්‍යාපනික හා නිවාරක වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ඇගයීම මෙන්ම තොරතුරු අධීක්ෂණය කිරීම කළ යුතු අතර එකී වැඩසටහන්වලට ක්‍රීඩකයින් හා සහායක පිරිස්වල සක්‍රීය සහභාගිත්වය ලබා දිය යුතු ය.

**උත්තේජක මර්දන රීති සංශෝධනය කිරීම සහ අර්ථ නිරූපණය කිරීම.**

90. (1) මෙම උත්තේජක මර්දන රීති ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් වරින් වර සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(2) මෙම උත්තේජක මර්දන රීති ස්වාධීන සහ ස්වායක්ත පාඨ වශයෙන් මිස පවත්නා නීති හෝ ව්‍යවස්ථාවන් ආශ්‍රය කරගනිමින් අර්ථ නිරූපනය නොකළ යුතු ය.

(3) ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් මෙම උත්තේජක මර්දන රීතිවල අවශ්‍ය කොටසක් ලෙස සලකනු ලැබිය යුතු අතර යම් ගැටළුකාරී අවස්ථාවක දී බලපැවැත්විය යුතු ය.

**ක්‍රීඩකයන් හා අනෙකුත් තැනැත්තන්ගේ අතිරේක කාර්යයභාරය හා වගකීම්.**

91. (අ) මෙම උත්තේජක මර්දන රීති පිළිබඳව දැනුවත්වීම හා ඒවාට අනුකූලව කටයුතු කිරීම ;

(ආ) සෑම අවස්ථාවකදීම නියැදි රැස් කිරීම සඳහා ඉදිරිපත් වීම ;

(ඇ) උත්තේජක මර්දන සන්දර්භය තුළ, ඔවුන් ආමාශගත කරනු ලබන සහ භාවිතා කරනු ලබන දෑ පිළිබඳව වගකීම දැරීම ;

(ඈ) තහනම් ද්‍රව්‍ය හෝ ක්‍රම භාවිතා නොකළ යුතු බවට වන බැඳියාව පිළිබඳව වෛද්‍ය නිලධරයන්ට දැනුම්දීම සහ ලබා දෙන ඕනෑම වෛද්‍ය ප්‍රතිකාරයක් තුළින් මෙම උත්තේජක මර්දන රීති උල්ලංඝනය නොවන බවට සහතික වීමේ වගකීම දැරීම ;

(ඉ) පෙර වසර දහය ඇතුළත ක්‍රීඩකයා/ක්‍රීඩිකාව උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කළ බවට අත්සන්කරුවකු නොවන තැනැත්තකුගේ යම් තීරණයක් ඔවුන්ගේ ජාත්‍යන්තර සම්මේලනයට සහ ශ්‍රී ලංකා උත්තේජන මර්දන නියෝජ්‍යායතනයට හෙළිදරව් කිරීම ;

(ඊ) යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් පිළිබඳව විමර්ශනය සිදු කරනු ලබන යම් උත්තේජක මර්දන සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම,

සෑම ක්‍රීඩකයකුගේම වගකීම වන්නේ ය.

92. (අ) මෙම තහනම් උත්තේජක රීති පිළිබඳව දැනුවත්වීම හා ඒවාට අනුකූලව වීම ;

(ආ) ක්‍රීඩකයන් පරීක්ෂා කිරීමේ වැඩසටහන්වලට සහයෝගය ලබාදීම ;

(ඇ) තහනම් උත්තේජක ආකල්ප පෝෂණය කිරීම සඳහා ක්‍රීඩක වටිනාකම් සහ චර්යාවන් සම්බන්ධයෙන් ඔහුගේ/ ඇයගේ බලපෑම ක්‍රියාවේ යෙදවීම;

(ඈ) පෙර වසර දහය ඇතුළත ක්‍රීඩිකාව තහනම් උත්තේජක රීතියක් උල්ලංඝනය කළ බවට වූ අත්සන්කරුවකු නොවන තැනැත්තකුගේ කිසියම් තීරණයක් ඔහුගේ/ඇයගේ ජාත්‍යන්තර සම්මේලනයට සහ අදාළ ජාතික තහනම් උත්තේජක සංවිධානයට හෙළිදරව් කිරීම ;

(ඉ) තහනම් උත්තේජක රීති උල්ලංඝනය කිරීම් පිළිබඳව විමර්ශන සිදු කරන තහනම් උත්තේජක සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඊ) වලංගු සාධාරණීකරණය කිරීමකින් තොරව යම් තහනම් ද්‍රව්‍යයක් හෝ ක්‍රමයක් භාවිතා කිරීමෙන් හෝ තම සන්තකයේ තබා ගැනීමෙන් වැළකීම ;

සෑම ක්‍රීඩක සහයක තැනැත්තකුගේම වගකීම වන්නේ ය.

93. මෙම උත්තේජක මර්දන රීති 2015 ජනවාරි මස 01 වැනි දින සිට සම්පූර්ණ සබලතාවට පත්ව ක්‍රියාත්මක වනු ඇත. ("ක්‍රියාත්මක දිනය") ක්‍රියාත්මක දිනයට පෙරාතුව සිදුවූ කරුණු සම්බන්ධයෙන් මෙම රීති අතීත සබලතාව සහිතව අදාළ නොවිය යුතු ය. එසේ වී නමුත් -

(අ) 41 සිට 65 වන රීතිය යටතේ ක්‍රියාත්මක දිනයට සිදුවන උල්ලංඝනය කිරීම් සඳහා යම් දඬුවමක් තීරණය කිරීමේ කාර්යය සඳහා ක්‍රියාත්මක දිනයට පෙරාතුව සිදුවන යම් උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් "පළමු උල්ලංඝනය කිරීම්" හෝ "දෙවන උල්ලංඝනය කිරීම්" ලෙසට සැලකේ.

(ආ) 54 වන රීතිය යටතේ බහුවිධ උල්ලංඝනය කිරීම් කාර්යයන් සඳහා පූර්ව උල්ලංඝනය කිරීම් සළකනු ලැබිය හැක්කේ යම් අතීත සබඳතාව සහිත කාලවකවානුවේ දී ද එම කාලවකවානුව සහ කාර්ය පටිපාටිමය රීති වන 87 වන රීතියේ දක්වා ඇති සීමා කිරීමේ ව්‍යවස්ථා අතීත සබඳතාවයක් සහිතව අදාළ කරගත යුතු ය ;

එසේ වුවද, ක්‍රියාත්මක දිනය වනවිට සීමා කිරීමේ ව්‍යවස්ථාපිත ඉකුත් වී නොමැති නම්, 87 වන රීතිය අතීත සබඳතාවක් සහිතව පමණක් අදාළ විය යුතු ය. එසේ නැතහොත්, ක්‍රියාත්මක වන දිනය වන විට විසඳීමට ඇති උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම පිළිබඳ නඩුවක් සහ ක්‍රියාත්මක දිනයට පෙරාතුව සිදුවූ උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීමක් මත පදනම් වූ ක්‍රියාත්මක දිනයට පසුව ඉදිරිපත් කෙරෙන එවැනි යම් නඩුවක් සම්බන්ධයෙන් වන විට, නඩුව විභාග කරනු ලබන මණ්ඩලය විසින් එම නඩුවේ අවස්ථානුගත කරුණු යටතේ "lex mitior" මූලධර්මය නිසි ලෙස අදාළවන බව තීරණය කරන්නේ නම් මිස, චෝදිත උත්තේජක මර්දන රීති උල්ලංඝනය කිරීම සිදු වූ අවස්ථාවේ ක්‍රියාත්මකව පැවති වැදගත් උත්තේජක මර්දන රීති යටතේ එම නඩුව විභාග කරනු ලැබිය යුතු ය.

94. (1) ක්‍රියාත්මක දිනයට පෙරාතුව උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීම සම්බන්ධයන් අවසන් තීන්දුවක් ප්‍රදානය කරනු ලැබ ඇති අවස්ථාවක එහෙත් ක්‍රියාත්මක දිනය වන විට ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා තවමත් අයෝග්‍යතා කාල සීමාවක පසුවන්නේ නම්, ක්‍රීඩකයා හෝ අනෙක් තැනැත්තා විසින් මෙම උත්තේජක මර්දන රීති අනුව එකී අයෝග්‍යතා කාල සීමාව අඩු කරන ලෙස ඉල්ලා ප්‍රතිඵල කළමනාකරණ වගකීම ඇති අදාළ උත්තේජක මර්දන සංවිධානයට අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) එකී අයදුම්පත අයෝග්‍යතා කාලසීමාව අවසන් වීමට පෙර ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. 69(5) සිට 74 දක්වා වන රීති අනුව ප්‍රදානය කරන ලද තීරණය අභියාචනය කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, උත්තේජක මර්දන රීතියක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අවසන් තීන්දුවක් ලබාදී ඇති අවස්ථාවක සහ අයෝග්‍යතා කාල සීමාව ඉකුත් වූ අවස්ථාවක කිසිඳු නඩුවක් සම්බන්ධයෙන් මෙම උත්තේජක මර්දන රීති අදාළ නොවේ.

(3) ක්‍රියාත්මක දිනයට පෙරාතුව බලපවත්වන ලද නීති පදනම් කරගෙන පළමු උල්ලංඝනය සඳහා දඬුවම් තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක දී, 53 වන රීතිය යටතේ දෙවැනි උල්ලංඝනයක් සම්බන්ධයෙන් අයෝග්‍යතා කාලසීමාව තක්සේරු කිරීමේ කාර්යය සඳහා මෙම උත්තේජක මර්දන රීති අදාළව තිබුනේ නම්, පළමු උල්ලංඝනය සඳහා තක්සේරු කරන්නට තිබූ අයෝග්‍යතා කාලය අදාළ කරගනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපනය :-

95. මේ රීතිවල කාර්යය සඳහා -

"උත්තේජක මර්දන පරිපාලන හා කළමනාකරණ පද්ධතිය (ADAMS)" යන්නෙන් උත්තේජක මර්දන විෂයෙහි පාර්ශවකරුවන්ට දත්ත සුරැකීමේ නීති රීති සමඟින් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට සම්බන්ධ මෙහෙයුම්වලදී දත්ත ඇතුළත් කිරීම, ගබඩා කිරීම, බෙදාගැනීම සහ වාර්තා කිරීම පිණිස වන වෙබ් අඩවියක් පදනම් කරගත් දත්ත සමුදාය කළමනාකරණ මෙවලමක් අදහස් වේ ;

"අහිතකර විශ්ලේෂණාත්මක තීරණය" යන්නේ රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ අදාළ තාක්ෂණික ලිපි ලේඛනවලට අනුකූලව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අනුමත කරන ලද වෙනත් රසායනාගාරයක්

මඟින්, නියැදියක් තුළ තහනම් ද්‍රව්‍යයක් හෝ අන්තර්ජන්‍ය ද්‍රව්‍ය ඉහළ පමාණයක් ඇතුළුව එහි සංඝටක හෝ එහි සලකුණු හෝ තහනම් ක්‍රමයක් භාවිතා කළ බවට සාක්ෂි සහිත වාර්තාවක් අදහස් වේ ;

"අහිතකර ජීව දත්ත පිළිබඳ තීරණ" යන්නෙන් අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් මඟින් විස්තර කර ඇති පරිදි අහිතකර ජීවදත්ත පිළිබඳ තීරණයක් ලෙස හඳුනාගනු ලැබූ වාර්තාවක් අදහස් වේ ;

"උත්තේජක මර්දන සංවිධානය" යන්නෙන්, උත්තේජක පාලන ක්‍රියාවලියට අදාළ ඕනෑම කොටසක් සම්බන්ධයෙන් වන රීති හඳුන්වාදීම, ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීම පිළිබඳව වගකීම දරන අත්සන්කරුවකු අදහස් වේ. ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව, ජාත්‍යන්තර පැරාලිම්පික් කමිටුව, ඔවුන්ගේ තරඟවලදී පරීක්ෂාවන් පවත්වන්නා වූ වෙනත් ප්‍රධාන තරඟ සංවිධායකයි, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ජාත්‍යන්තර සම්මේලන හා ජාත්‍යන්තර උත්තේජක මර්දන සංවිධාන මෙයට ඇතුළත් වේ ;

"ක්‍රීඩකයා" යන්නට 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය ;

"ක්‍රීඩකයාගේ ජීවදත්ත තොරතුරු පොත" යන්නෙන් පරීක්ෂාවන් හා විමර්ෂන සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීයේ සහ රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීයේ විස්තර කර ඇති පරිදි දත්ත රැස් කිරීමේ හා සැසඳීමේ වැඩසටහන් සහ ක්‍රමවේදයන් අදහස් වේ ;

"ක්‍රීඩක සහයක පිරිස්" යන්නෙන් ක්‍රීඩා තරඟයකට සහභාගි වන්නා වූ හෝ ක්‍රීඩා තරඟයකට සූදානම් වෙමින් සිටින්නා වූ ක්‍රීඩකයකු සමග කටයුතු කරන, ඔහුට සංග්‍රහ කරන හෝ උදව් කරන ඕනෑම පුහුණුකරුවකු, කළමනාකරුවකු, නියෝජිතයකු, කණ්ඩායමේ කාර්ය මණ්ඩලය, නිලධාරි, වෛද්‍ය, අතුරුවෛද්‍ය තැනැත්තකු, දෙමව්පියන් හෝ වෙනත් යම් අයෙක් අදහස් වේ ;

"ආදර්ශීය තීරණ" යන්නෙන් අහිතකර විශ්ලේෂණාත්මක තීරණයකට පෙරාතුව රසායනාගාර සඳහා වූ ජාත්‍යන්තර ප්‍රමිතීන් හෝ ඊට අදාළ තාක්ෂණික ලිපි ලේඛනවල නියම කර ඇති පරිදි වැඩිදුර විමර්ශනයක් අවශ්‍ය බවට දැක්වෙන ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් පිළිගත් හෝ ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් අනුමත කරන ලද රසායනාගාර වාර්තාවක් අදහස් වේ ;

"ආදර්ශීය ජීව දත්ත පිළිබඳ තීරණය" යන්නෙන් අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් මඟින් විස්තර කර ඇති පරිදි ආදර්ශීය ජීව දත්ත පිළිබඳ තීරණයක් ලෙස විස්තර කර ඇති වාර්තාවක් අදහස් වේ ;

"ලෝක උත්තේජක මර්දන නීති සංග්‍රහය" යන්නට 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව සම්මුති පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය ;

"තරඟය" යන්නට 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව සම්මුති පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය ;

"දූෂ්‍ය වූ නිෂ්පාදනය" යන්නෙන් නිෂ්පාදන ලේබලයේ හෝ සාධාරණ අන්තර්ජාල පරීක්ෂාවක ඇති තොරතුරුවලින් හෙළිදරව් නොකරන ලද තහනම් ද්‍රව්‍යයක් අඩංගු වාර්තාවක් (report) අදහස් වේ.

"ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය" යන්නට 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව සම්මුති පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය ;

"ඉසව්ව" යන්නෙන් ඔලිම්පික් ක්‍රීඩා, FINA ලෝක ශුරතා හෝ Pan American Games ඇතුළුව එක් පාලක ආයතනයක් යටතේ එකට පවත්වනු ලබන කේවල තරඟ මාලාවක් අදහස් වේ ;

"තරඟ බිම්" යන්නෙන් යම් තරඟයක් සඳහා පාලක ආයතනය විසින් නම් කරනු ලබන ස්ථාන අදහස් වේ ;

"තරඟ තුළ දී පරීක්ෂා කර බැලීම" (In - competition testing) යන්නෙන් 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය ;

"ජාත්‍යන්තර ඉසව්ව" යන්නෙන් ඔලිම්පික් කමිටුව, ජාත්‍යන්තර පැරා ඔලිම්පික් කමිටුව, ජාත්‍යන්තර සම්මේලනයක්, ප්‍රධාන ඉසව් සංවිධානයක් හෝ වෙනත් ජාත්‍යන්තර ක්‍රීඩා සංවිධානයක් සඳහා පාලක මණ්ඩලය වන හෝ ඉසව්ව සඳහා තාක්ෂණික නිලධරයන් පත් කරනු ලබන ඉසව්වක් හෝ තරඟයක් අදහස් වේ ;

"සංඝටක" යන්නෙන් ජීව පරිවර්තන ක්‍රියාවලිය තුළ නිෂ්පාදනය වන යම් ද්‍රව්‍යයක් අදහස් වේ ;

"ජාතික උත්තේජක මර්දන සංවිධානය" යන්නෙන් උත්තේජක මර්දන රීති ඇති කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම, නියැදි රැස් කිරීමට නියම කිරීම, පරීක්ෂණ ප්‍රතිඵල කළමනාකරණය සහ ජාතික මට්ටමින් නඩු විභාග පැවැත්වීම සඳහා මූලික අධිකාරි බලය හා වගකීම සහිතව එක් රාජ්‍යයක් විසින් නම් කරනු ලබන යම් ආස්ථිතියක් අදහස් වේ. මෙම නම්කරනු ලැබීම නිසි බලධාරී රාජ්‍ය අධිකාරියක් විසින් සිදු නොකරනු ලැබ ඇති විටදී, එම ආස්ථිත්වය රටේ ජාතික ඔලිම්පික් කමිටුව හෝ එහි නම් කරනු ලබන ආයතනය විය යුතු ය ;

"ජාතික තරඟය" යන්නෙන් ජාත්‍යන්තර තරඟයක් නොවන්නා වූ, ජාත්‍යන්තර හෝ ජාතික මට්ටමේ ක්‍රීඩකයින් සහභාගි වන්නා වූ ක්‍රීඩා ඉසව්වක් හෝ තරඟයක් අදහස් වේ ;

"ජාතික මට්ටමේ ක්‍රීඩකයා" යන්නෙන්,

(අ) අදාළ ක්‍රීඩා සංවිධානයකින් හෝ ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ යම් ක්‍රීඩාවකට සහභාගී වන ක්‍රීඩකයකු ;

(ආ) යම් ක්‍රීඩාවකින් ජාතික තරඟයක ඉහළම තලයේ තරඟ වදින ක්‍රීඩකයකු ;

(ඇ) ජාත්‍යන්තර සම්මේලනය විසින් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයකු වශයෙන් ජාතික මට්ටමේ හෝ ජාත්‍යන්තර ඉසව්වල තරඟ වදින ක්‍රීඩකයකු අදහස් වේ.

එසේ වුව ද, යම් ක්‍රීඩකයන් ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයකු වශයෙන් ඔහුගේ අදාළ ජාත්‍යන්තර සම්මේලනය විසින් වර්ග කර ඇති අවස්ථාවක දී, මෙම උත්තේජක මර්දන රීතිවල කාර්යය සඳහා එකී ක්‍රීඩකයා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයකු වශයෙන් මිස ජාතික මට්ටමේ ක්‍රීඩකයකු වශයෙන් නොසැලකිය යුතු ය ;

"තරඟයෙන් පිටත" යන්නෙන් තරඟය තුළ නොවන ඕනෑම කාල පරිච්ඡේදයක් අදහස් වේ ;

"තහනම් ලැයිස්තුව" යන්නෙන් ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් පලකර ඇති ආකාරයේ ද්‍රව්‍ය ලැයිස්තුවක් අදහස් වේ ;

"තහනම් ක්‍රමය" යන්නෙන් තහනම් ලැයිස්තුවේ විස්තර කරනු ලැබ ඇති පරිදි යම් ක්‍රමයක් අදහස් වේ ;

"තහනම් ද්‍රව්‍ය" යන්නෙන් තහනම් ලැයිස්තුවේ විස්තර කරනු ලැබ ඇති පරිදි යම් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය පන්තියක් අදහස් වේ ;

"නියැදිය" යන්නෙන් උත්තේජක පාලනය සඳහා රැස් කරනු ලබන යම් ජීව විද්‍යාත්මක ද්‍රව්‍යයක් අදහස් වේ ;

"ශ්‍රී ලංකා උත්තේජක මර්ධන නියෝජ්‍යායතනය (SLADA)" යන්නෙන් 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව සම්මුති පනත විසින් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අදහස් වේ ;

"පරීක්ෂා කිරීම" යන්නට 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව සම්මුති පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය ;

"චිකිත්සක භාවිතය නිදහස් කිරීම (TUE)" යන්නට 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව සම්මුති පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය ;

"භාවිත" යන්නට 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව සම්මුති පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය ;

"ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (WADA) යන්නට 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව සම්මුති පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය.

03 - 546

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.